**සීතාවක ප්‍රාදේශීය සභාවේ 2018 මැයි මස 11 වන දින**
**පෙ.ව.10.00 ට ප්‍රාදේශීය සභා සභා ශාලාවේදී පවත්වන ලද**
**මහා සභා රැස්වීමේ වාර්තාව.**

**සහභාගී වූ : -**

| | | | |
|---|---|---|---|
| 1. | ගරු සභාපති | - | ජී. ජයන්ත රෝහණ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | - | එස්.ඩී.මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | චන්දන ප්‍රේමනාත්මුදුන්කොටුව මැතිතුමා |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.විමල් ප්‍රසන්න මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.මේරි මාග්‍රට් මැතිතුමිය |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ආර්. ගයාන් දුමින්ද චන්ද්‍රසිරි මැතිතුමා |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ලියනගේ චන්දන කුමාර මැතිතුමා |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.පී. යසරු දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ.ඩී. එස්. ජයන්ත රණවක මැතිතුමා |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ. මංජුල ධම්මික වීරරත්න මැතිතුමා |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩී. පිලිෂියා ඇනට් ඔල්ගා මැතිතුමිය |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී. සනී හෙක්ටර් පීරිස් මැතිතුමා |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී. කෝකිල සම්පත්වර්ණසිරි මැතිතුමා |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.නන්ද කුමාරසිංහ මැතිතුමා |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ. උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පී.කේ. උපුල් ජිනේන්ද්‍රකුලතිලක මැතිතුමා |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ඩී. ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ. සුසන්ත මැතිතුමා |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඩී.සමන්ත කුමාර මැතිතුමා |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්. වරුණදිලිප් කුමාර මැතිතුමා |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.පී.උපුල් ප්‍රසන්න මැතිතුමා |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. චින්තක දේවින්ද සමරවීර මැතිතුමා |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.නිමල් යසසිරි කළුපහන මැතිතුමා |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්. අසෝක වැලිකල මැතිතුමා |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පුස්සැල්ලගේ අමල් නිශාන්ත සිල්වා මැතිතුමා |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.චන්ද්‍රකුමාර් මැතිතුමා |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කුමුදිණි ජයවර්ධන මැතිතුමිය |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ශෂිණි ශ්‍රීමාලි හෙට්ටිආරච්චිමැතිතුමිය |
| 36. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.ජී.ඩී.ඉන්ද්‍රානි සෙනෙහෙලතාපද්මසීලි මැතිතුමිය |
| 37. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය |
| 38. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ.ඩී.සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය |
| 39. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමා |
| 40. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්. චන්දන සූරියආරච්චි මැතිතුමා |
| 41. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එස්.සුනිල් රණසිංහ මැතිතුමා |
| 42. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය |
| 43. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පී.ඒ.ප්‍රදීප්කුමාර්මැතිතුමා |

**ගරු සභාපතිතුමා**

මහා සභා රැස්වීම සඳහා සහභාගී වීමට පැමිණි ගරු උප සභාපතිතුමා ප්‍රධාන මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ප්‍රධාන කාර්යමණ්ඩලය, මාධ්‍යවේදි මහත්වරුන් ඇතුළුව පැමිණ සිටි සියළුදෙනා පිළි ගැනිමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

න්‍යායපත්‍රානුකූලව පළමුවෙන්ම 2018.04.17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන හා වෙනස්කම් ඇතොත් පෙන්වා දී එය සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවෙන් ඉල්ලා සිටින ලදී.

## 01. පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කර ගැනීම.

**ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා.**

එක සංශෝධනයක් මම ඉදිරිපත් කරනවා. අපේ ප්‍රදීප් මන්ත්‍රීතුමා කරපු කතාවෙන් කොටසක් මග ඇරිලා තියෙනවා. එය අපි පසුව ඇතුල් කරලා තියෙනවා. මං හිතනවා එම සංශෝධනය ඔබ සියලුදෙනාටම ලැබිලා ඇති කියලා.

**සංශෝධන අංක 01**

2018.04.17 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 84 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ ප්‍රදීප් කුමාර් මැතිතුමාගේ කථාවේ ඉතිරිය පහත පරිදි පිටු අංක 84 A ලෙස ඇතුළත් විය යුතුයි.

කළේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගැන මම මුකුත් කියන්නේ නැහැ. ඔවුන් ඔවුන්ට පුළුවන් විදියට යමක් කරලා තියෙනවා. රට එක්සත් කරපු ජනාධිපති කෙනෙක් හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමා ගැන අපේ යම්කිසි ගෞරවයක් තියෙනවා. ඒකේ තර්කයක් නැහැ. අපි මේ සියලු කටයුතු ගැන රටක් විදියට ජාතියක් හැටියට දැනුවත්. මේ කොළ නිල් රතු බෙදීම් පැත්තකට දාලා ඉදිරියට ගියේ නැත්තම් අපේ රටට අනාගතයක් නැහැ. අපි ඒත් බැලුවා තරග කරන්නේ නැතිව මේ පණිවිඩය රටට දෙන්න පුළුවන්ද කියලා අපි මීට කලින් මැතිවරණයකදී 2013 කාලයේදී උත්සාහ කලා. මේක නිකම්ම මිනිස්සුන්ට කිව්වට හරියන්නේ නැහැ යම්කිසි මැතිවරණ කාලයේදී තමයි මේ මිනිස්සු මේ කියන දේවල් අහන්නේ කියලා. එතනදි අපි ස්වාධීන කණ්ඩායමක් විදියට ඉදිරිපත් වෙන්න තීරණය කලා. මම නම් ගම් කියන්නේ නැහැ. මෙතනත් ඉන්නවා මා සමග සාකච්ඡා කල යම් යම් පුද්ගලයෝ කිසිම වේලාවක අපි ද්වේශ සහගත විදියට මැතිවරණය කළේ නැහැ. අපේ වැලිකන්න මන්ත්‍රීතුමා කිව්වා ස්වාධීන කණ්ඩායම් කියන්නේ මෝඩයෝ කියලා. නමුත් අපිට අවශ්‍ය වෙලා තිබුනේ මෙන්න මේ පණිවිඩය ජනතාව වෙත ගෙනියන්න. ඒ කියන්නේ පක්ෂ අනුව බෙදෙන්න එපා. පාට අනුව බෙදෙන්න එපා. පළමුව රට එදා අපිත් එක්ක එක්සත් ජාතික පක්ෂයත් හිටියා. පොහොට්ටුවත් හිටියා. මම ස්තුති වන්ත වෙනවා ශ්‍රීලංකා නිදහස් පක්ෂ සංවිධායකතුමා ඒ වගේම අපේ එජාපයේ සංවිධායකතුමා ඒ වගේම රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමා අපි මේ සියලු දෙනා සමග කටයුතු කලා. අපිට යම් ගැටළුවක් ආවාහාම අපි සාකච්ඡා කලා පක්ෂ අනුව බෙදිලා පාට අනුව බෙදිලා මේ රට ගොඩ ගන්න බැහැ කියන එක. මේ රට ගොඩ ගන්න නම් අපි සියලු දෙනා එක්ව මම මෙතනදිත් ඔබ තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා ඡන්දේ ඉවරයි දැන් කොළ පාට ජයග්‍රහණය කරන්න, රතුපාට ජයග්‍රහණය කරන්න, නිල්පාට ජයග්‍රහණය කරන්නයන්න එපා අපි අවුරුදු හතරකින් ඒක කරමු. තව අවුරුදු හතරක් තියෙනවා ඒකට හරි දේ හරියට දකිමු. විශේෂයෙන්ම බලන්න ඕනේ කවුද හරි කියන කාරණාව නෙවෙයි. මොනවද හරි කියන දේ ඒක විපක්ෂයෙන් වෙන්නත් පුළුවන් ආණ්ඩු පක්ෂයෙන් වෙන්නත් පුළුවන්. පිටිපස්සෙන් ඉදගෙන පිහියෙන් අනින්න හදන්න එපා. අපි එහෙම කරන්නෙත් නැහැ. එහෙම කරන අයට ඉඩ දෙන්නෙත් නැහැ. මම කියන්නේ නැහැ සභාපතිතුමාට සභාය දක්වන්නේ නැහැ කියලා. මේ රට නැත්තම් අපිට සභාවකුත් නැහැ. ඕනෑම මන්ත්‍රීවරයෙක් මට කතා කරන්න මට විශේෂ වගකීමක් තියෙනවා මම කොට්ඨාශ 26 ම නියෝජනය කරනවා. විශේෂයෙන්ම මම මෙතනදි ලේකම්තුමාට පොරොන්දුවක් වෙනවා ඔබතුමා හා නිලධාරි මණ්ඩලය ආරක්ෂා කර ගැනීම සඳහා අපි කැප වෙනවා. මේ ප්‍රදීප් කුමාර ඉන්නවා කියන එක කියනවා.

ජනතාව වෙනුවෙන් සාධාරණයක් ඉටු කිරිමේදී ඔබලාට මුහුණ පෑදීමට එන ඕනෑම ගැටළුවකදී මම ඉන්නවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි,මගේ අදහස් දැක්වීමේදී පුංචි අඩුවක් වෙලා තියෙනවා මම අදහස් දැක්වුවේ 1994 වර්ෂයේ කියලා. මෙහි සඳහන්ව තියෙන්නේ 1987 වර්ෂය කියලා. පාර්ලිමේන්තු මැතිවරණය සඳහා එතකොට මම අවුරුදු 18 ක තරුණයෙක් කියන කොටසේ.

<u>**සංශෝධන අංක 02**</u>

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 41 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමාගේ කථාවේ සඳහන් අදහස් දැක්වීම පහත පරිදි සංශෝධනය විය යුතුයි.

1994 වසරේදි පාර්ලිමේන්තු මැතිවරණය සඳහා එතකොට මම වසර 18 ක තරුණයෙක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලි මැතිතුමිය.</u>

ගරු සභාපතිතුමනි,මගේ කතාවේ පුංචි අඩුපාඩු දෙකක් තුනක් තියෙනවා. පිටු අංකය 74 - පළාත් සභා පාර්ලිමේන්තු කියන කාරණය ඇතුල් වෙන්න ඕන.ඒවගේම ගෙදර ගිනි පිටට දෙන්න එපා කියලා දෙයක් මම කිව්වේ නෑ කියලයි මගේ හැඟීම. එතන සංශෝධනය විය යුතුයි. එතකොට අපේ ජයන්ත රණවක මැතිතුමා පළපුරුදු පළපුරුදු කියලා මෙතන සඳහන් වෙලා තියෙනවා. මම කිව්වේ පළපුරුදු දැක පුරුදු කළ පුරුදු කියන එක. ඒ වගේම අපේ මන්ත්‍රීවරු 5 දෙනාට රිදී බන්දේසියේ දාලා දුන්නා කියලා නෙමෙයි මම කිව්වෙ. අපිට ශෂිණි මන්ත්‍රීතුමිය කිව්වා වගේ රිදී බන්දේසියක දාලා නෙමෙයි මේක දුන්නේ කියන එකයි මම සඳහන් කළේ.

<u>**සංශෝධන අංක 03**</u>

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 74 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලී මැතිතුමියගේ කථාවේ සඳහන් අදහස් දැක්වීම් පහත පරිදි සංශෝධනය විය යුතුයි.

ඒ සේවය හරහා මම දිගින් දිගටම මේ සමාජ සේවය කරගෙන යනකොට ගරු සරත් ෆොන්සේකා අමාත්‍යතුමත් එක්ක එතුමාගේ පක්ෂයෙනුත් පළාත් සභා හා පාර්ලිමේන්තු ඉල්ලලා නැවතත් මට ප්‍රාදේශීය සභා ඉල්ලන්නට ගරු ලෙනාඩ් කරුණාරත්න මැතිතුමන් මට අවස්ථාව සලසා දුන්නා.

ඒක නිසා අර කියනවානේ අපේ සීයලා පිට ගිනි ගන්න එපා ගෙදර ගිනි පිටට දෙන්න එපා. කියන කාරණය ඉවත් විය යුතුයි.

අපිට ඉන්නවා හොඳ කණ්ඩායම් නායකයෙක් ජයන්ත රණවක මැතිතුමා පල පුරුදු, දැක පුරුදු, කළ පුරුදු හොඳ නායකයයෙක් ඉන්නවා ඒ නිසා ඔබතුමා හොඳ දෙයක් කරනවානම් අතින් අදිනවා කකුලෙන් අදින්නෙ නෑ. හැබැයි නරක දෙයක් කරනවානම් ඔබතුමාට අපි නැහැ.

ශෂිණි මන්ත්‍රීතුමිය කිව්වා වගේ රිදී බන්දේසියක දාලා ප්‍රාදේශීය සභා මන්ත්‍රීකම ලැබුනේනැහැ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් යසසිරි කළුපහන මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, 57 පිටුවේ මගේ අදහස් දැක්විමේදී සඳහන්ව ඇති පරිදි චම්පික ඇමතිතුමා නෙමෙයි ගාමිණී පෙරේරා මැතිතුමා ලෙස සංශෝධනය විය යුතුයි.

<u>**සංශෝධන අංක 04**</u>

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 57 හි සදහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් යසසිරි කළුපහන මැතිතුමාගේ කථාවේ සදහන් අදහස් දැක්වීම පහත පරිදි සංශෝධනය විය යුතුයි.

මොකද ජනතාව ඇවිල්ලා මට කිව්වා අනිවාර්යයෙන්ම ඔයා මේ පාර ප්‍රාදේශීය සභාවට ඉල්ලන්න ඕනෙ. ඔබතුමාව තමයි පත්කරන්නෙ කිසිම කෙනෙක් ඉල්ලන්නේ නෑ ගාමිණී පෙරේරා මැතිතුමා මට ඇවිල්ලා කිව්වා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය.</u>

ගරු සභාපතිතුමනි, 48 වෙනි පිටුවේ මගේ අතින්ම වැරදුනා ද කියන්න බැහැ. නිරිපොල දකුණ කියලා තමයි සටහන් වෙලා තියෙන්නේ. එය ඉහළ හංවැල්ල දකුණ කියලා සංශෝධනය විය යුතුයි.

<u>සංශෝධන අංක 05</u>

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 48 හි සදහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමනි ස්වර්ණලතා මැතිතුමියගේ කථාවේ සදහන් අදහස් දැක්වීම පහත පරිදි සංශෝධනය විය යුතුයි.

ඒ හැකි වුනේ දිද්දෙණිය උතුර, දකුණ, නිරිපොල, ඉහළ හංවැල්ල දකුණ එම ග්‍රාම සේවා වසම් 04 ම ජන්ද කොට්ඨාශවල ඡන්ද දායකයන්ගේ උපරිම කැපවීම මත ඒ මොකද මට විවිධ බාධක ආවා ඔබතුමා දන්නවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය.</u>

ගරු සභාපතිතුමනි, පිටු අංක 50 මගේ කතාවේ තැන් දෙකක් තියෙනවා. ඉතිහාසයකට හිමිකම් කියන වර්තමාන පුරුකක් කියලා එතන පරපුරක කියලා එකතුවෙන්න ඕනෙ. ඊට පස්සේ යට ඉදලා තුන්වෙනි පේලියේ ඔබතුමා සමඟ හත්දෙනා සහ උපසභාපතිතුමා සමඟ වන 11 දෙනා සමඟ කියලා සංශෝධනය වෙන්න ඕනෙ.

<u>සංශෝධන අංක 06</u>

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 50 හි සදහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමියගේ කථාවේ සදහන් අදහස් දැක්වීම පහත පරිදි සංශෝධනය විය යුතුයි.

රටේ දේශපාලනයට සමග මම මේ ප්‍රදේශයේ ගෞරවණිය දේශපාලන ඉතිහාසයකට හිමිකම් කියන පරපුරක වර්තමාන පුරුකක්.

ඔබතුමා සමග වන 7 දෙනා සහ උප සභාපතිතුමා සමග වන 11 දෙනා සමග ඇත්තටම ගරු මන්ත්‍රීතුමනි මම දෙයක් කියන්නම් මෙම ගරු සභාව තුලදී ඉන්නේ පක්ෂ දෙකක් එනම් ආණ්ඩු පක්ෂය හා විපක්ෂයයි ආණ්ඩු පක්ෂය තුල පිල් දෙකක් නැහැ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඋපුල් ප්‍රසන්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි,මගේ 54 පිටු අංකය. දේශපාලනය පටන් ගන්නකොට 1987 කියලා දාලා තියෙන්නෙ. 1997 කියලා නිවැරදි වෙන්න ඕනෙ.

<u>සංශෝධන අංක 07</u>

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 54 හි සදහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ප්‍රසන්න මැතිතුමාගේ කථාවේ සදහන් අදහස් දැක්වීම පහත පරිදි සංශෝධනය විය යුතුයි.

1997 මට අවුරුදු 17 දි තමයි මම දේශපාලනය පටන් ගත්තේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, 52 පිටුව 3 දෙනෙක් කියලා දාලා තියෙන්නෙ 23 දෙනෙක් කියලා සඳහන් විය යුතුයි. 17 පේළියේ. ඊළඟට 18 වන පේළියේ වන්නිලා ඇත්තෝ කියලා තියෙනවා මම එහෙම දෙයක් සඳහන් කළේ නෑ. මම ප්‍රකාශ කළේ වන්දිභට්ටයන් කියලා. ඒ විදියට සංශෝධනය වෙන්න ඕනෙ. ඊළඟට 19 වන පේළියේ අපි තුන්දෙනෙක් ඉන්නවා ඔබතුමා සමඟ කියන එක අපි 23 දෙනෙක් ඉන්නවා කියලා සංශෝධනය විය යුතුයි. 53 පිටුවේ මේ ජයග්‍රහණ සඳහා පොල් පිත්තක් දැම්මත් ජයග්‍රහණය කරන්න පුළුවන් කියන වචනය ඇතුළත් වෙන්න ඕනෙ. ජයග්‍රහණය කියන තැනට එන්න ඕනෙ. ඊළඟ පේළියේ තියෙනවා මෙය සම්පූර්ණයෙන් විකෘති වෙලා තියෙනවා. වටින්නේ නැති අය කියලා කියන තැන නිසාවෙන්න ඕනෙ. නැති අය කියලා තියෙන්නෙ එතන නැති අය නිසා කියලා සංශෝධනය විය යුතුයි.

**<u>සංශෝධන අංක 08</u>**

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 52 හා 53 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමාගේ කථාවේ සඳහන් අදහස් දැක්වීම් පහත පරිදි සංශෝධනය විය යුතුයි.

> නමුත් සභාපතිතුමා ඔබතුමාට කියනවා ඔබතුමා ඉන්නෙ හත්දෙනෙක්ගෙන් සමන්විත කණ්ඩායමක් හත්දෙනෙක් නෙමෙයි ඔබතුමා දැනගන්න ඕනෙ අපි විසි තුන්දෙනෙක් ඉන්නවා.
>
> නමුත් අපි ඔබතුමාගෙන් ඉල්ලා හිටිනවා ඒ වන්දිභට්ටයන්ගෙන් ප්‍රවේසම් වෙන්න කියලා.
>
> අපි විසි තුන්දෙනෙක් ඔබතුමා සමඟ ඉන්නවා ඒ නිසා ඒකෙ පංති මට්ටමක් අපිට අවශ්‍ය නැහැ.
>
> පුද්ගලයින්ගෙන් ඉදිරිපත් උනා මේ ඡන්දය පොල් පිත්තක් දැම්මත් ජයග්‍රහණය කරන්න පුළුවන් කියලා.
>
> මොකද විපක්ෂය නියෝජනය කරන්නේ ඒ කියන්නේ ආණ්ඩු පක්ෂය නියෝජනය කළේ ඒ පොල් ලෙල්ලක් පොල් පිත්තක් තරම්වත් වටින්නෙ නැති අය නිසා කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, 54 පිටුවේ පහල ඉඳලා දෙවෙනි පේළියේ හිතන්නේ නැහැ පසුගිය කාලෙ තිබුණ මැතිවරණ ක්‍රමයට කියලා තියෙනවා. මං හිතන්නෙ නෑ පසුගිය කාලෙ තිබුණු මෙවැනි කොට්ඨාශ ක්‍රමයට තිබුණු මැතිවරණ ක්‍රමයකට තරඟ කළා කියලා ලෙස නිවැරදි වෙන්න ඕනෙ.

**<u>සංශෝධන අංක 09</u>**

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 54 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමාගේ කථාවේ සඳහන් අදහස් දැක්වීම පහත පරිදි සංශෝධනය විය යුතුයි.

> මං හිතන්නේ නැහැ පහුගිය කාලෙම තිබුණු මෙවැනි කොට්ඨාස ක්‍රමයට තිබුණු මැතිවරණ ක්‍රමයට කවුරුවත් තරඟ කළා කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, 59 වෙනි පුටුවේ මගේ කථාවේ සඳහන් වෙලා තියෙනවා 12 වෙනි පේළියේ සුළු කාරණ කියලා තියෙනවා එය විශේෂ කාරණා කියලා නිවැරදි වෙන්න ඕනේ. මව්පියෝ සුරකිමු කියලා තියෙනවා. මව්බිම සුරකිමු කියලා එයත් වෙනස් වෙන්න ඕන.

**<u>සංශෝධන අංක 10</u>**

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 59 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමාගේ කථාවේ සඳහන් අදහස් දැක්වීම් පහත පරිදි සංශෝධනය විය යුතුයි.

> ගරු සභාපතිතුමනි, මම හුඟක් ලොකු දේවල් කිව්වෙ නෑ. විශේෂ කාරණා ඉදිරිපත් කළේ.
> මව්බිම සුරකිමු. දේශීය ආර්ථිකයක් ගොඩනගමු. මේ ඔබේ අවස්ථාවයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ ප්‍රදීප් කුමාර් මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මගේ කතාවේ මම රනිල් වික්‍රමසිංහ මහතාගේ නම කිව්වා. එය සඳහන් වෙලා නැහැ. මම කිව්වෙ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටට මුකුත් නොකළ පුද්ගලයෝ කියලා කියන්න බැහැ. ඔවුන් රටට යහපත් දේවල් කරලා තියෙනවා. ඒ වගේම සමහර ගත්ත තීන්දු වැරදිලාත් තියෙනවා කියලා.සංශෝධනය විය යුත්තේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නම මෙතන සඳහන් වෙලා නැහැ.

<u>සංශෝධන අංක 11</u>

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 84 A හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ. ප්‍රදීප් කුමාර් මැතිතුමාගේ කථාවේ අදහස් දැක්වීමට පහත කොටස එකතු විය යුතුයි.

> මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටට මුකුත් නොකළ පුද්ගලයෝ කියලා කියන්න බැහැ. ඔවුන් රටට යහපත් දේවල් කරලා තියෙනවා. ඒ වගේම සමහර ගත්ත තීන්දු වැරදිලාත් තියෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඔල්ගා අතුකෝරල මැතිතුමිය.</u>

ගරු සභාපතිතුමනි, 61 පිටුවේ 91 ඉඳන් මම මේ සභාවේ සභපතිවරු එක්ක කටයුතු කළා. ඒකෙ වැඩිපුර තියෙනවා. සෑම වැඩ කටයුත්තකදීම මම කටයුතු කරනකොට මේ එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා කරමින් හැමදාම කටයුතු කළා කියන එක තමයි එන්න ඕනෙ.

<u>සංශෝධන අංක 12</u>

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 61 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඔල්ගා අතුකෝරල මැතිතුමියගේ කථාවේ සඳහන් අදහස් දැක්වීම පහත පරිදි සංශෝධනය විය යුතුයි.

> ඒ වගේම මම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක් හැටියට 91 ඉඳන් මේ දක්වා මේ සභාව නියෝජනය කරලා සභාපතිවරු ගණනාවක් එක්ක මේ සභාවේ වැඩ කටයුතු කළා. ඒ හැම වැඩකටයුත්තකදිම මම එක්සත් ජාතික පක්ෂය ආරක්ෂා කරමින් හැමදාම කටයුතු කළා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, 25 පිටුවේ අස්ගිරිය හෝටලය කියන එක හස්තිගිරිය හෝටලය ලෙස නිවැරදි වෙන්න ඕනේ.

<u>සංශෝධන අංක 13</u>

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 25 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමාගේ කථාවේ සඳහන් අදහස් දැක්වීම පහත පරිදි සංශෝධනය විය යුතුයි.

ඡන්දේ දවසේ මගේ වාහනය හප්පලා එවකට හිටිය ආරක්ෂක ලේකම්තුමා පවා පැමිණියා. යසරු මන්ත්‍රීතුමා හිටියා. හස්තිගිරිය හෝටලය ළඟදි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුමුදිනී ජයවර්ධන මැතිතුමිය.</u>**

ගරු සභාපතිතුමනි, මේක හදන්නම ඕනෙ අඩුපාඩුවක් අනෙක් වචන වගේ නෙමෙයි. මම ධම්මපදයේ ගාථාවක් කියලා තියෙනවා. 71 වෙනි පිටුව ඒකේ චක්කන්ව වහතෝ පදං වෙන්න ඕනෙ. ගාථා පාඨයක් නිසා ඒක අනිවාර්යයෙන්ම වෙනස් වෙන්න ඕනෙ.

**<u>සංශෝධන අංක 14</u>**

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 71 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුමුදිනී ජයවර්ධන මැතිතුමියගේ කථාවේ සඳහන් අදහස් දැක්වීම පහත පරිදි සංශෝධනය විය යුතුයි.

මං ධම්ම පදයේ පළවෙනි ගාථාව ඔබට මතක් කරනවා. මනෝ පුබ්බංගමා ධම්මා මනෝ සෙට්ටා මනෝමයා. මනසාචේ පසන්නේන භාසේතිවා කරෝතිවා. තතෝනං දුඛමං හෝති ඡායාව අනපායිනි තතෝනං දුක්ඛ මං හෝතී චක්කන්ව වහතෝ පදං.

**<u>ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මට සංශෝධනයක් තියෙනවා. 21 වෙනි පිටුව,ස්තුතිය පුද කිරිමේදී ගාමිණී ලොකුගේ මැතිතුමාගේ නමත් බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ නමත් ඇතුළත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**<u>සංශෝධන අංක 15</u>**

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 21 හි සඳහන් ගරු උප සභාපතිමංජුල ප්‍රදිප් කුමාර් මැතිතුමාගේ කථාවේ සඳහන් අදහස් දැක්වීම පහත පරිදි සංශෝධනය විය යුතුයි.

අපිට මෙතන්ට පැමිණිමට අපේ දේශපාලන ගමනට අවිස්සාවේල්ල ආසනය නියෝජනය කරන අපේ පක්ෂයේ නායකයා විදිහට කටයුතු කරන නිතිඥ රවින්ද්‍ර ජයසිංහ මැතිතුමාත්, ඒවගේම කොමියුනිස්ට් පක්ෂයේ මහේෂ් අල්මේදා මැතිතුමා, මහජන එක්සත් පෙරමුණේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, ගීතාංජන ගුණවර්ධන මැතිතුමා, ගාමිණි ලොකුගේ මැතිතුමා, බන්දුල ගුණවර්ධන මැතිතුමා ඇතුළු ඒ සියලු පක්ෂ නායකයන්, පිවිතුරු හෙළ උරුමයේ, ජාතික නිදහස් පෙරමුණේ ඒ සියලු නායකයින්ගේ සහයෝගය අපිට මේ ජයග්‍රහණය සඳහා ලබා දුන්නා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි,පිටු අංක 82 මගේ අදහස් පල කිරීමේදී මා අදහස් දැක්වුවේ, මෙම ගරු සභාව විසින් ඉදිරිපත් කරන ජනතා හිතකාමී හා සභාවට ගැලපෙන සහ නිවැරදි යෝජනා වලදී අවශ්‍ය සහයෝගය පලකරනවා කියන අදහස. මෙතන 82 පිටුවේ අවසාන වාක්‍යයට උඩින් සඳහන් වෙන්නෙ, ඒ වගේම අවශ්‍ය ඕනෑම වෙලාවක සහාය ලබාදෙන්න

බලාපොරොත්තු වෙනවා කියන එක. අපි අදහස් කරපු අදහස ඒ තුළින් ඉදිරිපත් වෙන්නේ නැහැ. අපි ඉදිරිපත් කළේ, වඩා යහපත් හා නිවැරදි යෝජනා වෙනුවෙන් අවශ්‍ය සහයෝගය ලබාදෙනවා කියන කාරණාව.

**<u>සංශෝධන අංක 16</u>**

2018.04.17 වන දින මහා සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 82 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන

සූරියආරච්චි මැතිතුමාගේ කථාවේ සඳහන් ඒ වගේම අවශ්‍ය ඕනෑ වෙලාවක සහාය ලබාදෙන්න බලාපොරොත්තු වෙනවා. යන අදහස් දැක්වීම පහත පරිදි සංශෝධනය විය යුතුයි.

මෙම ගරු සභාව විසින් ඉදිරිපත් කරන ජනතා හිතකාමි හා සභාවට ගැලපෙන සහ නිවැරදි යෝජනා වලදී අවශ්‍ය සහයෝගය පළ කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

වෙනත් සංශෝධන නොමැතිනම් වාර්තාව සභා සම්මත කරන්න.

ගරු මන්ත්‍රීවරුනි, මේ වාර්තාවේ අඩුපාඩු තියෙන්න පුළුවන්. ඉතා කෙටි කාලයක් තුළ ඉතා විශාල වාර්තාවක් තමයි අපි පහුගිය සභාවේදී සකස් කළේ. ඒ නිසා මේ අඩුපාඩුකම් සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ට යම් අපහසුතාවයක් වුණා නම් අපි කණගාටු වෙනවා. ඒ වනවිට අපේ ශබ්ද පරිපාලන යන්ත්‍ර තාවකාලිකව සකස් කරලා තිබුණේ. ඒ නිසා සමහර මන්ත්‍රීවරුන්ගේ කතා හරියට පටිගත කරගන්නත් නොලැබුණු අවස්ථා තිබුණා. එදා තිබුණු තත්වය නිසා තමයි මෙහෙම වුණේ. ඒ නිසා ලබන සභාවාරය මීට වඩා හොඳ විදියට අපිට ඔබේ වාර්තාව ලබාදෙන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. යම්කිසි කෙනෙක්ට අපහසුතාවයක් වුණා නම් අපි ඒ ගැන කණගාටුව ප්‍රකාශ කරනවා. මොකද ඒ පැවති තත්වය අනුව තමයි මේ තත්වය උදාවුනේ කියන කාරණයත් මතක් කරනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමිය.</u>

ගරු සභාපතිතුමනි, 2018.04.17 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව පිළි ගත යුතු සත්‍ය වාර්තාවක් බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>2018.04.17 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව පිළි ගත යුතු සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමියගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඉහත සංශෝධනයන්ට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.</u>**

## <u>02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.</u>

1. පළාත් පාලන කොමසාරිස් (බ.ප.) විසින් අංක LGD/05/02/01 සහ 2018.05.04 දිනැතිව, පළාත් පාලන ආයතන ධූරධාරීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම යන හිසින් යුතුව ලේකම්තුමා වෙත යොමු කරන ලද ලිපිය. පළාත් පාලන කොමසාරිස්තුමිය විසින් එවන ලද ලිපියේ පිටපතක් සහ හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍රය සියලුම මන්ත්‍රීවරුන්ට ලබාදුන් අතර ඉතා ඉක්මණින් එම ආකෘති පත්‍ර සම්පූර්ණ කර භාරදෙන ලෙසද ඉල්ලා සිටින ලදි.

2. පළාත් පාලන කොමසාරිස්(බ.ප.) විසින් අංක LGD/2/L/වත්කම් බැරකම්/2018 සහ 2018.05.31 දිනැතිව, 1985 අංක 29 දරණ පනතින් හා 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබාගැනීම යන හිසින් යුතුව ආයතන ප්‍රධානීන් වෙත යොමු කරන ලද ලිපිය.
බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන ප්‍රධානීන් ඇතුළු සියලුම මහජන නියෝජිතයන් හා එකී ආයතනවල සේවය කරනු ලබන වැටුප් කේතය එම්එන්07 හා ඊට ඉහල වැටුප් පරිමාණයන්ගෙන් වැටුප් ලබාගන්නා සියළුම

නිලධාරින් 1985 අංක 29 දරණ පනතින් හා 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව සෑම වර්ෂයකම මාර්තු 31 දිනට තම වත්කම් පිළිබඳ ප්‍රකාශයක් අදාල ආකෘතිය මගින් එම වර්ෂයේ ජුනි 30 දිනට පෙර එකී ආකෘති පත්‍ර බාරදිය යුතු පළාත් පාලන කොමසාරිස් වෙත භාරදෙන ලෙසද ඉල්ලා සිටින ලදි.

3. සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සම්බන්ධීකරණ කමිටු රැස්වීම 2018.05.14 වන දින පෙ.ව. 9.00 ට පැවැත්වෙන බව සඳහන් කරමින් සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) විසින් අංක DSS/5A/ ප්‍රා.සම්.ක.රැ/2018 සහ 2018.05.14 දිනැතිව,ගරු සභාපතිතුමා වෙත යොමු කරන ලද ලිපිය.

4. පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සම්බන්ධීකරණ කමිටු රැස්වීම 2018.05.14 වන දින ප.ව. 2.00 ට පැවැත්වෙන බව සඳහන් කරමින් පාදුක්ක ප්‍රාදේශීය ලේකම් විසින් අංක පා/සං/02/01/ප්‍රා.සම්.කමිටු/2018 සහ 2018.05.08 දිනැතිව ගරු සභාපතිතුමා වෙත යොමුකරන ලද ලිපිය.

<u>ගරු සභාපතිතුමා</u>

මන්ත්‍රී මණ්ඩලයේ සමූහ ඡායාරූපය ලබාගැනීම සඳහා ලබන මහා සභා රැස්වීම පැවැත්වෙන දින පෙ.ව. 9.00ට යොදා ගන්නා බවත් ඒ සඳහා සුදුසු ඇඳුමකින් සැරසී පැමිණෙන ලෙසට ගරු මන්ත්‍රීවරුන් වෙත දැනුම් දුන් අතර සුදු ඇඳුමක් නම් වඩාත් සුදුසු බව ද සඳහන් කර සිටින ලදී.

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරිම. – ඉදිරිපත්ව නැත.

## 04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, සමාවෙන්න මට පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයයි. මීට කලින්. මම යෝජනාවක් දුන්නා. එය සභාවට අනුකූල යෝජනාවක් නෙමෙයි කියලා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන පැහැදිලි කිරිමක් පසුව කරගනිමු. වෙනත් කරුණු යටතේ මේ ගැන පැහැදිලි කරගන්න අවස්ථාව ලබා දෙන්නම්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මෙතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා එය සභාවට දාලා නැහැ. මේ ගැන ඔබතුමාට කරුණු පැහැදිලි කරන්න පුළුවන්.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ සඳහා අවස්ථාව නෙමෙයි මේ. මේ න්‍යාය පත්‍රයේ කල් දි ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දෙන අවස්ථාව. පසුව ඒ ගැන පැහැදිලි කිරිමක් කරන්නම්. වෙනත් කරුණු යටතේ සාකච්ඡා කරන්න පුළුවන්. සභාවට නරක ආදර්ශ දෙන්න එපා. නවක මන්ත්‍රීවරුන් ඉන්නවා.

**<u>04- (01) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරයි.</u>**

1. වැලිකන්න - ලහිරුගම ප්‍රධාන මාර්ගයට යාබදව හීන් ඇලට සම්බන්ධ කර ඉදිකර ඇති ඕකිඩ්ය හෝටලය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්න ඉදිරිපත් කරමි.

   i. ඉහත හෝටලය ඉදිකර ඇති ඉඩම සීතාවක ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව මගින් අනුමත කර තිබේද?

   පිළිතුර - නේවාසික භාවිතය සඳහා අනුමත කර ඇත.

   ii. ඒ කවර දින පැවති සැලසුම් කමිටුව මගින්ද ?

   පිළිතුර - 2015.09.22සැලසුම් කමිටුව මගින්.

   iii. ඉහත හෝටලයේ ගොඩනැගිලි ඉදිකිරීම් සීතාවක ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව මගින් අනුමත කර තිබේද?

   පිළිතුර - නැත.

   iv. ඒ කවර දින පැවති සැලසුම් කමිටුව මගින්ද ?

   පිළිතුර - අදාල නොවේ.

   v. ඉහත හෝටලයේ හීන් ඇලට සම්බන්ධ කර ඇති ඉදිකිරීම් සීතාවක ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව මගින් අනුමත කර තිබේද?

   පිළිතුර - නැත.

   vi. මෙම හෝටලයේ ඉදිකිරීම් සඳහා වූ සැලසුම් සීතාවක ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව මගින් අනුමත කරවාගෙන තිබේ නම් අදාල ඉදිකිරීම් නිසි ලෙස (සැලසුම් වලට අනුකූලව) සිදු කර ඇති බව සීතාවක ප්‍රාදේශීය සභාව සහතික කර තිබේද?

   පිළිතුර - අදාල නොවේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, සීතාවක ප්‍රාදේශීය සභාවෙන්ගොඩනැගිලි ඉදිකිරීම් අනුමත කර නැත කියලා කිව්වා. එසේ නම් මේ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් යම් පියවරක් ගත හැකිද.

<u>ගරු සභාපතිතුමා</u>

මෙහි අපෙන් අනුමත කර ගත යුතුයි කියලා තිබුණත් කාලයකදී තිබුණා නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමත කර ගැනීමේ අවස්ථාවක්. එය පහුගිය කාලෙත් පැවතුණා. 2013 වසරේදී හෝ 2014 වසරේදී පැවතුණා. අපි හොයලා බලන්න ඕන ඒ කාලයේ අනුමත කරගෙනද කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා.</u>

අපි දන්නවා මොනම තත්වයක් යටතේවත් අපේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉදිකිරීමක් කරනවා නම් අප සභාව දැනුවත්ව හෝ අපේ අනුමැතිය තුළ ඉදි කළ යුතුයි. මම ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා එසේ නොවුණහොත් නිත්‍යානුකූල නොවනවා නම් අපට ගත හැකි පියවර කුමක්ද.

<u>ගරු සභාපතිතුමා</u>

නාගරික සංවර්ධන අධිකාරිය අපි දන්න විදිහට 2014 වසරේ එක් අවස්ථාවකත් පසුගිය කාලයේදීත් ප්‍රාදේශීය සභාවට තිබුණු බලය නාගරික සංවර්ධන අධිකාරිය සතු කර ගත්තා. මේ කාලයේ මෙය අනුමත කරගෙන තියෙනවා නම් එය

ප්‍රමාණවත් වේවි. ඒ කාලයේ මට මතකයි සතියක් ඇතුළත මෙවැනි සංවර්ධන සැලසුම් අනුමත කර ගැනීමේ අවස්ථා තිබුණා. ඒ කාලයේදී අනුමත කර ගෙන නම් අපිට නැවත මේ ගැන කථා කරන්න වෙනවා. දැනට තියෙන තත්වය අනුව අපෙන් අනුමත කරගෙන නැහැ ගොඩනැගිලි ඉදි කිරීම සම්බන්ධව. ඉඩම පමණයි අපෙන් අනුමත කරගෙන තියෙන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, අපිට කියන්න පුළුවන්ද මේ අනුමත කිරීම් නාගරික සංවර්ධන අධිකාරියට භාර දිලා තියෙන්නේ හිටපු ආරක්ෂක ලේකම්තුමාගේ කාලයේදීද නැත්නම් මොකද්ද ඒ කාලය කියලා.

**<u>ගරු සභාපතිතුමා</u>**

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නයට පිළිතුරු ලබා දුන්නා. මේ සම්බන්ධයෙන් ප්‍රශ්න අහන්න බැහැ. ප්‍රශ්නය ඉදිරිපත් කල මන්ත්‍රීතුමාට විතරයි ප්‍රශ්නයක් අහන්න පුළුවන්.

## 05. <u>යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාවේදි මගේ ප්‍රශ්නය අහන්න බැරිද.

**<u>ගරු සභාපතිතුමා</u>**

මන්ත්‍රීතුමා මෙය ඒ සදහා අවස්ථාව නෙමෙයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, අපි යෝජනාවක් දීලා ඒ යෝජනාව ඇයි සභාවට දාන්නේ නැති වෙන්න හේතුව මොකද්ද කියලා අපිට දැනගන්න බැරිද. අපිට පැහැදිලි කරලා දෙන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, අපි ඉල්ලලා තියෙන්නේ කාලින ප්‍රශ්නයක්. කාරක සභාවක් බවට පත් කරලා අපිට පැහැදිලි කරලා දෙන්න. එය ඉදිරියටත් උපකාරි වෙයි.

**<u>ගරු සභාපතිතුමා</u>**

කාරක සභාවක් බවට යෝජනා කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු සභාපතිතුමා</u>**

නීති නිලධාරින් මුණ ගැහිලා සාකච්ඡා කළට පස්සේ අපි බලාපොරොත්තු වෙනවා ඔබතුමාලාට ඒ අවස්ථාව ලබා දෙන්න. එතෙක් අපිට මේ කටයුතු කරන්න බැහැයි කියන එක දැනුම් දෙනවා. ඒ නීති, රීති හා පනත අනුව බවත් මම මේ මහා සභාවේදී මතක් කරනවා.

**<u>05 - (01) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩී. අයෝම මධු ප්‍රසාද් මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

සීතාවක ප්‍රාදේශිය සභාව සතු විශේෂයෙන් වෙන්දේසි ඉඩම් තුළ පොදු පහසුකම් සඳහා වෙන් කර ඇති ඉඩම් කොටස්වල සීතාවක ප්‍රාදේශිය සභාවේ අයිතිය තහවුරු කරමින් ඒවා තුළ නාම පුවරු සවි කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමනි, ඉතාම වැදගත් යෝජනාවක් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ. අපි දන්නවා පොදු කටයුතු වලට වෙන්කරන කොටස් සම්බන්ධයෙන් අද සභාවේ ගොඩක් ප්‍රශ්න තියෙනවා. එතුමාගේ යෝජනාව ස්ථිර කරන ගමන් මම කියන්නේ ඉදිරියේදීවත් නිශ්චිත මායිම් ටිකක් ලකුණු කරලා අඩුගානේ වෙන්දේසිකරු විසින් හෝ නිශ්චිත මායිම් සලකුණු කරන වැඩ පිළිවෙලක් සකස් කර සභාව සතු කොටස ඔප්පුවකින් නිරවුල් කරගන්නවා නම් හොඳයි. සමහර අවස්ථාවල අපි දැකලා තියෙන අපිට හම්බවෙලා තියෙන ප්‍රශ්න වලදී සභාව සතු ඉඩම් කොටස් වලට සභාව සතු ඔප්පුවක්වත් නෑ. එවැනි ප්‍රශ්න කිහිපයක් නිරවුල් කර ගැනීමට අපි දැන් කටයුතු කරමින් පවතින බව ඔබතුමා දන්නවා. ඉදිරියේදීත් වෙන් කරන කොටස වෙන්දේසි ආයතන හරහා හෝ ස්ථිර මායිම් ටිකක් සලකුණු කරලා ආරක්ෂා කරගැනීමේ වැඩපිළිවෙලක් සමග එම පුවරු සවි කිරීම හොඳයි කියලා තමයි මම කියන්නෙ. බොහොම ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මුලින් සඳහන් කළා සභාවට අවශ්‍ය යෝජනා තමයි එන්න ඕනෙ කියලා. එතකොට මේ යෝජනාව සභාවට දාන්න ඕනෙද? සභාපතිතුමාගේ තර්ක අනුව නම් මේ යෝජනාව ඕනෙ නැහැ. අවශ්‍ය නම් මම කාරක සභාවක් කරලා දෙන්නම්. ලේකම්තුමා උත්තර දෙන්න. මේ සභාවට මේ යෝජනාව දාන්න ඕනෙ නැහැ. සභා දේපලක බෝඩ් ගහන්න ඒක සභා සම්මත කරගන්න ඕනෙ නැහැ. එක එක විදියට හැරෙන පැත්තට හැරෙන තැපැලෙන් කතා කරන්න එපා. තමන්ගෙ වාසියට තමන්ගෙ එක්කෙනා යෝජනාව දැම්මම ඒක දාන්නයි. අපේ එක්කෙනා දැම්මම ඒක නොදා ඉන්නයි. එහෙම කරන්න එපා. මේ යෝජනාව සභාවට දාන්න ඕනෙ නැහැ මම දන්න නීතිය අනුව. මේ යෝජනාව බෝඩ් එකක් ගහන්න ඕනෙ නම් සභාවේ ඉඩම හොයාගෙන ගිහින් මුදල් කමිටුවට බෝඩ් එක හදන්න ඇස්තමේන්තුව දාලා බෝඩ් එක ගහන්න පුළුවන්. මේකට සභාවේ බලය අවශ්‍ය වෙන්නෙ නැහැ. ඒක යෝජනාව දාද්දි ලේකම්තුමා දන්නෙ නැහැ. ඒ නිසා මේ හැරෙන හැරෙන විදියට කතා කරන්න එපා. දාන්න ඕනෙ

යෝජනාව මොකක්ද කියලා හරියට අධ්‍යයනය කරලා දාන්න. කමිටුවකින් අධ්‍යයනය කරලා දාන්න. මේ යෝජනාව සභාවට දාන්න ඕනෙ නෑ. මේ සභා දේපල, සභා පනතෙන්ම කියලා තියෙනවා සියලු මන්ත්‍රීවරු සහ සියලුදෙනා සභාවේ දේපල ආරක්ෂා කළ යුතුයි කියලා. බෝඩ් එක ගහන්න මුදල් කමිටුවට මිල ගණන් 03 ක් දාලා බෝඩ් එක ගහන්න පුළුවන්. මේකට සභා යෝජනා දාන්න ඕනෙ නෑ මම දන්න නීතිය අනුව. මම දන්නෙ නෑ හරිද වැරදිද කියලා වැරදිනම් කියලා දෙන්න පුළුවන්. හැබැයි යෝජනාව හොඳයි. සභා දේපලේ බෝඩ් ගහලා නැත්නම් අයෝම මන්ත්‍රීතුමා අළුත් මන්ත්‍රීවරයෙක් දාපු යෝජනාව හොඳයි. එතුමා යම් දැක්මක් ඇතුව මේ යෝජනාව දාලා තියෙන්නෙ. අපේ ස්ථිර කරපු අශෝක මන්ත්‍රීතුමා එතුමා මිනුම් නිලධාරියෙක්. එතුමා කිව්ව විදියට මැනුම් කටයුතු කරගන්න පුළුවන්. ඒකත් හොඳයි. එතුමාගේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ දක්ෂතාවයෙන් ඒ සභා ඉඩම් ටික මැනලා බෝඩ් ගහන්න. හැබැයි මෙහෙම වැඩ කරන්න එපා මේ යෝජනාව හරියට ලේකම්තුමාගෙන් උපදෙස් අරන් බලන්න මේ යෝජනාව සභාවට දාන්න ඕනෙද කියලා. අවශ්‍ය වෙන්නෙ නැහැ මේකට බලය ඕනෙ වෙන්නෙ නැහැ. මේකට බලය ඔටෝ ලැබිලා තියෙනවා. සභාවෙන් බලය අවශ්‍ය නැහැ. ඒ හින්දා හරියට හැමදෙනාගේම දේවල් හොයලා බලලා කටයුතු කරන්න කියලා ඉල්ලමින් මේ යෝජනාවට මගේ පූර්ණ සහයෝගය ලබාදෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා</u>

මම බොහෝම ස්තුතිවන්ත වෙනවා අපේ ගරු අයෝම මන්ත්‍රීතුමාට. ඇත්තටම ඒකෙ අපේ සභාව සතු දේපල ආරක්ෂා කරගැනීමේ උනන්දුව මත විශේෂයෙන් ජනතාවට සේවය කරන්න තියෙන ඉඩකඩ සභාව සන්තකයේ තබා ගැනීම සඳහා කරන ලද යෝජනාවක් හැටියට මම ඒ යෝජනාව දකිනවා. අපි පහුගිය කාලවල දැක්ක කාරණාවක් තමයි එක පැත්තකින් මේ සභාව සතුව තියෙන මේ සුසාන භූමිවල පවා මිනිස්සු ඇවිල්ලා පදිංචි වෙලා ඒවා වෙන්කරගෙන කටයුතු කරලා තියෙනවා. උදාහරණයක් හැටියට බෝපේ සුසාන භූමියේ කොටසක් කාලයකදී ගම්මුන්ට දෙන්න සිද්ධ උනා. ඒ වගේම මම දන්නවා පිටුම්පේ ප්‍රදේශයේ අන්නාසිගලහේන ප්‍රදේශයේ සුසාන භූමිය සඳහා තියෙන ඉඩම් කොටස් ජනතාව අල්ලගෙන තියෙනවා. පොදුවේ පරිහරණය කරන්න තියෙන ඒ භූමි භාගන් පුද්ගලිකව පාවිච්චි කරලා තමන්ගෙ දේපල බවට පරිවර්තනය කරගෙන තියෙනවා. ඒ එක්කම මට කියන්න ඕනෙ විශේෂයෙන් මේ කාරණාව ගැන. මට පහුගිය කාලේ අත්දැකීමක් තියෙනවා මම සභාපතිවෙලා ඉන්න කාලෙ උඩුමුල්ල ප්‍රදේශයේ වෙන්දේසි කරන ලද ඉඩමක් අපේ සභාව ඒක වෙන්කරගෙන නැතුව ඒකට නාමපුවරුවක්වත් නැතුව තියෙන කාලේ ඒ වෙන්දේසිකරු විසින් ඒක නැවතත් විකුණලා තිබුණා. පසුව ඒ ප්‍රදේශවාසීන් ඇවිත් පැමිණිලි කළාම අපිට සිද්ධ උනා ඒ ඉඩම විකුණලා තිබුණ නිසා අපිට ඔප්පුවකින් පවරලා තිබුණේ නැති නිසා අපිට ඒ වෙන්දේසිකරුගෙන් ඒ සඳහා එදා තිබුණු මිලට ඒ සඳහා මුදල් අයකරගැනීමට. මෙවැනි ගැටළු නැවත මතු නොවීම සඳහා වූ මෙම

යෝජනාවට මාගේ සන්තෝෂය පලකරමින් ඒ යෝජනාවට ගරු සභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

<u>ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව පිළිබඳව මට වචන කිහිපයක් ප්‍රකාශ කරන්න කැමතියි. මම හිතන්නේ අපේ ප්‍රදේශයේ විශාල වශයෙන් වෙන්දේසි ඉඩම් පවතිනවා. අපි ඉතිහාසයේ හිටපු සභාපතිවරු යටතේත් වෙන්දේසි ඉඩම්වල පොදු කටයුතු ඉඩම වෙන්කිරීමේදී යම්කිසි ක්‍රමවේදයක් අනුගමනය කළා. මොකද වෙන්දේසිකරුවන් නිතරම අපිට ඉඩම ලබාදෙන්නේ ඉඩමේ වැඩක් කරන්න බැරි තැනක්. ඉතින් අපි විශාල ඉඩම් මනිනකොට ඒ ඉඩමේ පාරට ආසන්නව එම ඉඩමේ පොදු පහසුකම් කොටසින් සියයට ප්‍රමාණයක් වෙන්කරගත්තා. අද ඒක ක්‍රියාත්මක වෙනවාද කියලා දැනගන්නත් කැමතියි. ඒ වගේම ගරු සභාපතිතුමනි, මම මේක සංශෝධිත යෝජනාවක් විදියට ගේනවා. මෙය ක්‍රියාත්මක කිරිමේදී පොදු පහසුකම් කොටස වෙන්කිරීමේදී ඉඩම් වෙන්දේසිකරුවා විසින් ඒක කම්බියක් ගහලා කම්බි මායිමක් හෝ ගහලා එහි බෝඩ් එකත් වෙන්දේසිකරුවා විසින්ම කරලා අපි සභාවට

භාරගත්තනම් ඒක ගැන අපිට නැවත නැවතත් හොයලා බලන්න ඕනෙ නැහැ. මොකද අපි දන්නවා වෙන්දේසි ඉඩම්වල එකවර පදිංචි වෙන්නෙ නැහැ. ටික කාලයක් යනකොට වෙන්දේසි ඉඩමේ අයවත් දන්නෙත් නෑ පොදු පහසුකම් ඉඩම තියෙන්නෙ කොහෙද කියලා. එක්කෝ අල්ලපු එක්කෙනා මායිම අල්ලගෙන. ඒක හින්දා මම යෝජනාවක් කරනවා මේක වෙන්දේසිකරුවා විසින්ම මායිම් හදලා බෝඩ් එකත් එක්කම අපිට භාරදෙන්න ඒ තාක්ෂණ නිලධාරී හරහා ඒ උපදෙස් ලබාදෙන්න කියලා ලේකම්තුමා හරහා. බොහොම ස්තූතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව සම්බන්ධයෙන් එකක් අපේ උප සභාපතිතුමා එකතු කළා සංශෝධන අදහසක්, ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහසක් දක්වනවා. සාමාන්‍යයෙන් අපිට තියෙන මේ අත්දැකීම් අනුව වෙන්දේසිකරු කොයිවෙලාවකවත් පොදු ඉඩම් කොටස යලිත් ඔහුගේ උවමනාවෙන් මේක හොයාගෙන ඇවිත් සභාවට දෙන්නවත් ඒ පොදු පහසුකම් සංවර්ධනය කරන්නවත් උත්සාහ කරන්නෙ නැහැ. ඒක අපිට මේ ජීවිත කාලේ තියෙන අත්දැකීම. ඉතින් මෙතෙන්දි මම ඒ යෝජනාවට යමක් එකතු කරනවා. තවදුරටත් වෙන්දේසිකරුටම ඒ අදාල සීමාව වෙන්කර දීමේ වැඩි බලයක් දෙනවා වෙනුවට අපි දන්නවා කවුරුවත් තමන්ගෙ වෙන්දේසි ඉඩම් වලින් අඟලක්වත් අහිමි වෙනවාට කැමති නැහැ. නමුත් නීතිය අනුව මේ සැලසුම් කොටස් අනුමත කරගන්න බැඳී ඉන්නෙ. ඒ නිසා සැලසුම අනුමත කරගනිද්දිම එහි වගකීම ප්‍රාදේශීය සභාවේ වැඩ අධිකාරීගේ ප්‍රධානත්වයෙන් තාක්ෂණ නිලධාරී මඟින් ඒ අදාල නිත්‍යානුකුල තත්වය අවසන් කරලා එහි අවසන් කටයුතු දක්වාම ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරීන් ඇතුළු කණ්ඩායම නීත්‍යානුකූලව ඒ මැනුම් කටයුතු කිරීමට අවශ්‍ය කට්ටිය ගෙන්වා ඒ කටයුතු සිදුකරන්න කියලා යෝජනා කරනවා. එහෙම නැතුව වෙන්දේසිකරුට මේකෙ උපරිම සීමාව තිබ්බොත් මේ දැක්ක අත්දැකීමේ ලොකු වෙනසක් වෙන්නෙ නැතිවෙයි. ඒ වගේම ගෙනාපු යෝජනවා සම්බන්ධයෙන් අපි ස්තූතිවන්ත වෙනවා. ඒක හොඳ යෝජනාවක්. අද ගොඩක් වෙන්දේසි කරන වෙන්දේසි ඉඩම්වල පදිංචි වෙන මේ නිවාසලාභීන්ට මේ නිවාස හිමියන්ට තමන්ගේ පොදු පහසුකම් කටයුතු පිළිබඳ බරපතල ප්‍රශ්න මතුවෙලා තියෙනවා. දරුවන්ට යන්න එන්න සෙල්ලම් කරන්න තැනක් නැතිවෙලා තියෙනවා. ඒ ආදී වශයෙන් සැලකිල්ලට ගනිද්දි මේ සභාව මේ යෝජනවා සම්මත කරලා මෙතනින් එහාට නිවැරදි කරන්න අවශ්‍ය පියවර ගන්නවානම් ඒක වඩාත් හොඳයි. ඒ යෝජනාව පිළිබඳව අපිත් සුබවාදීව අදහස් දක්වනවා. ඒ යෝජනවා පිළිබඳව ස්තූතිවන්ත වෙන ගමන්ම මෙතනින් ඉදිරියට වෙන්දේසි ඉඩම් පිළිබඳව පොදු පහසුකම් සඳහා වන කොටස වඩා නිවැරදි නීත්‍යානුකුල පදනමකින් සභාව සතු කරගැනීම සඳහා උපරිම මැදිහත්වීම සිදුකරන්න කියලා ඉල්ලමින් යෝජනාවට පක්ෂව අදහස් දක්වනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ. ප්‍රදිප් කුමාර් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මමත් යෝජනාවක් කරන්න කැමතියි. විශේෂයෙන් අපි දකින කාරණාව තමයි පෙර කී වෙන්දේසි ඉඩම්වල වෙන්දේසිකරුවා අපිට වාසි සහගත විදියට මේ ඉඩම් කොටස වෙන් කරන්නෙ නැහැ. එතෙන්දි අපි යම් නිර්ණායකයන් කිහිපයක්හදා ගත්තා නම් හොඳයි. හැම ළමයෙක්ටම සෙල්ලම් කරන්න යන්න පුළුවන් හැකියාව අඩුයි. අපි යම් නිර්ණායක කිහිපයක් යොදාගත්තොත් මේ වෙන්දේසි ඉඩමක පොදු පහසුකම් කොටස වෙන්කිරීමේදී නිර්නායක කිහිපයක් යොදා ගතයුතු බව මම මතක් කරනවා. ඒ වගේම ඒ යෝජනාවට අපිත් පක්ෂයි. අපි බොහෝම ස්තූතිවන්ත වෙනවා අයෝම මන්ත්‍රීතුමාට ඒ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. ගිය මුදල් කමිටුවේදී යම් ගැටලුවක් මතුවුනා වෙන්දේසි ඉඩම්වල ඔප්පු සම්බන්ධයෙන්. අපිට ඔප්පු නැති තැන් තිබීම සම්බන්ධයෙන්. තවදුරටත් ඒ පිළිබඳව සොයා බලලා අපි එදා යෝජනා කළා වගේ දැනට වෙන්දේසිකරුවන් අපිට ඔප්පු ලබානොදුන් තැන්වල වහාම ක්‍රියාත්මක වෙලා ප්‍රකාශන ඔප්පු හදලා ඒවා අපිට ලබාගන්න. නීත්‍යානුකුල තත්වය ලබාගත්තා නම් හොඳයි කියලා. මොකද අපි ලයිට් දෙන්න ගිහින් එතන යම් ගැටළුවක් මතුවුණා ඔප්පු නැති නිසා නේද ලේකම්තුමා. ඉතින් ඒ වගේ ගැටලු වලට මුහුණ දෙන නිසා ඉදිරියේදී එසේ නොවීමට අපිට දැනට ඔප්පු නැති ඉඩම් පිළිබඳව සොයා බැලීමක් කරලා ඒවට ප්‍රකාශන ඔප්පු හදලා අපේ අයිතිය තහවුරු කරගත්තා නම් වඩාත් හොඳයි කියලා මම හිතනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මේ නවක මන්ත්‍රීවරයෙක් වන නැගී එන අයෝම මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතා වටිනා යෝජනාවක්. විශේෂිත කාරණා කිහිපයක් තියෙනවා මෙහි සඳහන් නොකළත්. මොකද අපි පොදු පහසුකම් වලට වෙන්කිරීමට ඉස්සර කිව්වා වගේ අපේ උපසභාපතිතුමා කිව්ව කාරණාව. මේකෙ මායිමක්වත් නැහැ. මේක අපි තමුන්නාන්සේලා සැලසුම් කමිටුවට එන්න ඉස්සර මේ මායිම් ටික මාක් කරලා කම්බි ගහලා අඩුගානේ බෝඩ් එකක් ගහනවා නම් මේක සභාව සතු ඉඩමක් කියන එක සැලසුම අනුමත කරන්න ඉස්සෙල්ලා. එතකොට පුළුවන් මේක කරගන්න. හැබැයි ප්‍රශ්නයක් තියෙනවා සභාපතිතුමා මේ වෙන්දේසිකරුවන් ඉඩම් විකුණන්නෙ අනුමත කරන්න ඉස්සෙල්ලා. තමුන්නාන්සේලාට දන්නවා සමහර ගම්වල සංවර්ධනය කර ඉඩම් විකිණීමට තිබේ කිව්වට මිනිස්සු ගිහින් හම්බවෙලා මේ ඉඩම් ගන්නෙ කොහොමද ඇහුවා සල්ලි බැඳලාත් ඉවරයි. සමහරු සල්ල භාගයක් දීලාත් ඉවරයි. හැබැයි ඒ සල්ලි ගෙවනකොට පොදු පහසුකම් කියන ජාතිය ඇවිත් නැහැ. විදුලිය ඇවිත් නැහැ. ජලය ඇවිත් නැහැ. මාර්ග හදලා නැහැ. මේ තත්වය තුළ ගත්ත අය ඊට පස්සෙ එන්නෙ ප්‍රාදේශීය සභාව හොයාගෙන තමයි. ඒ තමයි අපි ප්‍රාදේශීය සභාවෙන් අනුමත ඉඩමක් ගත්තා ඒකෙ ගන්න දෙයක් නෑ. ඒ හින්දා මේ සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කරලා කාර්මික සේවා කමිටුවේදී හරි මේකෙ නිසි වැඩපිළිවෙලක් යොදන්න. මං ඉන්න බල ප්‍රදේශයෙත් මට ඇවිල්ලා කියනවා. එක ගෙයක් හදලා තියෙනවා ලයිට් අරන් දෙන්න කියලා. එක ගෙයයි හදලා තියෙන්නෙ හැබැයි ඉඩම් කට්ටි 10 ක් විතර විකුණලා තියෙනවා. ඒකට ලයිට් අරන් දෙන්න හැකියාවකුත් නැහැ. ඉඩම් වික්ක කෙනා මේකට දායක වෙලාත් නෑ. ඒ නිසා මේක මීට වඩා කමිටුවේදී සාකච්ඡා කරලා යම් වැඩ පිළිවෙලක් සකස් කරගත්තොත් හොඳයි කියලා මම හිතනවා. මේ ඉඩම් කට්ටි වෙන්කිරීම කරන්නෙ ඒ ඉඩමේ ඉන්න අයගේ අයිතියට පමණක්ද? දැන් වෙන්දේසියේ පදිංචි වෙන අයට විතරද මේකෙ අයිතිය? වෙනත් ඒ ගමේ අල්ලපු වැටේ ඉන්න අයට යන්න බැරිද? මේවා ගැටුම් ඇතිවෙන තත්වයන්. අල්ලපු වැටේ ඉන්න මිනිහා ගියොත් ඔන්න කෑ ගහනවා මේකට කොහොමද ඔයා එන්නෙ කියලා. හැබැයි සල්ලි වෙන්කරන්නෙ සභාවෙන් නම් ප්‍රාදේශීය සභාවේ බදු මුදල් වලින් නම් ඒ මිනිස්සුන්ට අයිතියක් නැද්ද මේක පාවිච්චි කරන්න. මේ කාරණාත් මං හිතනවා ඔබතුමන්ලා ඉදිරි කමිටු වලදී සාකච්ඡා කරලා මේ ඇතිවෙලා තියෙන ප්‍රායෝගික ගැටළු වලට වඩා යහපත් විසඳුමක් ලබාදෙයි කියලා මේ යෝජනාව සම්බන්ධයෙන්. ඒ යෝජනාවත් එක්ක මගේ පූර්ණ සහයෝගයත් පල කරනවා අයෝම මන්ත්‍රීතුමාට මේ සම්බන්ධයෙන්. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව ඉතාමත් කාලෝචිතයෝජනාවක් කියලා අපි දකිනවා. විශේෂයෙන්ම අපි පදිංචි අළුත්අම්බලම කලාතුර ලන්ද කියන වෙන්දේසිවත්ත අවුරුදු ගණනාවකට ඉස්සෙල්ලා වෙන්දේසි කළා. ඒ ඉඩමෙන් අක්කර පහක ප්‍රමාණයක් ලයනල් කාරියවසම් මැතිතුමා සභාපතිවෙලා ඉන්න කාලෙ තමයි ඒ ඉඩම වෙන්දේසි කළේ. මෙකේ කොටසක් වෙන් කළා ප්‍රජා කටයුතු සඳහා කියලා. අපිත් ඒකට මැදිහත් වුණා. නමුත් මේ වනවිට වෙන්දේසිකරු විසින් ඒ ඉඩම් කොටස විකුණලා දාලා. ඒක කිසිවෙක් දන්නෙ නැහැ. අද ඒ ඉඩමේ වෙන කෙනෙක් ගෙයක් දොරක් හදලා පදිංචි වෙලා හිටියා ඔහු තවත් කෙනෙකුට ඒ ඉඩම විකුණලා. ඒ නිවාස 50 ක් 60 ක් තියෙන වෙන්දේසිවත්ත තුළ ඔවුන්ට කිසිදෙයක් කරගන්න අඩුගානේ දරුවන්ට සෙල්ලම් කරන්නවත් තැනක් නැති තත්වයට පත්වෙලා. ඒ සඳහා ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකරන්න. විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන්න කියලාත් මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, නවක මන්ත්‍රීවරුනි, මම හිතන්නෙ අපේ සුසන්ත රූපසිංහ මැතිතුමා ප්‍රකාශ කළා වගේ ඒ වෙන්දේසි ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් අපි යම්කිසි කාර්යයකට ගිහිල්ලා අපි අමාරුවේ වැටිලා අපි පරාද වෙලා අපි ලක්ෂ ගාණක් අපතේ යවාගෙන තියෙනවා මං හිතන්නෙ. මොකද අපි සභාපතිතුමාත් එක්ක මැදිහත්වෙලා අළුත්

අම්බලම ක්‍රීඩා පිටියක් සහ ප්‍රජා ශාලාවක් ඉදිකරන්න අපේ සුසන්ත මන්ත්‍රීතුමා එක්ක ලක්ෂ 10 ක් ද කොහෙද ප්‍රතිපාදන වෙන්කළා. ඒ ප්‍රදේශයේ ඉඩම් කට්ටිවල ඉන්න ජනතාව විරුද්ධ වෙලා අපි නීති මාර්ගයට ගියා අපි පරාද වුණා. අපි ලක්ෂ ගණන් අපතේ යවාගෙන තියෙනවා. මං හිතන්නේ 100% ක් එයාලගේ අනුමැතිය නැතිව අපිට යම්කිසි කටයුත්තක් ඒ ඉඩමේ කරන්න බැහැ. අපි බෝඩ් ගහලා සභාව සතු කිව්වාට ඒ ප්‍රදේශයේ මන්ත්‍රීතුමා මැදිහත්වෙලා සංවර්ධනයක් කරන්න බැහැ. ඒ ඉඩම් කට්ටිවල ඉන්න අයගේ 100% ක් කැමැත්ත නැතිව. අපේ සුසන්ත මන්ත්‍රීතුමා කිව්ව වගේ ඒක ඉදිරියට කරගන්න ක්‍රමවේදයක් තියෙනවානම් හොඳයි. නැත්නම් අපි ඕකට මැදිහත් වුණාට ඒ අයගේ අනුමැතියක් නැතිව කිසිම වැඩක් නැහැ එයාලගේ අනුමැතියක් අවසරයක් ඇතුව සහයෝගයෙන් තමයි කරන්න වෙන්නෙ. තවත් පොඩි ඉල්ලීමක් තියෙනවා. විවිධ ප්‍රදේශවල පොඩි පොඩි ඉඩම් කෑලි විකුණලා තියෙනවා අපේ අනුමැතියක් නැතිව. ඒ ඉඩම් අනුමත කරලා දෙන්න කියලා. වෙන්දේසිකරුවන් ඉඩම් විකුණලා ගිහින් ඉවරයි. අළුත්අම්බලමේ තියෙනවා අපේ ඇස්වත්තේ තියෙනවා. අක්කරයට අඩු පොඩි කෑලි. එතකොට ඒ වගේ ප්‍රශ්න එනවා. එහෙම ඉඩම් කෑලි දෙක තුන හරි විකුණනවා නම් කවුරුහරි දැනුවත් කරලා අනුමත කරලා විකුණන්න කියලා. එහෙම වුණාම අපේ අහිංසක මිනිස්සු තමයි අමාරු වැටිලා තියෙන්නේ. ඒ ඉල්ලීමත් කරනවා අපේ මන්ත්‍රීතුමාගේ යෝජනාවට සහයෝගය දක්වමින් ඒ වගේම අපේ ලේකම්තුමා පහුගිය කාලේ සාර්ථක කටයුත්තක් කළා.සුසාන භූමි වල බෝඩ් ටික ගහලා ඉවර කළා. එතුමා ඊළඟට සූදානම් කරලා තිබුනේ වෙන්දේසි ඉඩම්වල බෝඩ් ටික ගහන්න තමයි මම හිතන්නේ. ඊළඟ වතාවේ සියලු වෙන්දේසි ඉඩම්වල අපිට ලැබුණු ඒවා සුද්ධ පවිත්‍ර කරලා බෝඩ් ටික ගහමු. ඒක අපේ සභාපතිතුමාගේ මූලිකත්වයෙන් ඉතා ඉක්මණින් ඉටු කරන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, වේරගොල්ල කොට්ඨාස බල ප්‍රදේශය සම්බන්ධව අයෝම මධු ප්‍රසාද් අපේ මන්ත්‍රීතුමන් ඉදිරිපත් කරපු කාරණාවටම මේකත් එකතු කරන්න පුළුවන්. මේ සියලු කාරණාවලදී අපි දකිනවා වේරගොල්ලේ අපි දැක්කා පොඩි නායයෑමක් වුණා.ඒ කටයුත්ත සංවර්ධනය කරද්දි අපි දුටුවා මමත් දැනගෙන හිටියේ නෑ ඒ වෙනකොට වේරගොල්ලේ එවන් පොදු පහසුකම් ස්ථානයක් තියෙනවා කියලා. ඒ විකුණන ලද ඉඩම් කොටස්වල පර්චස් 22 ක්

හෝ ඊට වැඩි ප්‍රමාණයක් වනගත වෙලා තියෙනවා ප්‍රාදේශීය සභාවට අයිති බව තමයි කිව්වේ. ගරු ලේකම්තුමාට මතක ඇති. අපි අවශ්‍ය කරන පස් ටික ලබාගැනීමේදී ලේකම්තුමා සඳහන් කළා ඒ භූමිය අපිට පාවිච්චි කරන්න බැහැ සභාවට අයිති එකක් නම් කියලා. මම මේ අවස්ථාවේ මතක් කරන්නේ වේරගොල්ලෙත් තියෙනවා අපේ සභාවට අයිති ඉඩම් කියන කාරණාව ඒ පිළිබඳව දන්නවද කියන එකත් වැදගත් වෙනවා. ඒ නිසා මෙන්න මේ ඉඩම් කට්ටිවලට අදාල වන පරිදි එම වේරගොල්ලෙ තියෙන පර්චස් 23 ක් පමණ ප්‍රමාණයක් බව තමයි බලාගන්න ඒ අදාල සමාගමේ මහත්මයා ප්‍රකාශ කරන්නෙ. ඒ අයිතියත් සභාවට ලබාගෙන වේරගොල්ලේ ඉදිකිරීම් කරන්නට අවශ්‍ය වෙනවා මිනිසුන් වෙනුවෙන් ජනතාව වෙනුවෙන්. ඒ සඳහා මේ අවස්ථාවත් උදාකර දෙන්න කියලා ඉල්ලමින් ඒ වගේම විශේෂ අවස්ථාවක් කර ගන්නවා වචන දෙකක් කියන්න ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූති කරන්න. පසුගිය අපේ වේරගොල්ල පාර නාය ගිය අවස්ථාවේදී සභාවෙන් අනුමත වුණු කමිටුවෙන් අනුමත වුණු ආකාරයට තාර බැරල් යොදා එය සංවර්ධනය කිරීම සඳහා දහවල් 2.00 ට පමණ වාහනත් එක්ක පැමිණි ලේකම්තුමාට ආපදා තත්වයක් මතුවුනා ඒ අවස්ථාවේදී වාහන ප්‍රමාද වීම නිසාජේ.සී.බී යන්ත්‍රය. එම මොහොතේදී ලේකම්තුමා එම ස්ථානයට පැමිණ රාත්‍රී 9.00 වෙනකන් එම කටයුත්තේ නියැලුණා. එම නිසා එතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූති කරන්න මෙය අවස්ථාවක් කරගන්නවා. බොහොම ස්තූතියි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුනිල් රණසිංහ මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාවට මම පුංචි එකතු කිරීමක් කරනවා. ඉහත මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේදී පල වුණා සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙන්දේසි වෙච්ච ඉඩම් තුළ ඒ පොදු පහසුකම් සඳහා වෙන් කරපු ඉඩම් කට්ටි නැවතත් අලෙවි කරලා තිබුණා කියලා. ඒ අලෙවි කරපු එකෙන් සීතාවක ප්‍රාදේශීය සභාවට තමයි යම්කිසි අලාභයක් සිදුවන්නේ. ඉතින් මම අදහසක් ප්‍රකාශ කරනවා ඒ වෙන්දේසි හිමියන්ගෙන් නැවත ඒ ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යසරු රාජපක්ෂ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මෙතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් මම ස්තූතිය පුදකරනවා. සීතාවක ප්‍රාදේශීය සභාවේ අපේ අයිතිය තහවුරු කරගැනීම සම්බන්ධයෙන් වෙන්දේසි ඉඩම් තුළ ඒ නාම පුවරු සවි කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් ප්‍රශ්න රාශියක් පවතිනවා. විශේෂයෙන් මතක් කරන්න ඕනෙ මගේ බල ප්‍රදේශය විදියට ගලගෙදර ප්‍රදේශය ඒ වෙන්දේසි ඉඩම්වල ඉස්සර කරපු වෙන්දේසි වලදී කඳු තමයි පොදු පහසුකම් විදියට අරන් තියෙන්නෙ. කඳු තමයි පොදු පහසුකම් ඉඩම විදියට වෙන්කරලා තියෙන්නේ. අපේ චන්දන බාලසූරිය මැතිතුමත් ඒ දවස්වල කතාකළා ඒ සම්බන්ධව ඉඩම වෙන්කරගන්න කියලා. නමුත් විශේෂයෙන්ම දෙකඳුවල පාර වෙන්දේසියේ කන්දෙ තමයි පොදු පහසුකම් ඉඩම තියෙන්නේ. ඇත්තටම ඒ වගේ තැන්වල නාම පුවරු සවිකිරීමත් ගැටළු සහගත තත්වයට පත්වෙනවා. මම මේකට කාරණයක් එක් කරනවා. ඒ කන්දෙ බෝඩ් ගහලා වැඩක් නැහැ. කන්ද කපලා හරි පස් ටික ගොඩ කරලා ඒ සම්බන්ධව පොදු පහසුකම් ඉඩමේ බෝඩ් එක ගහන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම සමහර වෙන්දේසිවල දී ඒත් ගලගෙදරම තමයි පොදු පහසුකම් ඉඩම්වල වගා කරන්න දීලා තියෙනවා. කෙසෙල්, මඤ්ඤොක්කා ආදිය වගා කරන්න දීලා තියෙනවා. ඒවා නිසි අවසරයකින් තොරව දීලා තියෙන්නෙ. එහෙම අවසරයක් දෙන්න බැහැ මම දන්න විදියට. ඉතින් ඒ අවසර දීලා තියෙනවානම් ඒවා ඉවත්කරලා අපිට අපේ අයිතිය ප්‍රාදේශීය සභාව සතු අයිතිය තහවුරු කරගන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වගේම මෙම යෝජනාවට මම තවත් කාරණයක් එක් කරනවා. ප්‍රාදේශීය සභාව සතු ඉඩම් වලට අමතරව සියලුම රජයේ ඉඩම් වලට තමන්ගේ අනන්‍යතාවය තහවුර වන පරිදි අවශ්‍ය නාමපුවරු සවි කරනවානම් හොඳයි කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වගේම මේ වෙන්දේසි ඉඩම්වල සමහර ඉඩම් තියෙනවා ඒවාට අනුමැතිය දුන්නෙ කොහොමද කියාල හිතාගන්නත් බැහැ.

ගලගෙදර ප්‍රදේශයේම තමයි ඒ ප්‍රදේශවලට අපි මැතිවරණ කාලවලදී ගියහම ඒ ප්‍රදේශයේ කාණුවක් වත් දාලා නැහැ. මම දන්න තරමින් ඒ වෙන්දේසි කරන ඉඩමේ පාර අඩි 20 ක් හෝ තාර හෝ කොන්ක්‍රීට් යොදා තියෙන්න ඕනෙ. නමුත් එක වැලි කැටයක්වත් දාලා නැහැ. බොරළු තියෙන ඉඩම්වල තමයි ඒකත් කඳු. කන්දට යන්න තියෙන පාරවලුත් බොරළු සහිත පාරවල් තමයි තියෙන්න. ඒ පිළිබඳවත් මින් ඉදිරියට සොයා බලා වෙන්දේසියට අනුමැතිය ලබාදෙන්න. අපි ගියාම අපිට කියනවා පාර හදලා දෙන්න කියලා. ඉතින් ඔබතුමා මින් ඉදිරියට සැලසුම් කමිටුවේ වාඩි වෙන සභාපතිවරයා විදියට ඔබතුමා විශේෂයෙන් වෙන්දේසි ඉඩම්වල පාරවල් සහ කාණු පද්ධතිය නිසිලෙස සකසා ඉන් පසුව අවසර ලබාදෙන්න කියලා ඉල්ලමින් අයෝම මන්ත්‍රීතුමාගේ යෝජනාවට අපගේඑක්සත් ජාතික නිදහස් සන්ධානය විදියට අපගේ සහයෝගය පල කරන බව ප්‍රකාශ කරනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා</u>

සභාපතිතුමා ප්‍රමුඛ සියලු නිලධාරීන් මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අපි පසුගිය ප්‍රාදේශීය සභා ධූර කාලය තුළ අපි සැලසුම් කරපු ව්‍යාපෘතියක ප්‍රතිඵලත් මේ කතාවත් එක්ක දැනගත හැකිවෙයි. මොකද අපි ඔබතුමාට මතකයි ASP Group බැලුම් ෆැක්ටරිය ඒ ප්‍රදේශයේ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට වෙන්කළා අක්කර තුනයි පර්චස් හැට ගාණක් වගේ මට මතක එදා අපි සූදානම් වුණා මේ අක්කර තුනයි ප්‍රමාණය සීතාවක ප්‍රාදේශීය සභාවේ වගා කටයුත්තකට ඒ වෙලාවේ යෝජනා කළා. නමුත් ඒ කරපු යෝජනාව ක්‍රියාත්මක නොකර ඊට පසුව මම හිතනවා මේක ඉඩම් කට්ටි කඩපු එක පැත්තකට දාලා පස් ජාවාරමකට යෙදුනා. එවෙලේ පරීක්ෂණයක් සඳහා ඔබතුමා මම

අපේ To මිස් සමඟ ගිහිල්ලා මේකට විරුද්ධ වෙලා කතා කරද්දී අර පිස්ටල් එකක් කරකවා හිටපු ඒක භාරදීපු මං හිතන්නෙ චණ්ඩි මහත්තයෙක් වෙන්න ඇති හැබැයි මම මේ කතා කරන්න උත්සාහ කරන්නේ ගරු සභාපතිතුමනි එදා ඒ අක්කර තුනයි පර්චස් ගාන අද තියෙනවද? කියන ප්‍රශ්නෙ මට අහන්න වෙනවා. එදා හිටපු මන්ත්‍රීතුමන්ලා හිටපු සභාපතිතුමා ලේකම් මහත්තයා ඇතුළු අද ඒ අක්කර තුනයි පර්චස් ගානට වෙච්ච දේ මම ගරු නවක මන්ත්‍රීතුමාගේ ශ්‍රේෂ්ඨ යෝජනාවෙන් අපිට ඉතිහාසය සිහිපත් වුණා. ඒ වගේම අද මේ අපේ සුසාන භූමි මායිම් වෙනස් වෙලා විශේෂයෙන්ම කෙළිමඩල සුසාන භූමිය අක්කර දෙකහමාරයි කියන එකයි මම දැනගෙන සිටින්නේ. ඒ වගේම සියලුම සුසාන භූමි කාලයාගේ ඇවෑමෙන් මායිම් වැටවල් වෙනස් වෙලා මේවා කුඩා වෙලා තියෙනවා. විශේෂයෙන්ම මම ඉල්ලන්නේ මේ යෝජනාව යටතේ අපේ සුසාන භූමි අපේ පොදු පහසුකම් ඉඩම් සියල්ල මැනුම් කටයුතු කරලා මේවා ලේඛනගත කරගන්නට පුළුවන් නම් මේ කාල පරිච්ඡේදය තුළවත් සභාවේ සම්පත් විදියට මීළඟට පත්වෙන මන්ත්‍රීවරුන්ටත් මේවායේ යම් නීත්‍යානුකූල සංවර්ධන කටයුත්තක් කරන්න පුළුවන්. ඇත්තටම මම හිතන්නෙ එදා ඒ අක්කර තුනයි ගාණ මේ වෙනකොට පැහැදිලිවම පස් කපලා එක්කො ඉවර ඇති. දැන් ඇත්තේ පස්වලින් උඩින් පොඩ්ඩක් පුරවපු මහා විශාල පර්වත ගලක්. එදා සිද්ධි අධ්‍යයනය කරලා අද තේරුම් ගත්ත මන්ත්‍රීවරු විදියට නිලධාරී විදියට මම ඉතාම ගෞරවයෙන් ඉල්ලන්නෙ අපිට කොතන හරි කට්ටි ඉඩමක් කඩනවානම් පොදු පහසුකම් යටත් පර්චස් 05 ක් ලබාදුන්නත් හොඳම තැනකින් ඒ පර්චස් 5 වෙන් කරගන්න. මොකද අද අපිට ප්‍රජා ශාලාවක් හදාගන්න බැරි ගම්මාන තියෙනවා. ලේකම්තුමා ඒවා ගැන නැවත පරීක්ෂණයක් කරන්න අර අක්කර තුනයි පර්චස් ගානට මොකද වුණේ කියලා. මම සිහිපත් කරනවා අපේ බෝපේ හිටපු ප්‍රේමරත්න මන්ත්‍රීතුමා එතුමා හිටියනම් මේකට තව අදහස් එකතු කරයි මේ සභාව තුළ. ඒ හින්දා මම හිතනවා අපි බොහෝම කඩිනමින් මේවා දිහා බලලා නීත්‍යානුකූලව කටයුතු කරලා විශේෂයෙන්ම සුසාන භූමි ටික ඉස්සරහට නැති වෙනවා. කෙමෙන් කෙමෙන් මේවා විකාශනය වෙනවා අහල පහල ඉඩම් හිමියන්ගේ අවශ්‍යතාවයට. ඒ නිසා මම නැවතත් ස්තුතිවන්ත වෙනවා අපේ නවක ගරු අයෝම මන්ත්‍රීතුමාට. එතුමා ඉතා හොඳ පවිත්‍ර චේතනාවකින් තමයි අද මේ යෝජනාව සභාගත කරලා තියෙන්නෙ. එතුමා ඇතුළු සියලුදෙනාට ස්තුති කරමින් මම නිහඬ වෙනවා.  බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, අපේ අයෝම මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතා හොඳ යෝජනාවක්. අපිට මතකයි අපි ගියවර සභා වාරයේදීත් මෙවැනිම යෝජනාවක් ගෙනාවා. නමුත් ඒ යෝජනාව කොච්චරක් දුරට සාර්ථක වුණාද කියන එක අපිට ගැටළුවක්. මෙම යෝජනාව මේ විදියටම අපේ පොදු පහසුකම් ඉඩම් මැනලා දැන්වීම් ගහන්න අපි යෝජනාව සම්මත කරගත්තා. නමුත් එම යෝජනාව පිළිබඳව අපි සෑහීමකට පත්වුණේ නැහැ ප්‍රතිඵලය ගැන. අයෝම මන්ත්‍රීතුමා දාපු යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. මොකද මම දන්න හැටියට අපිට පෙන්නන්නත් පුළුවන් අපේ ප්‍රාදේශීය සභාව සතු ඉඩම්වල මායිමට සම්බන්ධ වෙලා වෙන්දේසි ඉඩම් මිලදී ගත්ත ඉඩම් හිමියන් විසින් නිරන්තරයෙන් මේවා පොඩ්ඩ පොඩ්ඩ අල්ලගන්නවා. අපි දැනුවත්ව තියෙනවා. ඒ වගේම ප්‍රාදේශීය සභාවට වගකීමක් තියෙනවා වගේම හොඳ ඉඩම් කෑල්ලක් ගන්න හැකියාව තියෙනවා. එම ඉඩම් හිමියාගේ වෙන්දේසිකරුට නිරන්තරයෙන් බලපෑම් කළාම අවශ්‍ය ඉඩම් කෑල්ල අපිට ගන්න පුළුවන්. උදාහරණ වශයෙන් අපේ පරණගම ප්‍රදේශයේ කොස්ගම සිටි සෙන්ටර් කියන ඉඩමේ ඒ ඉඩම් වෙන්දේසි කරනකොට පොදු පහසුකම් ඉඩම ලෙස අපිට දුන්නෙ පොලිසිය පිටිපස්සෙන් ඉතාම දුෂ්කර කෑල්ලක් ප්‍රදේශීය සභාවට දුන්නෙ. නමුත් අපි නිරන්තරයෙන් විරෝධතා කරලා ඉස්සරහින්ම පරණගම පාරට මුහුණලා තවත් කොටසක් ගත්තා. එහෙම කොටසක් අරන් තමයි ඒගොල්ලන්නට COC එක දුන්නෙ. නැත්නම් ඒගොල්ලන්ට ඒක වෙන්දේසි කරන්න බැරි වෙනවා. තව බොල්ලතාවේ වෙන්දේසි කරපු අක්කර එකොළහෙත් එහෙමයි. අපේ මාතෘ සායනයක් පටන් ගන්න කියලා ඒ ඉඩමක් ගත්තා ඒකත් ඒ ඉස්සරහින්ම අපි මේන් රෝඩ් එකට මූණදාලා ප්‍රධාන මාර්ගයෙන් කොටසකුත් පිටුපස්සේ තවත් කොටසකුත් ගත්තා. මේක ලොකු නෛතික වටිනාකමක් තියෙනවා. මේ ඉඩම් මේ විදියට මැනුම් කටයුතු කරලා තිබ්බම මොකද මේ බොල්ලතාව ප්‍රදේශයේ පිහිටි අපේ පිටුපස ඉඩමෙත් දැන් එන්න එන්න අඩුවේගෙන එනවා. ගිහිල්ලා නිරීක්ෂණය කරලා බලන්න. මේක කඩිනමින් කළයුතු දෙයක්. මොකද අපිට දැන් සම්පත් තියෙනවා. අපේ අශෝක වැලිකල මන්ත්‍රීතුමා අපිට

දවසක් කිව්වා ප්‍රාදේශීය සභාවට අවශ්‍ය උපදෙස් එතුමාගේ සහයෝගය ලබාදෙනවා කියලා මිනින්දෝරුවෙක් හැටියට. හොඳ පළපුරුදු මන්ත්‍රීවරයෙක්. එතුමාගේ සහයෝගය නිරන්තරයෙන් ගන්න පුළුවන් කියන එක බවත් මතක් කරමින් හැකි ඉක්මණින් අපේ මේ සභාව කාලය තුළ මේ කටයුත්ත නිම කරන්න ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමිය.</u>**

ගරු සභාපතිතුමනි, මේ අයෝම මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. එසේම එස්.ඒ. ප්‍රේමරත්න මන්ත්‍රීතුමා ගෙනාවා සුසාන භූමි පිළිබඳව. දිද්දෙණිය සුසාන භූමිය පිළිබඳවත් යම් ගැටළුවක් තියෙනවා. මම ඔබතුමාට ලිඛිතවත් දැනුම් දීමක් කරලා තියෙනවා. ඒකෙ අනවසර ගෙවල් වගයක් හදලා තියෙනවා. ඒ ගමේ පදිංචිකරුවන්මයි ඒ ගෙවල් ටික හදලා තියෙන්නෙ. නමුත් දැන් ස්ටෝර්ස් එකකට කියලා වෙනම ස්ටෝර්ස් එකක් හදාගෙන තියෙනවා. ඒකනම් සුසාන භූමියේ නෙමෙයි සුසාන භූමිය මැද්දෙන් යන්න පාරක් හදාගෙන තියෙනවා. ඒක මම හිතනවා නීත්‍යානුකූල නැහැ කියලා. ඒ පිළිබඳව හොයලා බලලා තියෙන ඉඩම් ප්‍රමාණය මැනලා ඒ පාර ඉවත් කරලා දෙන්නම ඕනෙ සභාපතිතුමනි. තියෙන ඉඩම් ප්‍රමාණය මැනලා අපිට ඒ සඳහා අවශ්‍ය කටයුතු යොදලා දෙන්න කියලා මම මේ වෙලාවේ බැගෑපත්ව ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, අයෝම මධු ප්‍රසාද් මන්ත්‍රීවරයාගේ යෝජනාව කාලෝචිත යෝජනාවක් විදියට අපි දකිනවා. නමුත් අපේ මංජුල වීරරත්න මන්ත්‍රීතුමා කිව්වා වගේ යෝජනාවක් විදියට එන්න අවශ්‍ය නැහැ. මේක මතක් කිරීමක් වශයෙන් ආපු එක ගැන අපි ඒ යෝජනාව ගෙනාපු මන්ත්‍රීවරයාට අපේ ස්තූතිය මුලින්ම පුද කරන්න කැමතියි. මොකද

ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශයක වෙන්දේසි ඉඩමක් වෙන්දේසි කරනකොට පොදු පහසුකම් වලට අනිවාර්යයෙන්ම කොටසක් අයින් කරනවා. ඒක නීත්‍යානුකූල විදියට සභාවට වෙන් කරනවා. ඒවායේ අපේ වැඩ කටයුතු ටික වැඩ අධිකාරිතුමිය තාක්ෂණ නිලධාරින් අපේ නිලධාරින් බලලා තමයි අනුමත කරන්නේ. ඒ වගේම ඒ අවශ්‍ය නිර්නායක අනුව අනුමත කරලා දෙන්නෙ. ඉතින් ඒ අයිතිය සභාපතිතුමාට ලේකම්තුමාට ඕනෙ වෙලාවක ගිහිල්ලා මැනුම් නිලධාරීන් එක්ක මේ වැඩේ කරන්න පුළුවන්. මූලික බිම් කට්ටි කඩනකොටම ඒ මායිම් සලකුණු කරලාත් පෙන්නනවා. ඉතින් ඒ අවස්ථාවලදී අපි දකිනවා මෙතෙක් හිටපු සභාපතිවරු ගත්ත ඉඩම් කොටස් පිළිබඳව සෑහීමකට පත්වෙන්න අමාරුයි. හැමෝමත් නෙමෙයි. කම්ටුවමත් නෙමෙයි මම කීපයක් කියන්නම්. මගේ කුඩළුවිල වසම අංක 444 ෆැන්ටසිවෙන්දේසි ඉඩමමෑත කාලයේදී වෙන්දේසි උන ඉඩමක් ඒ ඉඩමෙ අරගෙන තියෙන්න පොඩි වැස්සක් වැස්සත් යටවෙන කොටසක්. ඉතාමත් බෑවුමක් සහිත කොටසක් බරාව රක්ෂිතයට මායිම් කොටසක්. මේක තමයි ඒ ඉඩමෙ අපිට හම්බෙලා තියෙන කොටස. ඒ වගේම සෞභාග්‍යපුර කියලා ඊට එහා ඉඩම් කොටස. ජයවීරගොඩ මාර්ගයේ, සෞභාග්‍ය උතුරනවා එක වැස්සකදී ප්‍රධාන පාරත් එක්ක මුළු පළාතම යට වෙනවා. ඒකට මම හිතන්නෙ යම්කිසි සැලසුම් දීලා තිබුනට සැලසුම් ඒ විදියට ක්‍රියාත්මක කරලා නැහැ. කෙසේ හෝ ඉඩම් අනුමත වෙලා තියෙනවා. අඩියක කාණුවකින් යන ඒ වතුර කන්දරාව කොහොම ගෙනියන්නද කියලා හිතාගන්න බැහැ. ඉතාම ගැටළු සහගත අඩි 2 ½ ක කාණුවකින්වත් බස්සන්න පුළුවන් වතුර පාරක් නෙමෙයි යන්නෙ. ඉඩම වෙන්දේසි කරන මැද ලොකු වතුර වළක් වතුර එක්රැස් කරන ස්ථානයක් හදලා තියෙනවා නමුත් ඒ ස්ථානයට වතුර පාර ගෙනියන ක්‍රමවේදය හරියට සකස් කරලා නැහැ.. මං හිතන්නෙ අපේ නිලධාරීන්ගේ වරදක් නෙමෙයි. නිලධාරීන් හරියට උපදෙස් දෙන්න ඇති. ඒවා හරියට ක්‍රියාත්මක කරලා නැති එක තමයි මම දකින්නෙ. නමුත් අන්තිමට කොහොමහරි අනුමත කරද්දි ඒ නිලධාරීන් විරුද්ධ නොවිච්ච එකේ වගකීම ඒ නිලධාරීන්ට සභාවට ගන්න වෙනවා. ඒ නිසා ඉතාමත් වගකීමෙන් කියනවා ඉතාම ගැටළු සහගත තත්වයක්. ඒ තත්වය ඉතා ඉක්මණින් සොයා බලන්න කියලා. ඒ එක්කම අපේ පොදු පහසුකම් කොටස. ඒ වගේම බරාව රක්ෂිතයට ආසන්න කොටස. කෙළවරක කොටසක් තමයි

තියෙන්නෙ. ඉඩම සම්පූර්ණ කෙළවරේ. ඒ වගේම රීළඟ වසම. රීරියගොල්ල හරිත උයන පොදු පහසුකම් කොටස. මමත් ලක්ෂ 20 ක පමණ ප්‍රතිපාදන එහෙම ගෙනල්ලා සංවර්ධනය කරන්න තවත් ලක්ෂ 50 ක් පමණ ඕනෙ හදන්න. අඩි 50 ක 60 ක පමණ බැවුමක්. මුත්තස්ස. ඇල වෙල් යායේ මායිමේ. පොල් ගහේ කරටිල්ල පේනවා බිම ඉඳන් බැලුවම. උඩ අපිට වෙන් කරලා තියෙන්න පොදු පහසුකම් ඉඩම. ඉතින් ඒ නිසා ඒ වගේ තැන් ගන්නෙ කුමන හේතුවක් නිසාද කියන එක විශාල ගැටළු සහගත තත්වයන් ඇතිවෙනවා. ඒ වගේම මම ඔබතුමාට මතක් කරන්නම් අපේ හංවැල්ල නගරය ඒකට විශාල ගැටළු සහගත තත්වයක් ඇති වුණා ඔබතුමාට මතක ඇති එහි රද්දැල්ල මහත්තයා විසින් ගල් කොරියක් කළා. මේක අනුමත කරලා දීම ප්‍රශ්නාවලික් මතු වුණා. ඔබතුමා ප්‍රශ්නාවලිය සභාවට දැම්මෙ නෑ. මම කිහිප සැරයක් ඔබතුමාගෙන් ඇහුවම එක සැරයක් සභාවට දැම්මා. තුන්වෙනි සැරේ දැම්මා. ඒකට අවශ්‍ය පිළිතුරු ලබාදීමේදී යම් යම් දෝෂ ඇතිවුණා. මොකද මම එතකොට ඉල්ලුවා මේකෙ පොදු පහසුකම් කොටස කොතනද තියෙන්නෙ කියලා. ස්ථානයක් නැහැ. මේක නේවාසික භාවිතයට අනුමත කරලා ව්‍යාපාරයක් කළේ. ඒ ව්‍යාපාරය අනුමත කරලා තිබුණේ නෑ ඒ වෙනකොටත්. ඒ එක්කම අපේ මුළු පොදු පහසුකම් කෑල්ලත් කොටු කරගෙන තාමත් එහෙමයි. දැන් ගියත් බලන්න පුළුවන් ගල්කොරියේ වැඩ අවසන් කරලා තියෙනවා. නමුත් තවම අමානෝ ෂීට් වලින් ප්‍රදේශය වට කරගෙන මං හිතන්නෙ අපේ සභාවේ සේවකයෙකුටවත් වැඩ අධිකාරිතුමියටවත් ලේකම්තුමාටවත් දැන් එතන්ට යන්න බැහැ. අපේ භූමියට ඇතුල්වෙන්න බැහැ. අඩුගානෙ මන්ත්‍රීවරයෙක් ගියත් මම පුදුම වෙනවා යන්න බැහැ. ගේට්ටු දාලා වහලා අපේ පොදු පහසුකම් කොටසත් වෙන්කරගෙන භුක්ති වින්දා මෙච්චර කල්. කවුරුවත් සතපහක ආදායමක් දුන්නෙ නෑ අපේ ඉඩමට. අපේ ඉඩමේ. ඉතින් ඒ සම්බන්ධව අපිට යුතුකමක් හා වගකීමක් තියෙනවා මන්ත්‍රීවරු හැටියට සභාවේ දේපල ආරක්ෂා කරගන්න. ඒ නිසා ඒ සම්බන්ධ ගැටලුවලදී කතා කරන්න. ඒ කාලෙ කතා කරද්දි හරියට උත්තර දුන්නේ නෑ කියන හැඟීම අපි තුළ තියෙනවා. ඒ නිසා සභාපතිතුමා කෙසේ හෝ ඒ ගැටලුව තියෙනවා. මං හිතන්නෙ සභාපතිතුමා ගිය වාරයට වඩා වෙනසක් කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා යම්කිසි පාලනයේ. ඒ නිසා ඒ තීන්දු තීරණ ටිකක් යහපත්ව හිතලා මේ සභාවේ දේපල ආරක්ෂා කරගැනීමට අයෝම මන්ත්‍රීවරයා ගෙනාපු යෝජනාව හරහාම ඔබගේ සහයෝගය ලැබෙයි කියලා බලාපොරොත්තු වෙනවා. මොකද අපිට ඉතාම අමිහිරි අත්දැකීම් තවත් තියෙනවා. චන්දන බාලසූරිය මන්ත්‍රීතුමා හිටියනම් අපේ දඹොර පොදු පහසුකම් සුසාන භූමිය එකේදි ගැටළුවක් ඇතිවුණා පාරක් දෙන්න ගිය වෙලාවකදී. අපි ඒකට කතා කරපු අවස්ථාවක වතුර වීදුරුවක් දුර දිග යන්නත් උසාවි යන්නත් තරමට ප්‍රශ්නෙ දුරදිග ගියා. ඉතින් අද වතුර බෝතලය ඇවිත් තියෙනවා වීදුරුව අයින් වෙලා ඒ අවස්ථාව අනුව තමයි. ගරු සභාපතිතුමනි, ඒ අමිහිරි අත්දැකීම් මතක් කරනවා නෙමෙයි. ඒ වෙච්ච අඩුපාඩුකම් හදාගන්න කාලය ඇවිල්ලා තියෙනවා. ඔබතුමා ඉදිරියේදී අපේ දේපල ආරක්ෂා කරගන්න ඔබතුමාගේ කැපවීම ශක්තිය මන්ත්‍රීවරුන් එකමුතුවෙන් ලැබෙයි කියන පරමාර්ථය ඇතිව අයෝම මන්ත්‍රීතුමාගේ ඒ යෝජනාවට සහයෝගය පලකරමින් ඒ වැඩකටයුතු අද සිට ආරම්භ කරන්න වැඩ පිළිවෙලක් සකස් කරන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව ස්ථිර කරපු අපේ අශෝක වැලිකල මන්ත්‍රීතුමා ඇතුළු උප සභාපතිතුමාට වගේම සියලුම මන්ත්‍රීවරුන්ට මාගේ ස්තූතිය පුදකරනවා. මොකද නවක මන්ත්‍රීවරයෙක් විදියට අපි මන්ත්‍රීවරු නොවුණත් දේශපාලනයේ නියැලිලා ඉන්න කාලයේ මේ අත්දැකීමට මුහුණ පෑවා මං හිතන්නේ ලේකම්තුමාත් දන්නවා පාදුක්ක විශේෂයෙන්ම ජයන්ති මාවත ප්‍රදේශයේ අද වනවිට ඒ පොදු පහසුකම් කොටස පෞද්ගලික පුද්ගලයන් විසින් අත්පත් කරගෙන ඒ කොටසට ඇතුළුවීම පවා ඉතා අසීරු වෙලා තියෙනවා. ලේකම්තුමාගේ පාලන කාලයේ ඒ කොටස සුද්ධ කරන්න ගිහිල්ලා විශාල ප්‍රශ්නයකට පවා ලේකම්තුමාට මැදිහත් වෙන්න සිද්ධ වුණා. ඒ නිසා අපි ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා මේ යෝජනාව යෝජනාවක් පමණක් නොකර මේ කටයුත්ත හැකි ඉක්මනින් ඉටුකරලා දීලා මේ පොදු පහසුකම් කොටස් මං හිතන්නෙ අපි මන්ත්‍රීවරු විදියට තව වසර හතරකින් තවත් පුද්ගලයෙක් මෙතෙන්ට එන්න පුළුවන්. ඒ ආවත් කවදාහරි සීතාවක ප්‍රාදේශීය සභාවට අයිති අපේ ප්‍රාදේශීය සභාවට අයිතියක් තියෙන ඒ ඉඩකඩම්

සහ ඒ දේපල ටික ආරක්ෂා කරගෙන මේ ප්‍රාදේශීය සභාවේ මින් ඉදිරියට පැමිණෙන කවුරුන් හෝ පැමිණෙයි. ඒ සියලුදෙනාට ශක්තීන් එකතු කරලා ඒ කටයුතු කරන්න පොදු පහසුකම් යටතේ ලොකු වැඩ කොටසක් ඒ ඉඩම්වල කරන්න අවස්ථාව ලබාගන්න පුළුවන් වෙයි කියලා ඒ සියලු සංශෝධන එකතු කරලා මං හිතනවා මේ යෝජනාවට පක්ෂව කතා කරපු සියලුදෙනාටම මගේ ගෞරවනීය ස්තූතියත් පුදකරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

<u>ගරු සභාපතිතුමා</u>

බොහොම ස්තූතියි ගරු මන්ත්‍රීතුමන්ලාට ඒ සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳව. ඒ යෝජනාව පිළිබඳව අපිත් සතුටුවෙනවා. මොකද අපේ පහුගිය සභාවාර කාල සීමාවෙ තමයි මේ කටයුත්ත අපි ආරම්භ කළේ. ඉඩම් මැනුම් කටයුතු ආරම්භ කළා. කනතු 18 ක් වගේ ප්‍රමාණයක් අපි මැනලා අපි ඔප්පු හදාගත්තා. තවත් තියෙනවා. ඒවා පහුගිය කාලේත් යම් ප්‍රමාණයකට ක්‍රියාත්මක වුණා.. අපි උත්සාහ කරනවා ආපහු නැවත වතාවක් ඒ කටයුත්ත ආරම්භ කරලා අපි කාර්මික සේවා කමිටුවේදීත් මේ පිළිබඳව සාකච්ඡා කලා. ඒ අනුව අපිට තියෙන පොදු පහසුකම් ඉඩම් සහ අපේ කනතු සම්බන්ධව අවශ්‍ය අයිතිය ලබාගැනීම සඳහා වන වැඩ පිළිවෙලක් සකස් කරන්න ඒ අනුව අපි කටයුතු කරනවා. ඒ නිසා මේ ගැන දීර්ඝව කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. පොදු පහසුකම් ඉඩම් ලබාගැනීමේදී යම් යම් තැන්වල ප්‍රශ්න මතුවෙලා තියෙනවා. ඒවා පහුගිය කාලෙත් උනා. අතීතයේදීත් වෙලා තියෙනවා. ඒවත් හරියාකාරව විසඳාගෙන ඉදිරියට ගමන් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. පහුගිය කාලසීමාවේ බොහෝදුරට උත්සාහ කළා එවැනි අපිට වැදගත් වන ඉඩම් කැල්ලක් ගන්න. අපි අරගත්තා. අරගන්න බැරිවෙච්ච තැන් තියෙන්නත් ඇති. ඒ කොහොම උනත් අපි අනාගතයේදී උත්සාහ කරනවා. අපි පහුගිය කාලෙත්

උත්සාහ කළා ඊයෙ පෙරේදා විශාල ඉඩමක් වෙන්දේසි වෙනවා. අපි එතනට ගිහිල්ලා බැලුවා ඒ ඉඩම් කොටස තියෙන තැන ගැන අපි සතුටු උනේ නැහැ. අපි ඒ අයට කතා කරලා ඒ ගැන මතක් කළා. නාගරික සංවර්ධන අධිකාරිය සමඟත් කතා කරලා සභාවට හොඳ ඉඩම් කොටසක් ලබාගැනීම සඳහා වන සටනේ අපි ඉන්නවයි කියන කාරණය මම මතක් කරන්නට ඕනෙ. ඒ නිසා මෙවැනි යෝජනා ඉදිරිපත් වීම සභාව පැත්තෙන් අපිට වඩා හොඳයි. මංජුල මන්ත්‍රීතුමා මොනව කිව්වත් මේක ඕන නැහැ කියලා කතා වුණහම කොච්චර හොඳ දේවල් සභාවට ලබාගන්න එනවද කියන කාරණය පිළිබඳව සභාවට අයිති දේවල් පිළිබඳව ඒ නිසා ඔබතුමා සභාවට අයිති නැති දේවල් කතා කරනවා කියලා සභාවට අයිති දෙයක් කතාකළේ. ඒ නිසා අපි විශ්වාස කරනවා එවැනි යෝජනා එන එක හොඳයි අදහස් ප්‍රකාශ කරන එක හොඳයි. පක්ෂ විපක්ෂව අපිට ඒවයින් දේවල් ඉගෙන ගන්න පුළුවන්. හංවැල්ල නගරය පිළිබඳවත් පොඩි ප්‍රශ්න තිබ්බා. ඒවා විසඳගෙන දැන් අපේ වැඩකටයුතු කරන්න පුළුවන්. ඒ නිසා වෙන්දේසි කරන්නේ නැතුව වෙන්දේසි ඉඩමේ ඒ කිව්ව විදිහට පටන් ගත්තා. ඒ නිසා ඉඩම වෙන්දේසි උනේ නෑ ඒ වෙලාවෙ. වෙන්දේසි කරලා තිබුනෙ නැහැ. කැල්ලක්වත් විකිණිලා තිබුනේ නැහැ. එහෙම ප්‍රශ්න තිබුණා. මම පිළිගන්නවා. ඒ නිසා ඒවා විසඳගෙන අපි ඉස්සරහට ගමන් කරන්නට කටයුතු කරන බව මතක් කරන්න ඕනෙ. මීට වඩා දීර්ඝව මම කතා කරන්නෙ නැහැ. මං හිතනවා මේ යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නැහැ හැමෝම මේ යෝජනාවට එකඟයි අදහස් දැක්වීම අනුව. මේ සඳහා බෙදීමක් කවුරුවත් ඉල්ලන්නෙ නැහැ නේද ගරු මන්ත්‍රීතුමන්ලා. එහෙනම් මේ යෝජනාව ඒකමතිකව සභා සම්මත යෝජනාවක් විදියට අපි සලකනවා.

**<u>ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

**<u>පෙ.ව. 11.45 ට තේ පානය සඳහා සභාවේ වැඩ කටයුතු අත්හිටුවන ලදී. ප.ව. 12.05 ට නැවතත් මහා සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.</u>**

**05 - (02) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සභාව සතු මාර්ග දෙපස එළිපෙහෙලි කිරීම කාණු කපා ස්වාභාවිකජල බැස්ම යථා පරිදි පවත්වාගෙන යාම හා මාර්ග අලුත්වැඩියා කිරීම සඳහා සකස් කර මේ සමග ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති වාර්තාව පිළිගෙන ඒ අනුව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමනි,ඒ එක්කම සඳහන් කරන්නට ඕනෙ කොළඹ දිස්ත්‍රික්කයේ තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් මේ තියෙන මේ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අපේ මේ වනවිට පවතින මාර්ග පද්ධතිය ඉතාමත් දැඩිලෙස අබලන් තත්වයට පත්වෙලා තමයි තියෙන්නෙ. ඒ නිසා මේ වැඩ ඒකකය ස්ථාපිත කිරීම ඉතාමත් වැදගත් යෝජනාවක් හැටියට අපි දකිනවා. මොකද මේ ව්‍යාපෘතිය හරහා අපේ මාර්ග පද්ධතිය අඛණ්ඩව නඩත්තු කිරීමකට ලක්කරලා අපේ ප්‍රාදේශීය සභාව සතු මාර්ග පද්ධතිය ආරක්ෂා කරගැනීමට මෙම ක්‍රියාවලිය ඉවහල් වෙයි කියලා අපි අපේක්ෂා කරනවා. මොකද අපිට මතකයි පසුගිය ආරම්භක සභාවේ සභාපති ලෙස කටයුතු කළ ගරු ලයනල් කාරියවසම් මැතිතුමාගේ කාලයේ මෙවැනි ව්‍යාපෘති හරහා වැඩ සති නිර්මාණය කරලා එක් එක් ප්‍රදේශ ආවරණය වන විදියට මෙම සංවර්ධන කටයුත්ත ඉදිරියට ගෙනයන්න කටයුතු කළා. ඒ නිසා අපි අදහසක් හැටියටත් ඉදිරිපත් කරනවා මේ ව්‍යාපෘතියත් එක්ක ඉදිරියට කොට්ඨාස මට්ටමින් යම්කිසි දිනයක් හෝ දින දෙකක් වගේ කාලයක් අරගෙන සංවර්ධන කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙනයන්න කොට්ඨාශ මට්ටමින් වැඩ පිළිවෙලක් සකස් කරලා මේ මාර්ග පද්ධතිය ඒ වගේම අනිකුත් කටයුතු සියල්ල එකවර ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනක් විදියට යන්නට හැකිනම් ඒක ඉතාමත් වැදගත් කියලා ඒ නිසා මේ ඔබතුමා ගෙනාපු යෝජනාවට අපේ සහයෝගය පල කරමින් මේ යෝජනාව ස්ථිර කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා

ගරු සභාපතිතුමනි, සභාපතිතුමා විසින් ගෙනෙන ලද මේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක්. මොකද පසුගිය කාලෙ වසර දෙකයි මාස 08 ක් තිස්සෙ ප්‍රාදේශීය සභාව ස්ථාපිත වෙලා නැති කාලේ ලේකම්තුමාට පුළුවන් ආකාරයට මාර්ග පද්ධතිවලට යොමුකළත් නමුත් අද වෙනකොට අපි කොට්ඨාස මන්ත්‍රීවරු හැටියට කොට්ඨාසය පුරාම තියෙන විශාල අඩුපාඩු රැසක් දැනගෙන තියෙනවා. මොකද ඒ කාලේ ලේකම්තුමා පරිපාලනය නිසියාකාරව ගෙනිච්චා. මේ මාර්ග නිසි පරිදි ගෙනියන්න විදියක් නැහැ එතුමාට මොකද මන්ත්‍රීවරුන්ගේ යෝජනා නැති නිසා. ඒ නිසා විශාල වශයෙන් මේ කාලය තුළ පාරවල් දැඩිලෙස අබලන් වෙලා තියෙනවා. කාණු පද්ධති ඒ වගේම විශාල වලවල් හැරිලා ඒ නිසා මෙම යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. ඒ වගේම ගියවර සභාව අවසාන කාලය වනවිට ඔබට මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් ආකාරයට සම්පත් ලැබුණා. අපේ ආණ්ඩුවේ අග භාගය වනවිට මේ මැෂින් ටික ඇවිල්ලා තිබ්බා අපේ මෝටර් ග්‍රේඩරයක්, ඒ වගේම බැකෝ යන්ත්‍රය, ගල් රෝල, ට්‍රැක්ටර්, කම්පැක්ටර් ආදිය නමුත් ඒවා පරිහරණය කරන්න අපේ කාලේ බැරි වුණා. ඒ නිසා මේවා නිසිලෙස ප්‍රයෝජනයට ගන්න හැකියාව තියෙනවා මේ යෝජනාව තුළින්. ඉතින් හොඳ යෝජනාවක් හැටියට මම දකිනවා. මේ ව්‍යාපෘතිය කඩිනමින් ස්ථාපිත කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින් මේ යෝජනාවට සහයෝගය පල කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලි මැතිනිය

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාවට තවත් යෝජනාවක් එකතු කරන්න මම කැමතියි. මේ මාර්ග අළුත්වැඩියා කරලා කාණු පද්ධතිය හදලා ස්වභාවික ජලය ගලා යන්න සැලැස්සුවාට ස්වභාවික ජලයම ද ගලා යන්නෙ කියන

ප්‍රශ්නය තියෙනවා. ගෙවල්වල තියෙන කුණු අපද්‍රව්‍ය ඒ වගේම අපවිත්‍ර ජලය යොදනවා. මේ ගැනත් අවධානය යොමු කරලා මේ ස්වභාවික ජලය පමණක් බැස යන්න ප්‍රතිපත්තිමය බෝඩ් ලැල්ලක් සවි කරනවා නම් හොඳයි කියන යෝජනාවත් මම ගේන ගමන්ම මේ පාර දෙපස ගෙවල් වලින් මල් ගස් පාර දිගේ වවනවා. ඒ ගැනත් අවධානය යොමු කරලා මහ ජනතාවට පාර නිරාකරණය කරලා දෙන්න කියන ඉල්ලීම ඉල්ලනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, 5 - (02) යෝජනාව ලෙස ඉදිරිපත් කරන යෝජනාව සාරාංශය ගත්තම ඇත්තටම හොඳ යෝජනාවක්. සිදුවිය යුතු යෝජනාවක්. නමුත් මේ ව්‍යාපෘතියත් එක්ක බලනකොට මේ යෝජනාව මේ අවස්ථාවේ මේ සභාවේ ක්‍රියාත්මක කරන්න තියෙන හැකියාව පිළිබඳව සොයා බැලීමට අවශ්‍ය වෙනවා මම හිතන්නෙ. මොකද විශාල පිරිවැයක් අපිට දරන්න සිදුවෙනවා. මොකද මම හිතනවා 84 ක විතර ප්‍රමාණයක් කම්කරුවෝ අපිට ඉන්නවා සභාව සතුව. නමුත් ඒක හරි කළමනාකරණයක් අපි කරගත්තොත් තවත් අමතර කම්කරුවන් බඳවා ගැනීමකින් තොරව මේ ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමේ හැකියාව තියෙනවා කියන විශ්වාසය මා තුළ තියෙනවා. මොකද වර්ෂයකට ලක්ෂ 49 යි 20,000 ක මුදලක් අපි මේ ව්‍යාපෘතිය වෙනුවෙන් ගෙවන්න බලාපොරොත්තු වෙනවා. මේ සභා අරමුදල්. මේ ප්‍රදේශයට වැඩ කරන්න තියෙන. මේක ඉතුරු කරගෙන කරන්න ඔබතුමාට හැකියාව තියෙද්දී මේ මුදල නාස්ති වෙයි කියන හැඟීම මා තුළ තියෙනවා. මොකද ඒ මුදල ඉතුරු කරගත්තොත් අපිට මං හිතනවා අපේ ඉන්න සේවකයෝ ප්‍රමාණය අපිට සෑහීමට පත්වෙන්න පුළුවන් ප්‍රාදේශීය සභාවක් විදියට. ප්‍රදේශය විශාලයි. උප කාර්යාල තුනක් තියෙනවා. නමුත් අපේ සේවය කොඩි කණු සිටුවීමට පමණක් අපේ කම්කරු වැඩි කාලයක් ගිය කාල වලදී අපි දැක්කා කොඩි කණු හිටවනවා. ඒ වගේ උත්සව වලට විශාල කම්කරුවෝ පිරිසක් යොදවපු අවස්ථා තිබුණා. අපි ඒක අවම කරලා මේ කැඩිච්චි පාරක් ප්‍රිමික්ස් කරගන්න ඒ වගේම දෙපැත්ත යන්න බැරි පාරවල් තියෙනවා මම දැක්කා සුදුවැල්ලෙ ටෙස්ටා එක ඉස්සරහ පාරෙ මං හිතන්නේ ප්‍රදේශවාසීන් එකතුවෙලා සුද්ධ කළේ. වාහනයකට තියා ත්‍රීවිල් එකකට යන්න බැරි අඩි 10 පාරක් ඒ තරමම කැලෑව වැවිලා සභාවක තියෙන මූලික යුතුකම හා වගකීම වෙනවා පාරවල් දෙපැත්ත සුද්ධ කරන දේවල් කරන්න කම්කරුවෝ විදියට. ඉස්සර අපි දකිනවා දැන් RDA එකෙන් නම් ඒ කටයුතු සිද්ධ වෙනවා අපි දකිනවා. සභාවක සිදුවෙන ප්‍රාදේශීය සභාවේ ඒක පසුගිය කාලේ අඩපණ වුණා. ඉතින් ඒ පැත්ත ඔබතුමා දැකලා ඒ ගැන අවබෝධයක් ඇතුව තමයි මේ ව්‍යාපෘතිය කරන්න ඕනෙ කියන හැඟීම එන්න ඇත්තෙ. ඒකෙ කිසිම වරදක් නෑ. ඒක වියයුතු දෙයක්. නමුත් ගරු සභාපතිතුමනි, පුළුවන්නම් දෙවරක් හිතන්න කියලා ඉල්ලනවා. මාස හයකට දීර්ඝ කරන්න යෝජනාව කල් දැම්මත් කමක් නැහැ. මොකද අපි ඉස්සෙල්ලාම අත්හදා බලමු අපි ඉන්න අයගෙන් මේක කරගන්න පුළුවන්ද කියලා. එහෙම උනොතින් අපිට මුදලක් ඉතුරු කරගන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට හරි වැඩකරන්න සල්ලියක් ඉතුරු වෙයි. අපිට මුදල් ගෙවන්න තියෙනවා. මේ ගොඩනැගිලි වලට ගෙවන්න තියෙනවා. අපි විශාල මුදලක් තාම ණයයි. ඒවා තාම ගෙවාගෙන යන මට්ටමක අපි ඉන්නැද්දි මෙහෙම තවත් මුදල් නාස්ති කරන විදියට වැඩක් කළොත් අපි තියෙන සම්පත් කළමනාකරණය කරගන්නෙ නැතුව ඒක ඉතාමත් අනාගතයේදී වර්තමානයේදී විශාල ගැටළු වලට මුහුණපාන්න අවස්ථාව තියෙන විදියට අපි දකිනවා. ඒ නිසා සභාව හරිමඟ ගෙනියන්න ඔබතුමාට අපේ වචන ස්වල්පයක් භාවිතා කරමින් ඒ අදහස උපයෝගි කරගෙන කටයුතු කරන්න උත්සාහ කරයි කියන හැඟීම තියෙනවා. ඒක ඔබතුමාගේ යෝජනාවට විරුද්ධවීමක් නෙමෙයි. අදහස් දක්වන්නේ සභාවේ මුදල් හා පරිපාලනය තවත් ක්‍රමවත් කරගන්න පමණයි. ඒනිසා දෙවරක් සිතන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය මින් නිමා කරනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මං හිතන්නෙ ඔබතුමා මේ ගෙන එන යෝජනාව ඉතාමත්ම කාලෝචිතයි කියලා මා විශ්වාස කරනවා. ඒ වගේම මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මේ යෝජනාව පිළිබඳව අපගේ ගෞරවය ප්‍රණාමය පුද කරනවා. මොකද අපේ ගයාන් දුමින්ද මන්ත්‍රීවරයා කියනවා මේක මාස 06 කට කල්දාන්න කියලා. මං

ඒක සම්බන්ධව සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙනවා. මොකද අපි දන්නවා අපේ බල ප්‍රදේශය පාදුක්ක සහ සීතාවක බල ප්‍රදේශය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වර්ග කි.මී. 208.3 ක භූමි බල ප්‍රදේශයක් තමයි තියෙන්නෙ. ඉතාමත් විශාල අපේ ප්‍රාදේශීය සභාව සතු පුළුල් මාර්ග හා කාණු පද්ධති තිබෙනවා. ඒ නිසා මේවා සංවර්ධනය කිරීමට පෞද්ගලිකව මන්ත්‍රීවරුන් හැටියට අපිට ලැබෙන ප්‍රතිපාදන ඉතාමත් සොච්චම් මුදලක් තමයි ලැබෙන්නෙ මේ සභාවෙන්. ඒ නිසාවෙන් අපිට විකල්පයක් හැටියට මෙය උපයෝගී කරගන්න අපිට හැකියාව ලැබෙනවා. ඒ තුළ අපේ ප්‍රදේශය තුළ අපේ කොට්ඨාසය තුළ කිසියම් වූ ප්‍රමාණයකට මේ ව්‍යාපෘතිය හරහා මේ වැඩ ඒකකය හරහා අපගේ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න වලට කිසියම් වූ විසඳුමක් ලැබෙනවා කියන මගේ පෞද්ගලික අදහසයි. ඒ වගේම අපි දන්නවා මේ සභාවේ පසුගිය කාලේ ක්‍රමවේදය තමයි යම්කිසි ව්‍යාපෘතියක් සහා කර්මාන්තයක් ගමක් තුළ ක්‍රියාත්මක කිරිමේදී එය එක්කො ගමේ සමිතියකට දෙනවා. එහෙම නැත්නම් ටෙන්ඩර් කරලා දෙනවා. ඒක තමයි සාමාන්‍ය ක්‍රමවේදය. හැබැයි ඒ තුළ අපි දකිනවා උදාහරණයක් විදියට කියමුකෝ ගමේ සමිතියකට මේ ව්‍යාපෘතිය ලබාදීමේදී අපි දන්නවා වැට් එකට 15% ක් කැපෙනවා. ඒ වගේම සමිතියට 5% ක් දෙන්න ඕනෙ. ඒ වගේම මේ ව්‍යාපෘතිය ඇස්තමේන්තු මුදලේදී ඇස්තමේන්තු කිරිමේදී rates වලට 20% ක විතර ලාභයක් සහිතව තමයි මේවා ඇස්තමේන්තු කරන්නෙ. මේවා අපි දන්න කාරණයක්. එතකොට ඒ සමස්තය ගත්තම 40% ක වගේ ප්‍රමාණයක් මහ පොළවට යන්නෙ නැතුව ඒවා අතරමගදී නතරවෙන තත්වයකට පත්වෙලා. ප්‍රාදේශීය සභාවට වැට් වශයෙන් ලැබෙනවා. කරන සමිතියට හෝ පුද්ගලිකව ටෙන්ඩර් ගත්ත පුද්ගලයාට ලැබෙනවා. මෙවැනි ක්‍රමවේදයක් තමයි තියෙන්නෙ. හැබැයි අපි දකිනවා මේ තුළ අපි සෘජු ශ්‍රමිකයන් යොදවලා මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මේ සියල්ලම අපි කියමු රුපියල් ලක්ෂ 5 ක් මේ ව්‍යාපෘතිය සඳහා යෙදෙවුවා නම් ඒකෙන් ලක්ෂ 5 ම මහ පොළවට යනවා. ඒක තමා මේකෙ යථාර්ථය. මේ ව්‍යාපෘතියේ තියෙන සාර්ථක භාවය. ඒ නිසා අපි විශ්වාස කරනවා මෙය ඉතාමත්ම ප්‍රයෝගික ව්‍යාපෘතියක්. ඒ නිසාම මාස 06කට දීර්ඝ කරනවා වෙනුවට හැකිනම් ලබන සතියේදී හෝ කමක් නැහැ මේ ව්‍යාපෘතිය කිරීමට අවශ්‍ය කටයුතු කරන්නැයි කියන ඉල්ලීම මේ අවස්ථාවේදි කරනවා. ඔබතුමාට නැවතත් අපගේ ගෞරවය, ප්‍රණාමය මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලබාදෙනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම ඉතිහාසයේ අපිත් දකිනවා මේ ව්‍යාපෘතිය පිළිබඳව. අපිට මතකයි සීතාවක ප්‍රාදේශීය සභාවේ පුට්සයිකල් සූදානම් කරපු කණ්ඩායමක් බයිසිකලේ උදැල්ල බැඳගෙන ග්‍රාමීය මාර්ගවල යනවා. කාණු පද්ධතිය බොහෝම වටිනා අන්දමින් නිම කරපු යුගයක් ඒ ඉතිහාසයේ තිබුණා. ඒක කාලයාගේ ඇවෑමෙන් ගිලිහිලා ගිහිල්ලා අද නැවත මේ ප්‍රාදේශීය සභාවේ මුදල් තාර කොන්ක්‍රීට් ඇතිරුවත් ජලය බැස යාමේ කාණු පද්ධතියක් නොමැති වීම හේතුවෙන් අර ඉදිකරන්නට යෙදුන තාර දාපු මාර්ග බොහොම ක්ෂණිකව විනාශ වෙනවා. ඒ වගේම මම මේකට තව යමක් එකතු කරනවා ගරු සභාපතිතුමනි. අපිට දැන් දැනෙනවා සීතාවක ප්‍රාදේශීය සභාවේ පාරවල් කෙමෙන් කෙමෙන් පැල ඉනි වැටවල් හිටවලා මේ පාරේ තියෙන පළල අද ශුන්‍ය බවට පත්වෙලා තියෙනවා. ඒ සඳහා කවුරුහරි වැඩ ඒකකයේ අපේ නිලධාරියෙකුත් යොදවලා ඒ පාරේ දිග අවශ්‍ය වෙන්නෙ නැහැ මේ පාරෙ පළල පිළිබඳව සොයා බලලා ඒ නිසි පළල තුළින් කාණුව කපන්න වැඩ පිළිවෙලක් සූදානම් කරන්න කියලා මම මේ යෝජනාවට එකඟ වෙනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, ඉතාම හොඳ යෝජනාවක් ඒකෙ වරදක් නැහැ. හැබැයි මේ වැඩ ඒකකය මේ සභාවේ තිබුණා. එස්.ඒ ප්‍රේමරත්න මන්ත්‍රීතුමා කිව්වා වගේ බයිසිකලයේ උදැල්ල බැඳගෙන ගියා. වර්ග කිලෝ මීටර් 208 ක් මේ සභාව තුළ තියෙනවා. ඒක 2002 ත් ඒ විදියටම තිබුනා. ඒක වැඩිවෙලා නෑ. වර්ග කිලෝ මීටර් ගාණ වැඩි වුණෙ නැහැ. ඒ අනුව මං මාවත් 889 ක් තිබුණා. ඒක ඕන්නම් එකක් දෙකක් වැඩිවෙලා ඇති වෙන්දේසි ඉඩම් වලින්. ඒ වගේම කිලෝමීටර් 500 ක් දිග මංමාවත් තියෙනවා. ඒක ඒ විදියටම තිබුණා. හැබැයි ඔය ටික ඔහොම්ම අපේ හිටපු චන්ද්‍රසිරි

සභාපතිතුමා ආරම්භ කරපු වැඩ ඒකකයෙන් කළා. හැබැයි ප්‍රශ්නේ තියෙන්නෙ පහුගිය සභාවාරේ ඉඳලා ඔබතුමා එදත් සභාපති. ඒ සභා වාරයේ ඉඳලා වැඩ ඒකකය නැහැ. වැඩ ඒකකය නැති කරලා අද ඔබතුමා පත්වෙච්ච ගමන් මේ හයවෙනි සභාවට ඔබතුමා යෝජනාවක් ගේනවා ආපහු වැඩ ඒකකයක් ආරම්භ කරන්න. මොකක්ද මේකෙ තියෙන සත්‍යතාවය අළුත් මන්ත්‍රීවරුන්ට තේරෙනවද හිටපු සභාපතිවරුන්ට තේරෙනවද කියන එක ප්‍රශ්න කරන්න ඕනෙ. එතකොට ඒ පාරවල් වැඩිවෙලත් නෑ වර්ග කිලෝ මීටර් ගාන වැඩිවෙලත් නෑ. අපේ සභාවේ ඒ අයවැය ලේඛනය අරන් බැලුවම ඒක ඔබතුමාලට බලන්න පුළුවන් හැමෝටම අයවැය ලේඛනයක් ඉල්ල ගන්න පුළුවන්. මේකෙ ඉන්නවා සභාවට අයිති සේවකයෝ ප්‍රමාණය. සේවකයෝ 184 ක් මේ සභාවට අයිතියි. සේවා නියුක්තිය මේකෙන් වැඩ ක්ෂේත්‍ර කම්කරුවෝ 50 ක් ඉන්නවා මේ සභාවේ. සෞඛ්‍ය කම්කරුවෝ 35 ක් ඉන්නවා. වැඩ පරීක්ෂකවරු, ක්ෂේත්‍ර පරිපාලකවරු 4 දෙනෙක් ඉන්නවා. එහෙම තියෙද්දි ඔබතුමා ආයිත් කියනවා වැඩ ඒකකයක් ආරම්භ කරන්න ඕනෙ කියලා. මේක ඉතින් දේශපාලන කෝණෙන් බලලා පවුල් එකොළහකට රැකියාව දෙන්න සභාවෙන් මිලියන 5 ක් අවුරුද්දට වෙන් කරන්න මේ වැඩ කටයුත්ත කරන්න පුළුවන්. එතකොට මේ 43 දෙනා අළුත් මන්ත්‍රීවරු හැටියට 29 දෙනෙක් මේකට අනුමැතිය දෙනවාද කියන එක කල්පනා කරන්න ඕන. එතකොට වැඩ ක්ෂේත්‍ර කම්කරුවෝ 50 ක් කොහෙද ඉන්නෙ? පහුගිය කාලේ උදැල්ල බැඳගෙන ගිය අය දැන් ඉන්නෙ කොහෙද? ඒක තමයි මට අහන්න තියෙන ප්‍රශ්නේ. ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ සභාවේ මුළු ආදායම මේ අයවැය ලේඛනයට අනුව මිලියන දෙසිය හැත්තෑවයි. (270) ඒකෙන් පුනරාවර්තන වියදම් මිලියන දෙසිය හතලිහයි. (240) එතකොට ප්‍රාග්ධන වියදම් මිලියන විසි නමයයි නැත්නම් තිහයි. මේකෙන් පඩි ගෙවනවා මිලියන එකසිය විසිහතරක් (124) අවුරුද්දට. ඒ කියන්නෙ රජයෙන් ආපහු පියවනවා මිලියන 94 ක්. එතකොට මං කියන්නෙ අවුරුද්දට මිලියන 30 ගෙවන්නෙ මේ සභාවේ අරමුදල් වලින් ඔබතුමා මේක පිළිගන්න ඕනෙ. එතකොට සභාවේ ආදායම මිලියන 270 හැදිලා තියෙන්නෙ පඩි ගෙවන්න ආණ්ඩුවෙන් මිලියන 94 ක් ආපහු ප්‍රතිපූරණය කරනවා. මේ මන්ත්‍රීවරු සඳහා වැටුප් ගෙවන්නෙ මිලියන අටක් ආණ්ඩුවෙන් ඉල්ලනවා. මම දන්නෑ දෙනවාද නැද්ද කියලා. ඔබතුමා දන්නෙත් නෑ. මිලියන අටයි මිලියන 104 ක් 102 ක් 270 න් මිලියන 102 ක් රජයෙන් දෙන සල්ලි. ඊට පස්සෙ මුද්දර හා වරෙන්තු ගාස්තු හැටියට මිලියන 86 ක් ආණ්ඩුවෙන් ලැබෙන්න ඕනෙ. මම දන්න හැටියට එදා මුදල් කමිටුවේදීත් කිව්වා මේක ලැබිලා නෑ කියලා. එතකොට මුළු ආදායමෙන් 72% ක් රජයෙන් ලැබෙන සල්ලි. ඒවා රජයෙන් මේ ප්‍රදේශ නඩත්තු කරන්න ලැබෙන සල්ලි. මිලියන 86 විතරක් ලැබුනොත් මේ වෙනකන් ලැබිලා නෑ. ඔබතුමා කිව්වා දෙන්නෙත් නෑ සමහර වෙලාවට මේ ඉන්න මහ ඇමතිතුමා. දැන් මිලියන 30 ක් ද කොහෙද ඉල්ලගෙන ආවා කියලා මට දැන් වුට්ටකට ඉස්සෙල්ලා හම්බෙලා කිව්වා. දීලා නෑ. හැබැයි 72% ක් පඩි ගෙවීම් සඳහා වියදම් කරනකොට මේ රජයේ පුනරාවර්තන වියදමෙන් මිලියන 240 න් 124 ක් ඒ කියන්නේ 51% ක් පුනරාවර්තන වියදමින් 51% ක් වැටුප් හා දීමනා ගෙවනකොට ඊට අමතරව මේ සභාව අවුරුද්දට අතිකාල දීමනා ගෙවීම සඳහා මිලියන 5 ක් වෙන්කරලා තියෙනවා 2018 වර්ෂයේ. එතකොට මේවා වැඩ කම්කරුවන්ට ගෙවන්නේ මොකක්හරි වැඩක් කරලා නිසා. ඔබතුමාලා ගණන් හදලා බලන්න මේකෙ මිලියන 5 ක් අතිකාල දීමනා වලට වෙන් කරලා තියෙනවා. ආසන්න වශයෙන් 49 ක් ලක්ෂ. එතකොට මෙහෙම තත්වයක් තිබියදී ඔබතුමා දැන් යෝජනා කරනවා තව කම්කරුවෝ 12 දෙනෙක් අරගෙන කම්කරුවෝ 12 ක් සහ සුපවයිසර් කෙනෙක් අරගෙන මේකෙ පාරවල් ටික සුද්ධ කරන්න. ඔබතුමාලා සමහරක් පාරවල් දැන් ප්‍රාදේශීය සභාව නඩත්තු කරන්නෙත් නැහැ. 500 ක් පාරවල් තිබුනට ඔබතුමා අරුක්වත්ත පාර කාපට් කළාට පස්සෙ අපි සතපහක්වත් ඒ පාරට වියදම් කරන්නෙ නෑ මම දන්න විදියට. අර පාලමේ බැම්ම හැදුවා මිසක්. හැබැයි මම දකින විදියට වැඩ ධාරිතාවය එන්න එන්න අඩුවෙනවා පාරවල්වල. හැබැයි ඔබතුමාලා සේවකයෙ සහ කම්කරුවෝ වැඩිකරනවා. එහෙම කලොත් මේ ප්‍රාදේශීය සභාව ගෙනියන්න පුළුවන්ද? ඒ හින්දා ඔබතුමාලා ළඟ කල්පනා කරන්නෙ නැතුව සභාව ගැන කාරුණිකව හිතලා කරුණාකරලා මම මේ සේවකයෝ ගැන වැරදියට කියනවා නෙමෙයි. ක්ෂේත්‍ර කම්කරුවෝ 50 දෙනා කොහෙද ඉන්නෙ කියලා බලන්න. වැඩ කරනවා ඇති හැබැයි මේ සභාවට වැඩ කරන සේවකයෝ ඉන්න ඕනෙ 184 යි. ඊට අමතර මේ සභාවේ ඉන්නවා කොම්පෝස්ට් ව්‍යාපෘතිය කියයි ඩෙංගු ව්‍යාපෘතිය කියනවා. පොලිතින් එකතු කරන්න තව කම්කරුවෝ වැඩ ඒකක හදපුවා. ඒ වගේ ව්‍යාපෘති හදලා සේවකයෝ 12 දෙනෙකුට පඩි ගෙවනවා මේ සභාවෙන්. මේ 12 යි ඒ 30 යි එකතු උනාම 42 ක් එනවා. ඊට අමතරව ඔබතුමා නිවාස කමිටුවට දාලා තියෙනවා පෙර

පාසල් ගුරුවරුත් බඳවා ගන්න ඕනෙ කියලා වැඩ ඒකකයක් වගේ. ඒ කියන්නෙ ව්‍යාපෘතියක් හදලා. මේ ඔබතුමාගේ දැක්ම එනකොට සභාපති වෙච්ච ගමන් දැක්ම තමයි සේවකයෝ වැඩිපුර වැඩි කරගන්න එක. එතකොට අපි දන්නවා මේ සභාවේ මුළු ආදායම අර මිලියන 270 න් සොච්චමක් තමයි අර 28% යි මේ සභාව උපයාගන්නේ. වරිපනම් බදු කුලී ගාස්තු මේ සියල්ලගෙන්ම මම හිතන්නෙ 28% යි. 30% ක් කියලා කියමුකො. 270 න් 30% යි කියන්නෙ මිලියන 90 යි. ඔය අනුවෙන් මිලියන 30 ක් පඩි ගෙව්වම මේ මිනිස්සුන්ට මොනවාද කරන්නෙ. ජනතාව 142,160 කට මිලියන 40 කින් තමයි ඔබතුමා මොනාහරි කරන්න හදන්නෙ. ඒකෙත් වාහන ටික ඉන්ෂුවරන්ස් කරලා වාහන ටික රෙපෙයාර් කරලා ආවම මොනාද කරන්න පුළුවන් කියලා ඔබතුමාම කල්පනා කරලා බලන්න. ඔබතුමා මේකට සල්ලි වෙන්කරලා නෑ. ඔබතුමා අයවැයෙන් මුදල් වෙන්කරලා මෙම වැඩ ඒකකය හදන්න. මේ අයවැයේ එහෙම එකක් නැහැ. 2018 අයවැයේ එහෙම එකක් නැහැ. හැබැයි ඔබතුමා මේකෙ වරහන් ඇතුලෙ ගහනවා ප්‍රිමික්ස් ව්‍යාපෘතිය සඳහා මුදල් ගන්නවා. ප්‍රිමික්ස් ව්‍යාපෘතියට මුදල් වෙන්කරලා තියෙන්නෙ මිලියන 10 යි. මේ මාර්ග 500 කිලෝ මීටර් 500 ක් අළුත්වැඩියා කරන්න මිලියන 10 යි ඔබතුමා දාලා තියෙන්නෙ. ප්‍රිමික්ස් ව්‍යාපෘතියට. මිලියන 22.5 ක් දාලා තියෙනවා බෝක්කු කාණු අළුත්වැඩියා කරන්න. හැබැයි ඒ ටික එකතු කළාම මිලියන 32යි. සේවකයෙ මේ සභාවේ ඕනෙතරම් ඉන්නවා. මේක කළමනාකරණය කරන්න පුළුවන් සුදුසු සභාපතිවරයෙක් තමයි මිනිස්සු තෝරලා පත්කළේ. ඒ නිසා ඔබතුමා ඒ කළමනාකරණය කරනවා කිව්වට මේ කරන්නෙ කළමනාකරණය ද එහෙම නැත්නම් වෙන යමක්ද කියලා ඔබතුමාලා හිතලා බලන්න ඕනෙ. මේ ඉන්න මන්ත්‍රීවරු අවබෝධයෙන් කටයුතු කරලා මේ යෝජනාවට මොකක්ද කරන්නෙ අර ගයාන් දුමින්ද මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ තියෙන මුදල් බැරිවෙලාවත් වැටුප් කොහොමත් ගෙවයි. මන්ත්‍රී දීමනා ගෙව්වෙ නැත්නම් ගෙවන්න වෙයි. මුද්දර සල්ලි වරෙන්තු සල්ලි ආවෙ නැත්නම් කොහොමද ඒක ගෙනියන්නෙ කියලා ප්‍රශ්නයක් එයි මේ සභාවට. ඒ නිසා මේවත් පිළිබඳව කල්පනා කරලා නවක මන්ත්‍රීවරු හැටියට මේක මාස 06 ක් පහුකරලා එහෙම ඔබතුමා එනවනම් අපි මේකට සහයෝගය දෙන්න සූදානම්. එහෙම නැත්නම් මේ යෝජනාවට මගේ විරෝධතාවය මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා සහ මීට වඩා දීර්ඝව කතා කරන්නෙ නෑ. ඔබතුමාගෙන් අවසාන වශයෙනුත් මම ඉල්ලා සිටිනවා මේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවෝ 50 දෙනා යොදාගෙන ආරම්භයේ හිටපු සභාපති චන්ද්‍රසිරි මැතිතුමාට ගෞරවයක් හැටියට එතුමා ආරම්භ කරපු වැඩ ඒකකය ඒ කම්කරුවන්ම යොදාගෙන දැනට ආරම්භ කරලා ඉන් අනතුරුව මේ මාර්ගවල යම් දෙයක් වෙන්නෙ නැත්නම් ඒ සියලු කටයුතු කරන්න ඊට පස්සෙ නැවත මේ යෝජනාව, උසාවි දඩ ටික මුද්දර ගාස්තු ටික ලැබෙමින් පවතිනවා නම් තව මාස 06 ක් මේ සභාව යන්න දීලා දාන්න තාම මැයි මාසය ඔබතුමා ලක්ෂ 25 ක් වියදම් කරන්න පුළුවන් මේකට. හදිසි වෙන්න එපා. ඔබතුමා පොරොන්දු වෙලා ඇති එක් එක්කෙනාට එක එක සේවකයා දෙන්නම් කියලා. එහෙම නෙමෙයි වෙන්න ඕනෙ. සභාවක් හැටියට මේ බල ප්‍රදේශය එක්ලක්ෂ හතලිස්දෙදහසක් ජනතාවට කරන්න පුළුවන් සේවය කරන්න නිවැරදි ආකාරයෙන් මේ මුදල් පරිපාලනය කරන්න කියන ඉල්ලීම කරමින් මේක පහුගිය කාලේ ලේකම්තුමා කලා. අපි නැති කාලේ මේ සේවකයෝ ටික යොදාගෙන සුසාන භූමි ටික සුද්ධ කළා. පාරවල් ටික සුද්ධ කළා අපි දැක්කා. තණකොළ ටික කපන්න ඔය ටික කරන්නේ. තණකොළ ටික කැපුවෙ නැද්ද පහුගිය කාලේ. මේ 12 දෙනා නැතුව කපන්නේ නැතුව හිටියද? නෑ. ඒ හින්දා ඒ සේවකයෝ ටික දාලා මේ වැඩ ඒකකය නැවත ආරම්භ කරන්න. එහෙම කරන්නෙ නැතුව මේකට කවුරුහරි අත උස්සලා සහයෝගය දෙනවානම් මම මේකට තරයේ විරුද්ධයි කියා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන ලියනගේ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම ලේකම්තුමා ඇතුළු නිලධාරී සියලුදෙනාගෙන්ම අවසරයි. ජන මාධ්‍යවේදි සියළුදෙනාගෙන්ම අවසරයි. ගරු සභාපතිතුමනි ඔබතුමා විසින් ඉදිරිපත් කරලා තියෙන යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමටයි සූදානම් වන්නේ. ඔබතුමා ඉදිරිපත් කරලා තියෙන යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. ඉතාම කාලෝචිත යෝජනාවක් හැටියට තමයි මම දකින්නෙ. මොකද මන්ත්‍රීවරයෙක් විදියට තේරී පත් උනාට පස්සෙ අපි ගමට ගියාට පස්සෙ අපිට මූණ පාන්න තියෙන ගැටළු වලින් ප්‍රධානම ගැටළුව බවට පත්වෙලා තියෙන්නෙ පාරවල්වල කාණු ටික හරියට නැති එකයි පාර දෙපැත්තේ තිබෙන තණකොළ ටික

කපාගන්නත් අපිට හැකියාව නැති තත්වයට තමයි අද සීතාවක ප්‍රාදේශීය සභාව පත්වෙලා තියෙන්නෙ. ගමට ගියාට පස්සෙ අපිට දැනෙනවා කාණු පද්ධතිය සකස් කිරීම පිළිබඳව පාර දෙපස එළි පෙහෙළි කිරීම පිළිබඳව ගැටළු මතුවෙලා තියෙන බව. අපේ ගයාන් දුමින්ද මන්ත්‍රීතුමාත් මංජුල වීරරත්න මන්ත්‍රීතුමාත් කිව්වා මේ යෝජනාව මාස 06 කින් කල් දාමු කියලා. මං හිතන්නෙ මං මන්ත්‍රීවරු දෙදෙනාටම කියා සිටින්නේ මේ කාරණාව පිළිබඳව දේශපාලන කෝණයෙන් බලන්න එපා. සභාව පැත්තෙන් බලන්න. චන්ද්‍රසිරි ගමගේ මැතිතුමාගේ සභාපතීත්වයෙන් යුක්තව මේ කටයුත්ත ආරම්භ කරලා අද ගතවෙලා තියෙන කාලය තුළ මේ ප්‍රාදේශීය සභාවේ සේවකයෝ යොදාගෙන තිබෙන කාර්යයන් පිළිබඳව විවිධ කාර්යයන් වලට යොදාගෙන තිබෙනවා. තමුන්නාන්සේලාගේ පාලන කාලයකුත් මේ අතරතුර ආවා. මං හිතන්නේ 2001 කාලසීමාව තුළ තමුන්නාසේලාගේ ප්‍රාදේශීය සභා පාලන කාලයකුත් ආවා. හැබැයි මේ කාලය තුළත් මේක ක්‍රියාත්මක වුණේ නැහැ. මේ සේවකයෝ 184 තමුන්නාසේලා මතක් කරන 184 අඩුමගානේ ඒ කාලෙ 150 ක් වත් ඉන්න ඇති. නමුත් මේ ක්‍රියාදාමය ක්‍රියාත්මක වුණේ නැහැ. එදා තිබ්බ්ව වැඩ කොටස වගේ නෙමෙයි අද තියෙන වැඩ කොටස විවිධ ව්‍යාපෘති ආරම්භ කරලා තමුන්නාන්සේලා මතක් කළා ඩෙංගු ව්‍යාපෘතියක් ආරම්භ කලා. ප්‍රිමික්ස් හදන ව්‍යාපෘතියක් ආරම්භ කළා. ඒ ව්‍යාපෘති සඳහා ද මේ සේවකයෝ යොදවලා තියෙන්නෙ. හැබැයි කාටවත් කියන්න බෑ ඒ ව්‍යාපෘති නිසා යම් කිසි සේවාවක් මේ ප්‍රාදේශීය සභාවට නොවුනා කියලා. ඩෙංගු ව්‍යාපෘතියෙන් මේ සභාවට යම්කිසි සේවාවක් ඉටුවෙලා තියෙනවා. ඒ වගේම ප්‍රිමික්ස් හදන මේ පාරවල් නඩත්තු කිරීමෙන් යම්කිසි සේවාවක් මේ ප්‍රාදේශීය සභාවට ඉටුවෙලා තියෙනවා. මේ කටයුත්තත් මං හිතන්නෙ සභාපතිතුමා ගෙනත් තියෙන්නෙ ඉතාම සද්භාවයෙන්. සේවකයෝ බඳවා ගැනීමේ යම්කිසි ගැටළුවක් වෙලා තියෙනවානම් ඒකෙ සාකච්ඡා මාර්ගයෙන් විසඳගන්න පුළුවන් මං හිතන්නෙ සභාපතිතුමාට. හැබැයි මේ කටයුත්ත උපුල් මන්ත්‍රීතුමා කිව්වා වගේ මාස 06 ක් තියා එක්දවසක් කල් දාන්න එපා කියලා තමයි අපි කියන්නෙ. මේක ඉතාම ප්‍රයෝජනවත් ප්‍රාදේශීය සභාවට. ඒක නිසා තමුන්නාන්සේගේ අවධානය මේ සඳහා යොමුවීම පිළිබඳව අපි ස්තූතිවන්ත වෙනවා. කාර්මික සේවා කමිටුවේදිත් අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. ඔබතුමාගෙ කතාව වෙලාවෙදි අපි අහගෙන හිටියා. ඔබතුමා විපක්ෂයේ කාර්ය භාරය කරනවා වගේම අපි ආණ්ඩු පක්ෂයේ කාර්යභාරයත් කරන්න ඕනෙ. ඔබතුමාලා කියන කියන විදියට වැඩ කරන්න අපි බැඳිලා නෑ. ඒක නිසා ඔබතුමාලා අපේ කතාවටත් සවන්දෙන්න. ඒක නිසා සේවකයෙක් ගන්නවද නැද්ද ඒක අපි කරගන්නම්. තමුන්නාන්සේලාට සේවකයෝ දෙනවද නැද්ද කියන එකත් අපි කරන්නම්. ඒ නිසා මෙවැනි ව්‍යාපෘතියක් ගෙනාවටත් පස්සෙ ඒක දේශපාලන කෝණයෙන්ම බලලා ඉවත දාන්න එපා. මේක අද මිනිස්සුන්ට දැවෙන ප්‍රශ්නයක් බවට පරිවර්තනය වෙලා තියෙන්නෙ. ඒක දේශපාලන කෝණයෙන් බලලා අපි රස්සාවල් ටිකක් දෙයිද තමුන්නාන්සේලාට රස්සාවල් ටිකක් දෙයිද කියන තැනට මේක ලඝු කරන්න එපා. ඒක නිසා මේ ව්‍යාපෘතිය තමුන්නාන්සේට ක්‍රියාත්මක කරගෙන යාම සඳහා අපි සහයෝගය දෙනවා මේක ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කරලා මේ ප්‍රාදේශීය සභා භූමියේ මේ දැවෙන ප්‍රශ්නය විසඳීම සඳහා තමුන්නාන්සේගේ මැදිහත්වීම ඉටු කරන්න කියලා මේ අවස්ථාවේදී මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එක් එක් ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමේදී මමත් අවස්ථාවක් ගැනීම සුදුසුයි කියලා මම විශ්වාස කරනවා. මේ පිළිබඳව මට තියෙන්නෙ ධනාත්මක සුබවාදී ආකල්පයක්. මොකද කතා කිරීමේදී මගේ නමත් සඳහන් කළා. අපි පසුගිය කාලයේ අපි වැඩ ඒකකයක් නිර්මාණය කළා කියන කාරණයත් කියවුණා. ඇත්තෙන්ම එදා අපිට පුළුවන් වුණා ඉතා කුඩා ප්‍රමාණයෙන් ඒකකයක් නිර්මාණය කරලා හුඟක් වැඩ කරන්නට. මම සන්තෝස වෙනවා වැඩ ඒකකය නිර්මාණය කරලා ඉස්සෙල්ලාම එම වැඩ ඒකකයෙන් වැඩ ගන්න දුන්නෙ අපේ හිතවත් රණවක ගරු මන්ත්‍රීතුමාට. අදත් එතුමා විපක්ෂයේ කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි මේ පිළිබඳව මට තියෙන්නෙ ධනාත්මක ආකල්පයක් කියන්න මට තියෙන ප්‍රධාන කාරණාව තමුන්නාන්සේ දන්නවා ඇති අද සීතාවක ප්‍රාදේශීය සභාවට විශාල මුදල් සම්භාරයක් එකතු කරලා දෙන හංවැල්ල නගරයේ තියෙන අපේ මාකට් ගොඩනැගිල්ල. ඇත්තටම ඒ ගොඩනැගිල්ල අපි කළේ ඇස්තමේන්තු හදනවාට වඩා හුඟක් අඩුවෙන් ප්‍රාදේශීය සභාවේ වැඩ ඒකකයක් හැටියට තමයි අපි ඒක කළේ. ඒකෙන් අපි ඉතුරු කරගත්ත මුදල් වලින් අපිට පුළුවන් වුණා ප්‍රදේශයට හුඟක් සේවාවන්

කරන්න. ඒ නිසා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා මේක දවසකින්වත් කල්දාන්න සුදුසු යෝජනාවක් නෙමෙයි. ඉතාම ඉක්මණින් මේක ස්ථාපිත කරලා මෙතන මගේ නමත් සඳහන් වෙච්ච නිසා ගෞරවයෙන් ඉල්ලා හිටිනවා මගේ පළවෙනි කටයුත්තක් තියෙනවා කම්මල්පිටියවත්තේ කාණු පද්ධතිය සකස් කිරීමේ කටයුත්ත. ඒකට යොදවන්නට කටයුතු කරන්න කියන ඉල්ලීමත් කරමින් තමුන්නාන්සේට නැවතත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මං හිතනවා යෝජනාවක් ඇවිත් තියෙනවා  අපේ මන්ත්‍රීවරු කිව්වා කාලෝචිත යෝජනාවක් කියලා. කිසි මන්ත්‍රීවරයෙක් කාලෝචිත නොවන යෝජනා ගේන්නේනැහැ. සියල්ල කාලෝචිත යෝජනා. ප්‍රශ්නේ තියෙන්නෙ අපේ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා යෝජනා කළේ මේක නවත්තන්න කියලා නෙමෙයි. බොහොම පැහැදිලියි මේක නවත්තන්න නෙමෙයි. අපි විශ්වාස කරනවා මේ මාර්ග පද්ධතිය සකස් කරගන්නවා නම් ඇත්ත වශයෙන්ම වැඩ ඒකකයක් තියෙන්නට ඕනෙ. චන්ද්‍රසිරි ගමගේ මැතිතුමන් සභාපතිභාවයක් හම්බුනේ 1999 අපේ මහේෂ් අල්මේදා මැතිතුමන් ගියාට පස්සෙ. නමුත් අපිට හම්බෙනකොට මං හිතනවා සල්ලි තිබුනෙ නෑ. අපිට හම්බුනා තැග්ගක් නගර සංවර්ධන සැලැස්ම. මට තාම මතකයි එතුමා මට පෞද්ගලිකව කතා කළා. සැලැස්ම හම්බ වුණාට සල්ලි නැනෙ කියලා. නමුත් අපි ඒ සියලු අභියෝගයන් ජයග්‍රහණය කරලා එතෙන්ට ගියා. එවක සභාපතිතුමාට යම් කාර්යයන් කරන්න හැකියාව ලැබුනා. නමුත් ගැටළුව තියෙන්නෙ සභාපතිතුමනි, මේක ඉෂ්ට කළයුතු කාරණාවක්. හෙට නෙමෙයි අද පටන් ගත්තත් කමක් නැහැ මේ කාරණාව වැදගත් දෙයක්. නමුත් ගැටළුව තියෙන්නෙ අපේ විපක්ෂ මන්ත්‍රීතුමන්ලා මේ ගැටළුව මතු කරන්නෙ සේවක මහතුන් 30 ක් ඉන්නවා පැහැදිලිවම. මේ අයගෙන් 12 ක් යොදාගෙන මේ කටයුත්ත කරන්න කියලා. මේ සේවක මහතුන් 50 න් 12 ක් යොදාගෙන මේක ආරම්භ කරන්න පුළුවන්නම් කිසි ගැටළුවක් නෑ. ලක්ෂ 50 ක මුදලක් වාර්ෂිකව වැය කරනවායි කියන්නෙ අර ඉස්සෙල්ලා කිව්වා වගේම මේ කටයුත්තෙදි තව පාරවල් වලට යොදන්න තියෙන ලක්ෂ 50 ක් තමයි නැතිවෙන්නෙ. මේකෙ සඳහන් කරලා තියෙනවා අපිට ලැබෙන ප්‍රතිලාභ අනුව ප්‍රදේශවාසීන්ට රැකියා අවස්ථා ලබාදීම. ඒකට අපේ විරුද්ධත්වයක් නෑ. මොකද මේකට එන්නෙ උපාධි ගත්ත කට්ටිය නෙමෙයිනෙ. කම්කරු රැකියාවකට එන්නෙ. ඒකට අපේ විරුද්ධත්වයක් නෑ. අපේ චන්දන මන්ත්‍රීතුමා කිව්වා එයාලා තීන්දු කරන්නෙ කියලා කාටද රක්ෂා දෙන්නේ කියලා. හැබැයි එහෙම කාලයක් තිබුණා. ඒ අර තමුන්නාන්සේලාගේ කැලෑ නීතිය යටතේ නමුත් සභාපතිතුමාට එහෙම කරන්න බෑ මං හිතන්නෙ. කව්ද පත්කරන්නෙ කියන එකට සභාපතිතුමාගේ යම් නීතිරීති තියෙනවා. ඒකෙදි තමුන්නාන්සේලා හිතනවනම් 23 ක් ඉන්නවා 23 බෙදන්න බෑ 12ට. ඒක අඩුවෙනවා. ඉතින් තවත් 12 කට හම්බෙන්නෙ නැහැ. ඒ නිසා එවැනි ප්‍රකාශ කරන්න එපා කියලා මම ඉල්ලනවා. මේක බලය පාවිච්චි කරලා කරන්න දෙන්නෙ නෑ අපි. 23 ක් ඉන්නවා තමුන්නාන්සේලාට. ඔන්නම් මේක සභා සම්මත කරලා පවත්වාගෙන යන්න පුළුවන්. කැලෑ නීතියට කරන්න දෙන්නෙ නෑ අපි. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි විශ්වාස කරනවා තමුන්නාන්සේ මේ තුළින් යම් සේවාවක් ඉෂ්ඨ කරන බලාපොරොත්තුවෙන් ඉන්නවා කියලා.  ප්‍රේමරත්න මන්ත්‍රීතුමා කිව්වා බයිසිකලේ උදැල්ල බැදගෙන ගිහිල්ලා සේවාව ඉෂ්ඨ කලා කියලා. මතක් කරන්න ඕනෙ අද අපි සභාවේ නැතත් ඒ පරිපාලක මහත්වරු ඉතා වගකීමෙන් ඒ කටයුත්ත ඉෂ්ඨ කරනු ලැබුවා. ගිහිල්ලා එතෙන්ට වෙලා ඉඳලා කාණු සුද්ධ කරලා ඒ වැඩ කටයුත්ත කලා. අද අපේ මාර්ග පද්ධතිය වැඩිවීමත් එක්ක අවශ්‍යතාවය වැඩිවීමත් එක්ක අපි විශ්වාස කරනවා යම් යම් ආකාරයේ මොනවාහරි උපකරණ පාවිච්චි කරලා ජේ.සී.බී. යන්ත්‍ර වෙන්න පුළුවන් එහෙම නැත්නම් මැෂින් වෙන්න පුළුවන් මේවා පාවිච්චි කරලා කරන්නට ඕනෙ. ඒවාට අපගේ විරුද්ධත්වයක් නෑ. අපි කියන්නෙ තවදුරටත් මිනිස් ශ්‍රමය නෙමෙයි. ඔන්නම් මැෂින් ගත්තත් කමක් නැහැ.මැෂින් අරගෙන වැඩිපුර සල්ලි වියදම් කරලා හැබැයි මම කියන්නෙ මේ ඉන්න කම්කරු මහත්වරුන් පාවිච්චි කරලා මේක ආරම්භ කරලා මේක මාස 6 ක් කරලා බලන්න. දෙවනුව ඒ පත්කරගන්න සේවක මහතුන් ගැන හිතන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. ඒ මොකද හේතුව අපි බලාපොරොත්තු වෙන්නෙ රැකියා අවස්ථා ලබාදීම නම් මම හිතන්නෙ නෑ ඒක සාර්ථක වැඩක් කියලා. මොකද අද මේ වනවිට මිනිසුන්ගේ මුළු මාර්ග පද්ධතිය බොහොම බරපතල තත්වයට හානි වෙලා තියෙනවා. අපි දන්නවා ගිය අවුරුද්දේ ලක්ෂයෙන් කරපු

තාරපාරක් අද එහි සනකම අඩුවෙලා තියෙනවා. එතකොට මේ මන්ත්‍රීවරු 43 දෙනෙක් ඉන්නවා ඒ අය පත්කරලා ඉන්නෙ මොකක්හරි කාරණාවකට. ඒ නිසා ඔවුන්ට යම් මුදලක් ලබාදෙන්න බැරිනම් තමන්ගේ ප්‍රදේශය සංවර්ධනය කරන්නට මං හිතනවා සියලු මන්ත්‍රීවරු ඒකෙන් අපහසුතාවයට පත්වෙන්න පුළුවන් කියලා. තමුන්නාන්සේට හැකි වෙන්න පුළුවන් සමහරවිට යම් තීන්දු තීරණ ගන්න 23 දෙනෙක් ඉන්න හින්දා හැබැයි අපි විශ්වාස කරනවා තමුන්නාන්සේඑතනට ලඝු වෙන්නෙ නැතුව මේ කටයුත්තේදි විපක්ෂයේ හඬට කන්දීලා මේ කාරණාව සාකච්ඡා කරලා තමුන්නාසේලා මේක සාකච්ඡාවට ගේන්නෙ ඒකටනෙ. සභාවට ගේන්නේ වන් මැන් ෂෝ දුවන්න නෙමෙයි. එහෙමනම් තමුන්නාන්සේට පුළුවන් තනි තීන්දු ගන්න. එහෙම නැතුව තමුන්නාන්සේ මේක ගේන්නෙ අනෙකුත් මන්ත්‍රීවරුන්ගෙත් අදහස් අරගෙන අළුත් දෙයක් නිර්මාණය කරන්න. අපි ඉල්ලා සිටිනවා පුළුවන්කමක් තියෙනවානම් කුඩා ජේ.සී.බී. යන්ත්‍රයක් පාවිච්චි කරලා මේ තියෙන කාණු පද්ධතිය සකස් කරන්න. අද මේ අපේ අතුරු මාර්ගවල කිසිම කාණුවක් නෑ. මේ කාණු කපන්න දෙන්නෙත් නෑ සමහරක් අය බලහත්කාරයෙන් අල්ලාගෙන. හැබැයි ප්‍රශ්නෙ තියෙන්නෙ මම දන්නෙ නෑ මේ තියෙන උපකරණවල භෞතික සම්පත්වල දාලා නැහැ කාණු කපන්න පුළුවන් ජේ.සී.බී. යන්ත්‍රයක් අපි ළඟ තියෙනවද කියලා. එහෙම නැති වුනොත් අපිට මේක අතින් කපලා දන්නන්න බැහැ ඉස්සර වගේ. අඩි ගානක් කපලා කරන්න බැහැ. ජේ.සී.බී. යන්ත්‍රයක් ගන්නම වෙනවා. ඒ නිසා මේ කාරණාව මතක් කරමින් තමුන්නාන්සේ විපක්ෂයේ අර මන්ත්‍රීවරුන්ටත් කන්දීලා මේ ව්‍යාපෘතිය අපි ඉස්සරහට අරගෙන යමු. ඒ එක්කම මේක ක්‍රියාත්මක කරද්දි තමුන්නාන්සේ සියලු මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතා වලට මූලිකත්වයක් දෙන්න සියලු මන්ත්‍රීවරුන්ට යම් අවස්ථාවක් දෙන්න කියලා ඉල්ලීමක් කරමින් මේ සේවක මහතුන්ගේ ගැටළුව විසඳෙනවාත් එක්ක අපිට පුළුවන් වෙනවා සහයෝගය ලබාදීලා මේක ඒකමතිකව තීන්දුවක් වශයෙන් සම්මත කරගන්නට ඒ නිසා ඒ අවස්ථාව ලබාගන්නට කියා ඉල්ලමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් කීපයක් පළවුනා. මෙම අවශ්‍යතාවය පිළිබඳව කිසිඳු ආකාරයකින් මන්ත්‍රීවරයෙක් විදියට අපේ මන්ත්‍රී කණ්ඩායම උනත් කිසිඳු ආකාරයකින් මෙම යෝජනාව සම්බන්ධයෙන් අපේ විරෝධයක් හෝ ඒ පිළිබඳව නොගැලපිල්ලක් තියෙනවා කියලා මම විශ්වාස කරන්නෙ නෑ. නමුත් පසුගිය කාලසීමාව ඇතුලේ විශේෂයෙන්ම මේ බල ප්‍රදේශය ඇතුලේ සහ අනෙකුත් කටයුතු වලදීත් සම්බන්ධ වෙද්දි අපි දැක්ක දෙයක් තමයි විශේෂයෙන්ම ප්‍රධාන පාරවල් ටික හා අවදානමට ලක්වුණු මූලික පාරවල් ටික මංමාවත් කාණු පද්ධතිය ඇරුණුකොට ගම් ඇතුලේ තියෙන පාරවල්වල සාමාන්‍යයන් යන්න බෑ. උදාහරණයක් විදියට ගත්තොත් මම ජීවත්වෙන 427 ඩී පලපොටෙලන්ද පාර ගත්තොත් අද සාලාවේ ඇතැම් ත්‍රීරෝද රථ රියදුරන් ඇත්තනේම කැමති තමන්ගෙ වාහනයට සහ ඔක්කොටම තියෙන ආදරය නිසා කැමැත්තෙන් නෙමෙයි පලපොටෙලන්දට හයර් එකක් යන්න ඉල්ලුවොත් එන්නෙ. කැමති අයත් ඉන්නවා. මොකද ඒ තරමට පාරවල් අබලන්. යන්න බෑ. ඒ ආදී වශයෙන් ගත්තොත් අපේ සභා බල ප්‍රදේශය ඇතුලේ විවිධ තැන්වල විවිධ ප්‍රදේශවල, විවිධ කොට්ඨාශවල සාමාන්‍යයන් යතුරුපැදියකින් පවා ආරක්ෂිතව ගමන් කරන්න පුළුවන් මට්ටමක් නෑ. ඒ තරමට පාරවල් අබලන්. ඒ වගේම අපි දකිනවා විවිධ පාර්ලිමේන්තු, පළාත් සභා ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රතිපාදන වලින් පාරකට කොන්ක්‍රීට් හෝ තාර දමලා ඉදිකරලා ගියාට ඒ පාරවල් සතියකින් මාස ගාණකින් සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා පාරවල් හරහා යන බරපතල ජල කඳවල් නිසා. ඒ නිසා අපිට පේනවා පාරවල් වලට කොන්ක්‍රීට් තාර දානවා වගේම ඒ සඳහා අවශ්‍ය කරන විධිමත් පහල කලාප සඳහා වතුර බැසයාමේ කාණු පද්ධති ක්‍රමවේදයක් සැලසුම් සහගතව සකස්වීමේ අවශ්‍යතාවය තියෙනවා. එවැනි කාරණා ගත්තට පස්සෙ මේ යෝජනාව සම්බන්ධයෙන් වන සභාවේ අවශ්‍යතාවය හා සභාවේ ජීවත්වෙන ජනතාවට මෙවැනි යෝජනාවක් ක්‍රියාත්මක වීම තුළ තියෙන ප්‍රතිලාභය පිළිබඳව අපේ කිසිඳු ගැටළුවක් නැහැ ඒ අවශ්‍යතාවය අපි දකිනවා. ඒ වගේම මට හිතෙනවා ඔබතුමා මේ ඉදිරිපත් කරපු යෝජනාවේ අරමුණට අමතරව සෙසු අරමුණු කියලා දාපු කාරණා ඇතුලේ මාර්ග පද්ධති ක්‍රමවත්ව පවත්වාගෙන යාම, ඒ වගේම ව්‍යාපෘති නිමකර ගැනීමේ ප්‍රමාදය අවම කරගැනීම, වැසි ජල කාණු නඩත්තුව ආදී වශයෙන් එනකොටම අපිට අදහසක් එනවා එවැනි කටයුතු මේ දක්වා විධිමත්ව කෙරී නැති නිසා තමයි මෙවැනි අළුත්

යෝජනාවක් සභාවට ඉදිරිපත් වෙන්නේ. ඒ නිසා අපිට පැහැදිලියි පසුගිය කාලසීමාව ඇතුලත මුදල් නැතිකම නිසා හෝ සේවක හිඟය නිසා හෝ සේවක කළමනාකරණයේ දූර්වලතාවයක් නිසා හෝ කුමන හේතුවක් නිසා බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ නිවාස හා අනෙකුත් අවශ්‍යතා සඳහා ප්‍රවේශ වන මාර්ග පද්ධති ඒ වගේම කාණු පද්ධති විධිමත් ක්‍රමවේදයකට සකස් වෙලා පිළිසකර වෙලා නෑ. ඒ වගේම සභාව නියෝජනය කරන මහජන නියෝජිතයෙක් විදියටත් ඉතාම පැහැදිලිව මේ අවශ්‍යතාවය කඩිනමින් ඉටුවිය යුතු බව අපි දකිනවා. නමුත් මෙතන මතුවී තියෙන කාරණාව හා මෙතන යම් අදහස්වල නොගැලපිල්ලක් ඉදිරිපත් වෙනවා සාකච්ඡාව ඇතුලේ. ඒ මම හිතනවා මේ යෝජනාව ගරු සභාපතිතුමා ඒකට විරුද්ධ නොවෙයි කියලා. අවශ්‍යතාවය එතුමාට පැහැදිලි පිරිසිදු අරමුණක් නිරවුල් කාරණාවක් නම් නම් මෙතන මතුවී තියෙන්නෙ අලුතින් සේවකයින් බඳවා ගැනීමත් සමඟ තියෙන සභාවට දරන්න වෙන පිරිවැය පිළිබඳව කාරණාව. ඒ නිසා මම මේකෙ අවශ්‍යතාවය පිළිබඳව කිසිඳු විරෝධයක් නැහැ. අරමුණු පිළිබඳව කිසිඳු විරෝධයක් නැහැ. ප්‍රදේශයේ ජනතාවට කඩිනමින් මෙවැනි සේවාවන් පහසුකම් සැපයීමේ කාර්යක්ෂම ක්‍රමවේදයක් අවශ්‍ය වෙනවා. ඒ නිසා අවුරුදු 3 ක් දේශපාලන අධිකාරිත්වයකින් තොරව මේ සභාවල් රටේ පැවැත්වුනේ. ඒ වගේම දේශපාලන අධිකාරිත්වයක් සහිතව ආරම්භ වෙලා තියෙන මේ කාලය ඇතුළත මෙවැනි මහජන අවශ්‍යතාවයන් මතුකරගෙන වැඩ පිළිවෙලවල් හැදීම පිළිබඳව හැදෙන්න ඕනෙ. නමුත් අපි අපේ අදහස මෙතන අවසාන වශයෙන් ගොනු කරන්නෙ මේ යෝජනාව සංශෝධනයක් කරගන්න පුළුවන්ද මෙන්න මේ ආකාරයෙන් ඒක තමයි, දැනට අපේ සභාව සතු කම්කරු, අපේ සභාවේ වැඩ පරීක්ෂකවරු, තාක්ෂණ නිලධාරී මහත්ම මහත්මීන් මේ ආකාරයෙන් අදාල සේවක ගණයන් ඉන්නවා. ඒ වගේම අදාල මාර්ග කම්කරුවන් ඇතුළු කම්කරුවන් ප්‍රමාණයක් ඉන්නවා. ඒ කම්කරුවන්ගෙන් අවශ්‍ය විදියට කළමනාකරණය කරලා නියමු ව්‍යාපෘතියක් විදියට කෙටි කාලයක් සඳහා මෙම අරමුණම මෙම වැඩපිළිවෙලම සේවකයින් බඳවා ගැනීම සඳහා වන පිරිවැය වළක්වා ගැනීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස මාස කිහිපයක සීමාවක් දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස මෙය ක්‍රියාත්මක කිරීම සඳහා වන අවශ්‍යතාවය යෝජනාවට අදහසක් ලෙස ඉදිරිපත් කරමින් අපේ අදහස ඉදිරිපත් කරනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, සියලුදෙනාගෙන්ම අවසරයි. ඔබගේ මෙම වැඩ ඒකකය ආරම්භ කිරීම පිළිබඳව අපි ගොඩාක් සතුටු වෙනවා. මොකද ඇත්ත වශයෙන්ම කියනවානම් අපේ ප්‍රදේශයෙත් ගොඩක් පාරවල් තියෙනවා. ඉතින් ඒ පාරවල් අපි තාර දාලා අඩි 12 තියෙනවානම් අඩි 8ට හෝ 10ට තමයි තාර දාන්නෙ. එතකොට ඒ තාර දාලා ඉවර වුණාට පස්සෙ අනිවාර්යයෙන්ම ගමේ කට්ටිය කරන දේ දෙපැත්තෙන් තාප්පේ ගහගන්නවා. ඒ තාප්පෙ ගහගත්තට පස්සෙ දෙපැත්තෙන් මල් වැටියකුත් පෝය දවසට මල් කඩන්න කියලා මල් වැටියකුත් හිටවගන්නවා. ඉතින් අනිවාර්යයයෙන් ඒක අපිට ඉවත් කරන්න බෑ. මේ වැඩ ඒකකය වගේ කම්කරුවන් හිටියම ඒ ප්‍රදේශයට ඇවිල්ලා සභාවේ කට්ටිය ගමට ඇවිල්ලා ඒවා ඉවත්කරන්න කටයුතු යොදාගන්න පුළුවන්. ඒක ගොඩාක්ම ගමේ කට්ටියටත් සහයෝගයක් වෙනවා. කට්ටියත් බය වෙනවා ප්‍රාදේශීය සභාවෙන් ඇවිල්ලා තියෙන්නෙ ඒගොල්ලන්ට ඒකට අවසරය තියෙනවා කියලා. අනවසර කාණුවක් වුණත් අල්ලන්නෙ නෑ එතකොට. ඒ කාණුව උනත් සභාවේ කට්ටිය දාලා කපන්න පුළුවන්. ඇත්තවශයෙන්ම කියනවානම් අපේ ප්‍රදේශයේ කපුගොඩ තොටුපල වගේ දේවල් ගොඩක් අභාවයට පත්වෙලා. කැඩිලා බිඳිලා ගිහිල්ලා තියෙන්නෙ. ඒ වැඩ ඒකකයක් තුළින් අපි බොහෝ ප්‍රමාණයක් වැඩ ඒකකයේ කට්ටිය ඉන්නවානම් නඩත්තු කරන්න හරි පුළුවන්. මොකද ගමේ කට්ටිය ගොඩක් ඉන්නවා. අපේ විපක්ෂයේ කට්ටිය කිව්වා 12 දෙනෙක් රැකියාවල් වලට ගන්නවා කියලා. සමාවෙන්න විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා. ඉතින් මං හිතනවා දැනට පවතින රජයෙන් මං හිතන්නෙ ආණ්ඩු පක්ෂය අපේ පක්ෂයෙන් රැකියාවල් 12 ක් දෙන එකට මං හිතන්නෙ ඊරිසියා හිතිලා. මොකද ඒගොල්ලන්ට මේ අවුරුදු 03ට රැකියා දෙකක් දෙන්න බැරිවෙන්න ඇති. ඒක තමයි මම හිතන විදියට හේතුව. ඒ හින්දා ඔබතුමා 12 දෙනෙක් නෙමෙයි 20 ක් හරි අරගෙන මේ වැඩ ඒකකය ආරම්භ කරලා අනිත් එක මේ වැඩ ඒකකයට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව තමයි මේකට ගන්නෙ. ඒ කැලෑ

නීතිය අනුව නෙමෙයි ඔබතුමා සුදුසුකම් බලලා ඒ අවශ්‍යා කට්ටිය අරගෙන වැඩ ඒකකය සාර්ථකව කරන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂිණි ශ්‍රීමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය.**

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ ආරම්භ කරන වැඩ ඒකකය ගැන කිසිම ගැටළුවක් අපිට නැහැ. මොකද මන්ත්‍රීවරු විදියට අපිට යුතුකමක් තියෙනවා අපේ ගමට වැඩ කරන්න. අපි පත්වෙලා ඉන්නෙ ජනතාවට වගකියන්න. ඒක ගැන කිසි ගැටළුවක් නෑ. අපි යෝජනා කළේ ඉන්න අයගෙන් අපි වැඩ කරමු කියලා මිසක් රැකියා දෙන එකේ ප්‍රශ්නයක් නැහැ. කොහොමත් මෙවර බලයේ පවතින්නෙ අපි නියෝජනය කරන ආණ්ඩුව. ඒ නිසා කොහොමත් රැකියා සම්බන්ධව නෙමෙයි. ඉතින් ඔයාලට ලේසියි පුළුවන්නම් 43 දෙනෙක්ම ගත්තත්. එතකොට කාටවත්ම හානියක් වෙන්නෙ නෑ. හැමෝටම ලැබෙනවා රැකියාවක්. අපිට මෙතන කාටවත් රැකියා දෙන එකේ ගැටළුවක් නැහැ. අපිත් කැමතියි කෙනෙකුට රැකියාවක් ලැබෙනවානම්. අපි කියන්නෙ ඉන්න අයගෙන් ප්‍රයෝජනය ගනිමු කියලා. මෙතන තියෙන ගැටළු ටික විසඳගන්න. නැතුව මෙතන තියෙන්නෙ රැකියා ප්‍රශ්නයක් නෙමෙයි. අපි කැමතියි තව කෙනෙක් සේවයට එනවාට මොකද මනුස්සයෙක්ට තියෙන අයිතියක් රැකියාව කරන එක. එතන ගැටළුවක් නෑ අපි කියන්නෙ තියෙන මිනිස්සුන්ගෙන් වැඩක් අරගෙන ප්‍රයෝජනවත් දෙයක් කරලා තව ටික කාලයක් ඉවසලා තව රැකියාවක් දෙමු කියන්නෙ සභාවක් විදියට අපි ලොකු මුදලක් හම්බකරන්නෙ නැති නිසා සභාව ඇතුළට. අපිට කැලෑ නීතියවත් එහෙම ප්‍රශ්නයක් නැහැ. අපිත් කැමතියි මනුස්සයෝ රස්සාවට එනවාට හැබැයි ලැබෙන්න ඕනෙ ඉන්න අයගෙන් වැඩක් කරගෙන. ඉන්න අය හැංගිලා ඉන්නවානම් ඒකෙන් වැඩක් නැහැ. අපිට ඉන්න සේවකයොත් වැදගත්. ඒ සේවකයාට අපි වගකියනවා. ඒ සේවකයා වැඩ කළාට පස්සෙ තව සේවකයෙක් ගන්න අපිට ගැටළුවක් ඇති වෙන්නෙ නැහැ කියලා මම හිතනවා. ඔබතුමාගේ මේ යෝජනාවට අපේ විරුද්ධත්වයක් නැහැ. මංජුල මන්ත්‍රීතුමා කිව්වා වගේ මේක කෙරෙනවා දකින්න විපක්ෂයේ මන්ත්‍රීවරුත් කැමතියි. බොහොම ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය.**

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරියක් වශයෙන් අපේ සභාපතිතුමා යම්කිසි යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා ඒක ඉතාම කාලෝචිතයි. අනාගතයේදී ඉතාමත් ප්‍රයෝජනවත් වියහැකි යෝජනාවක් කියලා අපි 100% ක්ම පිළිගන්නවා. නමුත් හෘද සාක්ෂියට එකඟව ජනතාවගේ ඡන්දයෙන් පත්වෙච්ච මන්ත්‍රීවරියක් විදියට යම්කිසි ව්‍යාපෘතියක, යම්කිසි යෝජනාවක අඩුපාඩුවක් තියෙනවනම් ඒ පිළිබඳව පෙන්වාදීමේ වගකීමක් අපිට තියෙනවා කියලා අපි හිතනවා. ඒ අනුව මම කියන්න කැමතියි. මෙතන වැඩ ඒකකයේ කාර්ය මණ්ඩලයට ඔබතුමා යෝජනා කරන වැඩ එක්කයේ කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීමට පමණක් වර්ෂයකට රුපියල් ලක්ෂ 50 කට ආසන්න ප්‍රමාණයක් ඔබතුමාම පසුව සඳහන් කරලා තියෙනවා ''මෙම කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීම ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවීමට අපේක්ෂා කරන අතර" කියලා දැනට ඒ විදියට ඔබතුමාගේ ධූර කාලයේ මේ අවුරුදු 4කට අපි ගණන් හැදුවොත් ඒ ලක්ෂ 50 ගානෙ අවුරුදු හතරකට දීම පිළිබඳව ප්‍රායෝගිකව ගැටළුවක් තියෙනවා නේද කියලා අහන්න කැමතියි. ඒ වගේම ඔබතුමා මම මේ කරුණාකරලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා අපේ සභාපතිතුමාට විරුද්ධ වෙනවා නෙවෙයි එතුමා බොහෝම ගරු කටයුතු පුද්ගලයෙක් සහ මම පෞද්ගලිකව එතුමාට ගරු කරනවා එතුමාගෙ සමහර තීරණ සම්බන්ධයෙන්. නමුත් වැරැද්ද පෙන්නලා දිය යුතුයි සභාපතිතුමනි, ඒ වගේම ඔබතුමා පහලින් සඳහන් කරලා තියෙනවා ඒ සඳහා 2018 අයවැය මඟින් වැඩ ඒකකය ප්‍රිමික්ස් ඒකකය සඳහා රුපියල් මිලියන 10 ක ප්‍රතිපාදන වෙන්කරලා තියෙනවා කියලා. ඉතින් ඒ 10 අර පනහෙන් අඩු උනොත් එතකොට 40 කට ආසන්න සංඛ්‍යාවක් එතන තව තියෙනවා. ඒ මුදල උපයාගැනීම පිළිබඳව ඒ මුදල කොහොමද මේකට යොදවන්නෙ කියන එක ගැන මේ ව්‍යාපෘතියේ කිසිම සඳහනක් වෙලා නෑ. ඒ නිසා එතනම මෙම ව්‍යාපෘති යෝජනාවම අසාර්ථකයි කියලා කියන්න පුළුවන් කෙනෙක්ට ඕන්නම්.ඒ වගේම ඒ සඳහා විපක්ෂ මන්ත්‍රීවරු යෝජනා කරන මම විපක්ෂ මන්ත්‍රීවරුන්ට සහාය දක්වනවා නෙමෙයි නමුත් විපක්ෂ මන්ත්‍රීවරු යෝජනා කරන විදියට

අපිට ඕනෙනම් අපේ කම්කරුවෝ අපේ සේවකයෝ 184 දෙනාගෙන් මේක අපිට පුළුවන් විදියට සකසුරුවමින් කරගමු කියලා මමත් යෝජනා කරනවා. ඒ වගේම අපිට ඔවුන්ගේ වැඩකටයුතු ඔවුන් මෙච්චර කාලෙකට කරගෙන ආපු වැඩකටයුතු වලට යම්කිසි බාධාවක් වෙනවනම් හෝ ඔවුන්ට අතිකාල දීමනා දෙන්න වෙනවනම් ඒ පිළිබඳවත් අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. මේ ලක්ෂ 49 ලක්ෂ 50 කට ආසන්න සංඛ්‍යාව මේ ව්‍යාපෘතිය පටන් ගන්න ප්‍රාග්ධනයක් විදියට යොදනවානම් ඒ පිළිබඳවත් අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. නමුත් මේක අපි වාර්ෂිකව ගෙවිය යුතුයි. මේ වැටුප්. ඒ නිසා වාර්ෂිකව ගෙවීම පිළිබඳව ඔබතුමා මේ යෝජනා කරන ව්‍යාපෘතිය සාර්ථක වුණේ නැත්නම් යම්කිසි වර්ෂයකදී හෝ සාර්ථක වුණේ නැත්නම් මේ කැඟහන මන්ත්‍රීවරුම එදාට අපිට චෝදනා කරාවි සහ අපේ සභාපති පුටුවට ඔබතුමාට පමණක් නෙමෙයි මේ සභාපති පුටුවට චෝදනා කරාවි කවදාහරි අපේ සභාපතිතුමා කරපු මේ යෝජනාව අසාර්ථකයි සහ මේ ව්‍යාපෘති අපි ව්‍යාපෘතියක් යෝජනා කරනකොට සාමාන්‍යයෙන් විශේෂයෙන් සභාවක සභාපතිතුමා ව්‍යාපෘතියක් යෝජනා කරනකොට ඒ ව්‍යාපෘතිවල සාර්ථක අසාර්ථකභාවය අපේ සභාවේම කාර්යක්ෂමතාවයට කාර්යයක්ෂමද අකාර්යක්ෂමද කියලා තීන්දු කරන්න සාධකයක් බව මතක් කරන්න කැමතියි. ඒ නිසා මේ පිළිබඳව වැටුප් ගෙවීම සහ සේවකයන් අළුතින් බඳවා ගැනීම සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරලා යම්කිසි සංශෝධන ඇතිව මේ ව්‍යාපෘතිය යෝජනා කරනවානම් අපි සම්පූර්ණ සහයෝගය ලබාදෙනවා එහෙම නැත්නම් හෘද සාක්ෂියට එකඟව මට බැහැ මේකට පක්ෂ වෙන්න. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ. ප්‍රදීප් කුමාර් මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මං හිතන්නේ මෙතනදී අවශ්‍යම කාරණාව මතුවුණේ නෑ කියන එකයි මගේ හැඟීම. පක්ෂ විපක්ෂ අපේ සහෝදර මන්ත්‍රීවරු ප්‍රකාශ කළේ සමහරක් කට්ටිය කිව්වා මේක අවශ්‍යයි කියලා සමහරු කිව්වා අවශ්‍ය නෑ කියන කාරණය. මට වැදගත් වෙන්නෙ ඒක නෙමෙයි. මෙතෙන්දි අපි බලන්න ඕනෙ මෙතනින් ඔබතුමා හුවාදක්වන්න උත්සාහ කරන කාරණාව තමයි දැනට මේ ඉන්න සේවක ප්‍රමාණයෙන් සම්පූර්ණයෙන් කර්යක්ෂමව වැඩ කරනවා. ඒත් අපිට තව සේවකයෝ මදි. අපි මේ සභාවට පෙන්වා දිය යුතු කාරණාව තමයි විද්‍යාත්මකව දැනට මේ ඉන්න සේවකයෝ ප්‍රමාණය උපරිමයෙන් වැඩ කරනවා සහ ඔවුන්ගේ දායකත්වය උපරිම ලබාදෙනවා. හැබැයි අපිට ඒත් තව කරන්න වැඩ කොටසක් තියෙනවා. නැත්නම් මේක රස්සාව අපිට හම්බවෙනවාද අරයට හම්බවෙනවද කියන එක නෙමෙයි මන්දා මටනම් එක රස්සාවක්වත් එපා. දෙපැත්තකට බෙදිලා රණ්ඩුවෙන්න ඕනෙ කාරණාවක් නෙමෙයි. අපි විද්‍යාත්මකව මේ අයට පැහැදිලි කරලා දියයුතුයි නැත්නම් මේකට විරුද්ධ වෙන අය විද්‍යාත්මකව තහවුරු කරලා දියයුතුයි. මේ ඉන්න අයගෙන් සම්පූර්ණයෙන් කාර්යක්ෂමව වැඩ වෙන්න නැහැයි කියලා. එතකොට මං හිතන්නේ යෝජනාව සම්බන්ධයෙන් ඔබතුමාගේ පැත්තෙන් මේ ඉන්න සේවකයෝ 50 දෙනාගෙන් අපි උපරිමයෙන් වැඩ ගන්නවා. හැබැයි අපිට තවත් කරන්න යම් කාර්යභාරයක් තියෙනවා. ඒ කියන්නෙ ඔවුන් උපරිමව මේකට දායක වෙනවා. ඒ නිසා අපිට තවත් සේවකයෝ ප්‍රමාණයක් ගන්න වෙනවා. විපක්ෂය පැත්තෙන් මං හිතන්නෙ අපි පෙන්වා දියයුතුයි මේ ඉන්න සේවකයන්ගෙන් උපරිමව කාර්යක්ෂමව වැඩ කෙරෙන්න නෑ. ඒක නිසා මේ අයගෙන් උපරිමයෙන් කාර්යක්ෂමව වැඩගන්න කියලා. නැතුව දෙපැත්තකට බෙදිලා කට්ටියක් ගන්න කියනවා ගන්න එපා කියනවා. පොදුවේ මං හිතනවා ඔබතුමා මේ කාරණය ගැන අධ්‍යයනයක් කරලා මේ යෝජනාව කරන්න ඇත්තෙ. ඒ නිසා මම ඔබතුමාව විශ්වාස කරනවා. ඔබතුමා විශ්වාස කරනාවනම් මේ ඉන්න 50 දෙනාගෙන් උපරිම සේවයක් වෙනවා කියලා. ඔබතුමා විශ්වාස කරලා ඔබතුමාගේ යෝජනාවට අපිත් සහයෝගය දක්වනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ප්‍රසන්න මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මම මේ සභාවට යෝජනා කරනවා මේ යෝජනාව අත්‍යවශයෙන්ම මේ සභාවට අවශ්‍ය කරන කාරණාවක්. ඇත්තවශයෙන්ම මේ ප්‍රදේශයේ මාර්ග පද්ධතිය විශාල විනාශයකට ලක්වෙලා තියෙන්නේ. කොපමණ මුදල් ප්‍රමාණයක් ඒ සංවර්ධන කටයුතු සඳහා යෙදෙව්වාට පාරවල් හැදුවාට ඒවායේ නඩත්තු කටයුත්තක්

සිද්ධවෙන්නෙ නැහැ. සේවක සංඛ්‍යාව මදි කියන කාරණාවත් අපිට බලපානවා. ඒ වගේම මම යෝජනා කරනවා මේ යෝජනාවට තව එකතු කරන්න කියලා අපි ලක්ෂ 3, 4, 5 වගේ කොන්ත්‍රාත් මේ සභාව මඟින් අපිට ලැබෙනවා. ඒ කොන්ත්‍රාත් අපේ සභාව මඟින් කරන්න පටන් ගත්තොත් මේ වැඩ ඒකකය මඟින් එතකොට ලක්ෂ 50 ප්‍රමාණය යන්නෙ නැති වෙන්න පුළුවන්. ඒ නිසා ඒක හදාගන්න ක්‍රමවේදයකට අපිට යන්න පුළුවන්. ඒ නිසා මං කියනවා මේ අළුත් රැකියාවල් ටික දෙනවයි කියන එකේ වරදක් මට පේන්නේ නැහැ. රස්සාවල් ටිකක් අපේ ගම් ප්‍රදේශවල මිනිස්සුන්ට අපි දෙන්න ඕනෙ. ඒ නිසා ඒකත් අපි කරලා මේ අහල පහල ගම්වල අහිංසක සේවකයෝ ටිකක් තමයි මේ රස්සාවල් වලට එන්නෙ. ඒ නිසා ඒකට අපි අර කොන්ත්‍රාත් සභාව මඟින් අරගෙන පිටට නොදී එතකොට අපි වැඩ ඒකකය මඟින් ඒ කොන්ත්‍රාත් ටික ඉස්සරහට කරගෙන ගියොත් අපිට ලක්ෂ 50 ක් යන එකක් නැහැ මං හිතන විදියට. ඒක හින්දා කල් මරන්නෙ නැතුව මේ යෝජනාව සම්මත කරගෙන ඉස්සරට අපේ බල ප්‍රදේශය තුළ මාර්ග පද්ධතිය බේරගන්න පුළුවන් කියලා. මේ යෝජනාවට අපේ පූර්ණ සහයෝගය ලබාදීමට අපි කටයුතු කරනවා කියලා පවසමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාලනී චන්ද්‍රලතා මැතිතුමිය.</u>

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ යෝජනාවට අපි විරුද්ධ වෙන්නෙ නෑ. අපි කැමතියි යම්කිසි සේවකයෙන් මේ සභාවට බඳවා ගන්නවට. නමුත් මේ යෝජනාව ගෙනාපු කාලය තමයි අපි මේ කල්පනා කරන්නේ. අපේ නන්දකුමාර සහෝදර මන්ත්‍රීතුමා කිව්වා පාරවල්වල දිග පළල අඩුවෙනවා කියලා කොන්ත්‍රාත් කරනකොට. අපි දන්නවා එතුමා ඒ ගැන බොහෝම හොඳින් දන්න කෙනෙක්. ඒ නිසා ඒක ගැන අපිට ප්‍රශ්නයක් නැහැ. අපි අවිවාදයෙන්ම ඒක පිළිගන්නවා. ඉතින් ගරු සභාපතිතුමනි, දැන් ඔය කියන විදියට වැඩ ඒකකයේ 50 දෙනෙක් ඉන්නවා නම් මම හිතනවා අපි තවදුරටත් ඒ අය ලවා අපේ වැඩ ඒකකය සම්බන්ධ කටයුතු කරගෙන මංජුල මන්ත්‍රීතුමා කිව්වා වගේ අපි මාස 06 ක් වත් ඉදිරියට ගිහිල්ලා ඔබතුමා ඒ කටයුත්ත කරනවානම් අපි ඔබතුමාට ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන්නට සූදානම් කියන එක පවසමින් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමා, උපසභාපතිතුමා ඇතුළ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම මේ යෝජනාව සම්බන්ධයෙන් වැඩි අදහසක් ප්‍රකාශ කරන්නෙ නැහැ. නමුත් සභාපතිතුමාගේ පළමු යෝජනාව වෙනුවෙන් අපි අදහසක් ප්‍රකාශ කරන්න ඕනෙ. ප්‍රථමයෙන් මෙම වැඩ ඒකකය පිළිබඳව අපේ අදහස් ප්‍රකාශ කරපු මන්ත්‍රීවරු බොහෝ දෙනෙකුට තාම හිතන්නෙ හරිහැටි කියවලා අවබෝධ කරගෙන නැති බව මට පෙනී යනවා. ඒ නිසයි මේ එක එක්කෙනා ප්‍රකාශ කරන්නේ. නමුත් මේ වැඩ ඒකකය හොඳම උදාහරණය අපේ අල්ලපු නගර සභාව ඔබතුමන්ලාගේ නගරාධිපති ලාල් පිංතු මහත්තයා ක්‍රියාත්මක කරපු වැඩ ඒකකය හොඳට අධ්‍යයනය කරන්න අවිස්සාවේල්ල නගර සභාවේ. ඉතින් නගර සභාවේ සියයකට වැටුප් දෙන්න පුළුවන් තරම් වැඩ ඒකකය ඒගොල්ලො ඉතා සාර්ථකව කරගෙන යනවා. අපිට ඊට වඩා ආදායමක් උත්පාදනය කරන්න පුළුවන්. ගරු සභාපතිතුමනි මං හිතන්නේ ඒ ගැන ඕගොල්ලෝ පටු ආකල්පයකින් හිතන්න එපා. මං ඉල්ලීමක් කරන්නේ පොඩ්ඩක් නගර සභාවේ යන වැඩ ඒකකය ගැන අධ්‍යයනය කරන්න. ඒකෙ කෙරෙන්නේ අපිට සියලුම රජයේ ආධාර සහ ප්‍රාදේශය සභාව යටතේ තියෙන ව්‍යාපෘති 2017 රජයේ ආධාර 154 ක් කරලා තියෙනවා අපේ ප්‍රාදේශීය සභාවේ. ඒ වගේම අපේ සභා අරමුදලින් 80 ක් කරලා තියෙනවා. මේ ව්‍යාපෘති ගැන හිතන්න මීන් අඩක්වත් අපේ වැඩ ඒකකය මඟින් කළොත් මොනතරම් ලාභයක් ලැබෙනවද කියලා. ඔබේ ප්‍රදේශයේ මේ කොන්ත්‍රාත්කරුවා කරලා තියෙන ව්‍යාපෘතිවල සාර්ථකත්වය බලන්න ඒගොල්ලො මොනතරම් ලාභයක් ලබන්න ඇතිද? අපිට කොච්චර ලාභයක් ලබන්න පුළුවන්ද. එයින් නඩත්තු කරන්නෙ අහිංසක ජීවිත 12ක් විතරයි. තවත් යොදාගන්නේ 12 දෙනෙක් විතරයි. ඒත් අධ්‍යාපන මට්ටම වැඩ කරන්න පුළුවන් මිනිස්සු. වැඩ ඒකකයට ගන්නෙ වැඩ කරන්න පුළුවන් මිනිස්සු. කලිසම් ඇඳගෙන මෙතන ඉන්න මිනිස්සු නෙමෙයි. මං හිතන්නෙ

අපේ මන්ත්‍රීවරු කියන්නෙ අරම කළොත් ඒ තත්වයට පත්වෙයි කියලා. එහෙම වෙන්න එපා සභාපතිතුමනි, ගන්න කම්කරුවා ඒ වැඩ ඒකකයට යොදවන්න ඕනෙ. ඒකයි මගේ නම් ඉල්ලීම. වැඩ ඒකකයට යොදවලා මං හිතන්නේ අපිට යන්ත්‍ර සූත්‍ර ලැබිලා තියෙනවා. ඒවායින් අපි වසර 3 ක්ම වැඩ ගත්තේ නෑ. ලේකම්තුමා දන්නවා. ඒ මෝටර් ග්‍රේඩරයෙන් අපිට පාර දෙපැත්ත සුද්ධ කරන්න පුළුවන් අර කම්කරුවොත් යොදාගෙන. මේ මමනම් වැඩියෙන්ම යෝජනා කරන්නෙ මාර්ග පිළිසකර කරනවා කාණු කපනවාට වඩා අපේ පොදු අරමුදලින් හා රජයෙන් එන ආධාර වලින් ඒ ව්‍යාපෘතියක් මේ වැඩ ඒකකයෙන් කරලා යම්කිසි ප්‍රතිලාභයක් ලැබුනාම මං හිතන්නේ 12 දෙනෙක් නෙමෙයි 100 ක් නඩත්තු කරන්න පුළුවන් කම්කරුවෝ අපේ ප්‍රාදේශීය සභාවට එන ව්‍යාපෘති වලින්. ඔබතුමන්ලා ආණ්ඩුවෙන් සල්ලි පොම්ප කරයි හෙට අනිද්දා. අපි වැඩකරලා අපේ අහිංසක මිනිස්සු ටිකක් ජීවත් කරවන්නම්. මං හිතන්නෙ ගමට රටට වැඩදායී ගොඩක් කාලයක් පවතින ව්‍යාපෘතියක් කරන්න. මං හිතන්නෙ සභා කර්මාන්තයක් කළාම සභා කම්කරුවෝයොදවලා අපි දැකලා තියෙනවා ඉතාම සාර්ථකයි. මම ඉල්ලීමක් කරන්නෙ අපේ අල්ලපු නගර සභාවෙත් කෙරෙන මේ ව්‍යාපෘතිය ගැන පොඩ්ඩක් හොයලා බලලා අහලා බලලා අපිත් එක්ක සම්බන්ධවෙලා මේකට සහයෝගය දක්වන්න කියන ඉල්ලීම කරමින් මෙය ඉතාමත් කාලෝචිත යෝජනාවක් බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, මේ ව්‍යාපෘතිය අපිට ලැබුණ වෙලාවේ මේක ගැන අධ්‍යයනයක් අපිත් කළා. විශේෂයෙන් මේ ව්‍යාපෘතිය පිළිබඳ වැදගත්කම අපි බලන්න ඕනෙ මේකට යන පිරිවැය වගේම මේකෙන් මහජනතාවට වන සේවය මොකක්ද කියන එක. මම නියෝජනය කරන කොට්ඨාසය විශේෂයෙන්ම භූ විෂමතාවය ගත්තම කඳුම තමයි තියෙන්නෙ. සමහරක් ගෙවල් තියෙනවා මිනී පෙට්ටිය ගෙදරට ගෙනියගන්න බෑ ඒවා මැදින් කාණු 4 ක් විතර තියෙනවා පාරේ. දෙපැත්තෙනුත් කාණු හදලා මැදිනුත් වතුර පාරවල් දෙක තුනක් යනවා. කාණු හතරයි. පයින් විතරයි යන්න පුළුවන්. ඉතින් මිනිස්සුත් අපෙන් ඉල්ලුවේ මේ පාර හදලා දෙන්න වගේ වැඩ ටිකක් තමයි අපෙන් බලාපොරොත්තු වෙන්නෙ මේ ප්‍රාදේශීය සභාව හරහා. ඉතින් ඒ වගේ සුළු වැඩක් හරි හදිසියකට හරි මිනිස්සුන්ට ගිහිල්ලා මේ වගේ කණ්ඩායමක් එක්ක ගිහිල්ලා මේ කොට්ඨාශ විසිහයේම කරලා දෙන්න පුළුවන්නම් අන්න ඒ කාර්යයයේ තියෙන වටිනාකම තමයි මේ ව්‍යාපෘතියත් එක්ක ගලපගන්න ඕනෙ. එහෙම නැතුව මුදල් වලින් තියෙන වටිනාකමට වඩා ඒ මිනිස්සුත් එක්ක සම්බන්ධ වෙන්න මිනිස්සුන්ට ලැබෙන සේවය එක්කයි කතා කරන්නට ඕනෙ. ඉතින් මේ සභාවේ සේවකයෝ ඉන්නවායි කියනවානම් වැඩ කරන්නේ නැති හරි අතිරික්ත සේවකයෝ හරි ඉන්නවනම් සේවකයින්ගෙන් නියම කාර්යය කරගන්නේ නැතිනම් පරිපාලන වශයෙන් බලලා යම් නිදහස් කරගන්න පුළුවන් සේවකයෝ ඉන්නවානම් ඔවුන්ව නිදහස් කරලා මේ ඒකකයට යොදාගැනීමත් ගැටළුවක් නැහැ. නමුත් එසේ නොමැතිනම් කාර්යක්ෂමව යනවානම් ඉන්න සේවකයෝ නියමිත කාර්යයන්වල යෙදෙනවනම් හොඳ ශක්තිමක් සේවකයෝ මේ සඳහා අවශ්‍යයි. පාරවල්වල මේ මැෂින් එක්ක ගිහිල්ලා ඒ මැෂින්වලට කරන්න බැරි වැඩ ටික තමයි ශ්‍රමයෙන් කරන්න ඕනෙ. ඉතින් මේ ව්‍යාපෘතියට මුදල් උපයාගැනීම සඳහා ඉදිරියට ගෙනයාම සභාපතිවරයෙක් විදියට සහ ඒ දක්ෂතාවයත් තියෙන්නට ඕනෙ. ඒ අරමුදල් වියදම් කිරීම සහ සම්බන්ධ කරගැනීම සම්බන්ධව. මම මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නවක මන්ත්‍රීවරයෙක් විදියට මම බොහෝම සතුටුවෙනවා. මොකද මට කරන්න පුළුවන් මගේ කොට්ඨාසයේ යම්කිසි කැඩිච්ච බිඳිච්ච පාරක් තියෙනවානම් අපිට ඒවට මුදලුත් නැතිනම් ඔයවගේ ශ්‍රමය යොදවලා යන්ත්‍රයක් යොදවලා පාර පිළිසකර කරලා දෙනවානම් මං හිතන්නෙ ප්‍රජාවත් අපිත් එක්ක එකතුවෙයි. ඒ යනකොට අපි මේ කණ්ඩායමයි ඒ ප්‍රජාවත් එකතු කරගෙන ප්‍රජා මූලිකව මිනිස්සුත් එක්ක එකතු වෙලා මේ ප්‍රාදේශීය සභාවේ නමත් එක්ක මේ ව්‍යාපෘති කරනවානම් වඩා හොඳ සේවාවක් මේ ප්‍රාදේශීය සභාව තුළින් මිනිස්සුන්ට කරන්න පුළුවන්. ඒ මිනිස්සුන්ගෙන් ලැබෙන ඇගයීම තමයි අවසාන වශයෙන් මේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ට ලැබෙන ජනතා නියෝජිතයෝ විදියට ලබාගන්න ජයග්‍රහණය. ඒ හින්දා මොන ගැටළු තිබ්බත් මේකට සේවකයෝ 12 ක් ගන්න එක වැඩිනම් ඔබතුමා බලන්න අනිත් වැඩ ඒකකවල ඉන්න ශක්තිමත් කම්කරුවෝ කැමතිනම් මේකට

බඳවාගන්න. රැකියාවල් දෙන එකට වඩා වැඩි යමක් මේ තුළ තියෙනවායි කියන එක මම අවධාරණයකරනවා. ඒක හින්දා මේක හැකි ඉක්මණින් ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත අරුණ කුමාර් මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. මම කවුරුත් කතා නොකරපු පැත්තක් මතක් කරන්න උත්සාහ කරන්නේ. දැන් මේ සියලු දෙනාම කතාකරනවා මේ රැකියා 12 ක් ගැන. අන්තිමටම අල්ලාගෙන තියෙන්නෙ වලිගයේ අගින් අල්ලගෙන දැන් හතරවටේ කරකැවෙනවා. දැන් තමන් වටේ කරකැවෙනවා කොටියා අල්ලගත්තා වගේ තමයි කරකැවෙන්නේ. මේක මේ පුංචිම කතාවක්නේ. මේ සීතාවක ප්‍රාදේශීය සභාව තුළ මේ බලප්‍රදේශය තුළ මේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු දන්නවා ගරු සභාපතිතුමා ඇතුළු කොයිතරම් ජන සංඛ්‍යාවක් ඉන්නවාද කියලා. මේක බෙදලා බලන්න 12න්. 12 න් බෙදුවම ලැබෙන උත්තරය මොකක්ද ඉතාම ඉතාම දශම දශම ගණනක උත්තරයක් ලැබෙන්නේ. ඇයි මේ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තියෙන භූමි ප්‍රදේශය ඉතා විශාල භූමි ප්‍රමාණයක්. කථාවට මුලින් පටන් ගන්නකොටනම් කියනවා මේ සීතාවක අවිස්සාවේල්ල ආසනය සීතාවක කියන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙන් ඉතා විශාල භූමි ප්‍රමාණයක්លු. රැකියා 12 ක් දැක්කම හතර ගාතේ දාලා වැටෙනවා. වැටිලා කල්පනා කරනවා මේකෙන් එකක් මට එන්නෙ නෑ නේද මගේ සාක්කුවට එන්නෙ නෑ නේද කියලා. ඕකෙ තවත් පැත්තක් මේ කතාවට උඩගෙඩි දෙනවා මොන විදියටද අනේ මට තේරෙන්නෙ මේකෙ මුදල් ටික කොහොම උපයගන්නවද කියලා. පහුගිය දවස්වල ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි සීතාවකපුර නගර සභාවේ එක බල ප්‍රදේශයක් තිබුනා එක කොට්ඨාසයක් තිබුණා කෝටි 3 කට වැඩිය මුදල් ප්‍රමාණයක් දාලා වන් මිනිට් (one minute) උදේ බලනකොට නැති කාපට් හවසට තියෙනවා. හවසට නැති කාපට් රෑට තියෙනවා. එළිවෙනකන් කාපට් දැම්මා. මේවාත් මේ සභාව තුළ කතාකෙරෙන්න ඕනෙ. අපි මහපොළවේ යථාර්තයක් වෙන්න නම් මහපොළවේ පය ගහලා ජීවත්වෙන්න ඕනෙ. මේකෙ විතරක් නෙමෙයි අල්ලපු නගර සභාවේ වෙන්නෙ මොකක්ද කියලා බලන්න ඕනෙ. අපි තර්ක කරනවා කොටියාගෙ වලිගෙන් අල්ලගෙන 12 දෙනෙක් අල්ලගෙන වටේ කැරකෙනවා. මෙතනම 43 දෙනෙක් ඉන්නවා. ඒ නිසා රැකියා 12 බෙදලා බලන්න මෙතන ඉන්න මංජුල මන්ත්‍රීතුමාගෙන් ඇහුවොත් මමදන්නෙ නැති නිසා මේකෙ කොච්චර ජනතාව ඉන්නවද කියලා එතුමා කියාගෙන ගියා හරියට මගෙ කනට ආවේ නෑ. ඒ නිසා මංජුල මන්ත්‍රීතුමනි, බෙදලා බලන්න බැලුවහම කොපමණද කියලා දශම දශම දශම ගාණක් නේද කියලා පුංචි තර්කයක් විතරයි. මං අවසර ඉල්ලනවා සභාපතිතුමාගෙන් මේ වැඩ ඒකකයේ වටිනාකම කොච්චරද කියලා කියන්න එක උදාහරණයක් දක්වන්න මේ ෆෝන් එක මදකට පාවිච්චි කරන්න අවසර දෙන්න. මංජුල මන්ත්‍රීතුමානම් කැමති නෑ. නමුත් මට පෙන්නන්න ඕනෙ මෙන්න වේරගොල්ලේ වහින වෙලාවට මේ දැඩි වර්ෂාව නෙමෙයි. වේරගොල්ලේ අපේ මන්ත්‍රීතුමා කිව්වා වගේ මෙන්න පාරවල්වල ජලය ගලනවා. මේක වාරිමාර්ග ද මහා මාර්ග ද එහෙම නැත්නම් මොකක්ද කියලා මට කියලා දෙන්න. මේ මගේ ගේ ඉස්සරහින් යන්නේ. මේ තියෙන්නෙ තව එකක් තියෙනවා හුම්මානය. මේ පුවක්පිටිය දකුණ කනිෂ්ඨ විද්‍යාලයේ එක ගොඩනැගිල්ලක පාදම මතුවෙලා තියෙනවා අඩි 6 කට වැඩිය. සම්පූර්ණ හෝදා පාළුවට ලක්වෙලා. පහන ළඟ ඇලට තමයි මේ ටික බහින්නෙ. මේ උදාහරණ දෙකක් විතරයි. ඒ නිසා මේක මේ විදියට කාලය නාස්ති කරන්න එපා කාලය මරන්න එපා. ඒ නිසා කාලය මරන්නෙ නැතුව 12 දෙනයි ගන්න තියෙන්නේ. මට ඒ එකක්වත් එපා. මට රැකියා තියෙනවා. ඒ නිසා සුදුසු රැකියාව අවස්ථා 12 ක් හදලා දීලා සල්ලි නැත්නම් අර මැතිවරණය වෙලාවේ ගෙනත් හලපුවයි ටිකක් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ගෙනත් දෙන්න කියලා කරුණාකරලා මේක ක්‍රියාත්මක කරන්න. සභාපතිතුමාගේ උත්සාහයට අපි සුබ පතනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යසරු රාජපක්ෂ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, ඔබතුමා ගෙනාපු මේ යෝජනාව සම්බන්ධයෙන් කරුණු කීපයක් දක්වන්න මට අවසර දෙන්න. අතීත කථාවක් එක්ක මම ගන්නම්. එදා 1997 මගේ පියා ප්‍රාදේශීය සභාවට පත්වෙලා ඒ පත්වීමත් එක්ක එතුමාට අවස්ථාව තිබුණා ගම් ප්‍රදේශය සමඟ සියලුම මං මාවත් මාර්ග දෙපස එළිපෙහෙලි කරලා ඒ කටයුතු කරන්න හැකියාව

තිබුණත් අන්තිමට ඒ කටයුතු කරගන්න බැරි වුණා. මොකද ඒ වෙනකොට වැඩ ඒකකයක් සහ ඒ අවශ්‍ය වෙන කම්කරුවෝ සිටියේ නැති නිසා. මගේ තාත්තා එතකොට මට මතකයි තමන්ගේ වාහනයේ අපේ ඒ ඉන්න සේවකයොත් දාගෙන අපේ වතුවල වැඩකරපු සේවකයොත් දාගෙන ගිහිල්ලා තමයි ඒ තමන්ගේ ඒ අවශ්‍ය මංමාවත් හදන්න ඒ දේවල් සිදුකළේ. ඇත්තටම සභාපතිතුමනි මේ වැඩ ඒකකය විදියට ඔබතුමා ගෙනල්ලා තියෙන යෝජනාව සම්බන්ධයෙන් අපි දකින්න ඕනෙ අපි පාරකට වසරකට ලක්ෂ ගාණක් මිලියන ගාණක් ප්‍රාදේශීය සභාව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඇතුළු ඒ සියලුම ආයතන වලට අපි රජයේ මහා ආණ්ඩුවෙන් සහ පළාත් සභාවෙන් අපි යෝජනා ගෙනල්ලා මාර්ගවලට කාණුවලට පැති බැමි වලට බෝක්කු ආදියේ සියලු සංවර්ධන කටයුතු සඳහා මුදල් වෙන් කරනවා. විශේෂයෙන් සඳහන් කරන්න ඕනෙ බෝක්කු සහ පැති බැමි වලට අමතරව එක පාරකට මම දන්නා තරමේ වසරකට දෙපාරක් හෝ තුන්පාරක් තාර දානවා නැත්නම් කොන්ක්‍රීට් දානවා. ඒකට ඇත්තටම හේතු වෙන්නේ ව්‍යාපෘතියේ ඒ සිදුකරන අක්‍රමිකතා. ඒ කොන්ත්‍රාත් ගන්න පුද්ගලයෝ සහ ගිවිසුම්ගතව යන ඒ කටයුතුත් සමඟ කොන්ත්‍රාත්කරුවාගේ තියෙන තමන්ගේ ලාභ ඉපයීමේ ඒ අවශ්‍යතාවය මත ඒ මාර්ගවලට අවශ්‍ය නිසි ප්‍රමිතියට අවශ්‍ය ප්‍රමාණයට තාර හෝ කොන්ක්‍රීට් වැටෙන්නෙ නෑ. ඒ එක කාරණයක්. අනික් කාරණය විදියට මං දකිනවා මාර්ග එළිපෙහෙළි කිරීම. මොකද පාරක් හැදුවොත් අනිවාර්යයනේම වතුර බහින්න බැහැ. වැස්සක් වැස්සොත් කාණුවෙන් වතුර බහින්න ඕනෙ. මේ කාණු පද්ධතිය නිසියාකාරව සකස් කරන්නට මං හිතන්නේ පහුගිය කාලයේදී අපිට ජේ.සී.බී. යන්ත්‍රයක් ලැබුණා. නමුත් ඒ ජේ.සී.බී. යන්ත්‍රයෙන් පාරවල් කැපුවොත් ඒ පාර ඇත්තටම වළක් විදියට තමයි පේන්නෙ. ප්‍රායෝගිකව කල්පනා කරලා බලන්න ඕනෙ ඒ යන්ත්‍ර සූත්‍ර වලින් ප්‍රායෝගිකව මේ කටයුත්ත කරන්න බැහැ. ඉතින් ඔබතුමා කියනවා මේ යෝජනවා සම්බන්ධයෙන් කම්කරුවෝ යොදාගෙන තමයි මේ කටයුත්ත කරන්න වෙන්නෙ. තව මේ යෝජනාවේ ගැබ්වෙලා තියෙනවා මේ පාරවල් කාණු බෝක්කු වලට අමතරව ගොඩනැගිලිවල අළුත්වැඩියාවන් සම්බන්ධයෙනුත් මේ යෝජනාවෙ ගැබ්වෙලා තියෙනවා මේ ස්ථාපිත කරන වැඩ ඒකකය සම්බන්ධයෙන්. අපි පහුගිය කාලෙ වැඩ කරනකොට ප්‍රාදේශීය සභාවේ ඉඩම් වලට තියෙනවා ප්‍රජාශාලාවකට හෝ මොකක්හරි දෙයකට අපි අළුත්වැඩියාවක් කරගන්නකොට ඒකටත් අපිට කොන්ත්‍රාත් එකක් විදියට තමයි යෝජනා දෙන්න තිබුණේ. නමුත් ඔබතුමා ගෙනාපු මේ යෝජනාවේ ඒ දේ නැතිවෙනවා. මොකද අපිට කොන්ත්‍රාත් ගිවිසුම්ගත වෙන්න අවශ්‍ය නැහැ. ඒක අපිට වැඩ ඒකකය හරහාම කරගන්න පුළුවන්. අනික් කාරණය මේ මන්ත්‍රීවරු කම්කරුවෝ ගැන කතාකළා, වැඩක්ෂේත්‍ර කම්කරුවෝ ගැන කථා කළා, සෞඛ්‍ය කම්කරුවෝ ගැන කථා කළා. මං හිතන විදියට මේ ඉන්න මන්ත්‍රීවරු එක්කෙනෙක්වත් වර්තමාන කම්කරුවන්ගේ තත්වය පිළිබඳව ඇත්තටම අවබෝධයකින් කතා කරනවා ද කියලා මට සැකයි. මොකද මේ ඉන්න කම්කරුවෝ දිහා බැලුවාම මේ සේවකයෝ 184 ක් ඉන්නවා කම්කරුවෝ ටික පාරට දැම්මොත් එහෙම මං හිතන්නෙ ඔෆිස් එකේ වැඩ කරන්න කවුරුවත් නැති වෙනවා. ඒකත් තේරුම් ගන්න ඕනෙ. මොකද ඒ පත්වීම් හැටියට තිබුණත් පාරට දාන්න වෙන්නේ සාරි ඇඳගෙන නැත්නම් ටයිකෝට් දාගෙන අපේ ඔෆිස්වල ඉන්න අය. මම ඒක වැරැද්දක් විදියට දකින්නෙ නැහැ. නමුත් ඒ කටයුතුත් සිද්ධ වෙන්න ඕනෙ. නමුත් ඒ තියෙන විෂමතාවය කොහොමද කියලා මම අධ්‍යයනය කරන්න ඕනෙ. ඉතින් අනිත් කාරණය තමයි සමහර කම්කරුවෝ ඇත්තටම වයසට ගිහිල්ලා. අපේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ගෙන් ප්‍රකාශ වුණා මේ කම්කරුවෝ කොහෙද ඉන්නෙ කියලා. ඉතින් ඒ කම්කරුවෝ භාගයක් චන්ද්‍රසිරි සභාපතිතුමාගේ කාලේ බඳවාගත්ත කම්කරුවෝ ටික බහුතරයක් මං හිතන්නේ එක්කො වලේ. වලේ කියන්නේ ඒගොල්ලො වයස්ගත වෙලා මියගිහිල්ලා තියෙනවා. ඉතින් ඒක තේරුම් ගන්න ඕනෙ. අනිත් එක මම දන්න විදියට මේ කම්කරුවෙක් එක්ක සමීප සම්බන්ධතාවයක්වත් ඇති කරගන්න අඩුගානේ තේ එකක්වත් අරන්දීලා තියෙනවද කම්කරු කියන කට්ටිය කව්ද කියලාවත් දන්නෙ නෑ මං හිතන්නේ මේ කතාකරන මන්ත්‍රීවරු. ඔබතුමා ගෙනාපු මේ යෝජනාව සම්බන්ධයෙන් අපි එක්සත් ජනතා නිදහස් සන්ධානය විදියට අපේ සහයෝගය පලකරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, ඔබතුමා කරන යෝජනාව පාරවල් සම්බන්ධව නිසා මටත් එක කථාවක් කරන්න අවශ්‍යතාවය තියෙනවා. විශේෂයෙන්ම ඔබතුමා යෝජනාව දාපු ගමන්ම අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු මැව්වා ලොකු ගෝනි

බිල්ලෙක්. දැන් මොකක්ද කම්කරුවෝ 12 ක් ගන්න යනවා කියලා. වැඩේ කෙරෙන්නෙ කොහොමද කියලා නෙමෙයි බැලුවෙ. අපි එකතුවෙලා ලස්සනට කරමු කියලා නෙමෙයි බැලුවෙ. මැච්චෙ ගෝනිබිල්ලෙක්. ඒකට අපේ සමහර අය උඩගෙඩි දුන්න මන්ත්‍රීවරු මන්ත්‍රීවරියන් හිටියා. ඒ නිසා මේ පාරවල් ටිකනම් හදන්නම ඕනෙ. මේක නොහැදුවොත් අපි පහුගිය කාලේ ඡන්ද වලට යනකොට වයසක අම්මලා අපිට පෙන්නුවේ මෙන්න පුතේ පාර. මේ පාරෙ ද ආවේ ඡන්දෙ ඉල්ලන්න කියලා. ඒ නිසා ලොකු ප්‍රශ්නයක් තියෙනවා මෙතන. මේක ඉන්න සේවකයන්ගෙන් හෝ අළුතින් බඳවාගෙන හෝ ඉටුකළ යුතුයි. ඒ වගේම එක දෙයක් අහන්න තියෙනවා ගරු සභාපතිතුමනි ඔබතුමාගෙන් පාරවල් සම්බන්ධව නිසා. හිඟුරල ටෙරන්ස් පෙරේරා මාවතේ ජලසම්පාදන මණ්ඩලයෙන් පාරවල් ටික කපලා ජල නල එලුවා. ඒ වෙලාවේ ව්‍යාපෘතියක් ආරම්භ කරනකොට පාරවල් විනාශ වෙනවානම් ඒකට පාරවල් හදන්න වෙනම මුදල් වෙන්කරලා තියෙනවා. දැනට අපිට දැනගන්න ලැබිලා තියෙන ආරංචි අනුව ඒ විනාශ වෙච්ච පාරවල් ප්‍රතිසංස්කරණය කරන්න ජලසම්පාදන මණ්ඩලයෙන් මුදල් ප්‍රාදේශීය සභාවට ගෙවලා තියෙනවාද කියන එක සමහර අය ප්‍රකාශ කර සිටිනවා. මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. පාර විනාශ වෙනවා බොහෝම වැඩියි. ඉතින් මේකට අපි යනකොට ජලසම්පාදන මණ්ඩලය බනින්නේ මුං මේක හාරලා ගියා මේක කරන්නෙ නෑ කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි මේකෙ සල්ලි ප්‍රාදේශීය සභාවට ලබාදීලා තියෙනවානම් හැකි ඉක්මණින් පාර හදලා දෙන්න කියන යෝජනාවත් කරමින් දැන් අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ගෝනි බිල්ලා ගැන කතාකරනවා. ඔබතුමාලා පොඩ්ඩක් මේ ආණ්ඩුවේ හදවතට කතාකරලා බලන්න මේ ආණ්ඩුව ඔබතුමාලා අද කියන විදියට හැසිරුනා නම් අද මේ රට මේ කිසිම රාජ්‍ය ආයතනයක් පෞද්ගලීකරණය කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ නිසා ඇතුලාන්ත හදවතින් අද රාත්‍රියට ගෙදර ගිහිල්ලාවත් අහලා බලන්න ඒ කියන දේ අපේ ගරුතර ගෞරවනීය පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ අය විසිනුත් සිදුකරනවාද කියන එක පොඩ්ඩක් හිතලා බලන්න කියා ඉල්ලමින් ඔබතුමාට මේ කාර්යය කරගන්න ශක්තිය ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, නවක මන්ත්‍රීවරයෙක් විදියට මම මේ යෝජනාවට බොහෝම පක්ෂව කතාකරනවා. මොකද ගමෙන් ආපු මන්ත්‍රීවරයෙක් විදියට අපි ගම්වලදී පොරොන්දු වුණේ දේශපාලන, රැකියා වගේ කාරණාවලට මේක ලඝු කළයුතු නැහැ. වර්තමානයේ අපේ ගම් ප්‍රදේශවල ගත්තහම සියලුම මං මාවත් කැඩිලා බිඳිලා ගිහිල්ලා කාණු වැහිලා. ඉතින් මෙවැනි තැන් හදාගන්න පුළුවන්නම් ඒක මන්ත්‍රීවරු විදියට අපිට ලොකු ගෞරවයක්. ඒ වගේම ප්‍රදේශයටම ලොකු ගෞරවයක් ලොකු සේවයක්. ගරු සභාපතිතුමනි, ඒනිසා මේවා පුංචි පුංචි දේශපාලන කාරණා වලට යම් යම් අය ලඝු කරන්න සූදානම් වෙයි. කාලෝචිත යෝජනාවක් කාලෝචිත මාතෘකාවක් ඒ නිසා මේ පිළිබඳව සුබවාදී ආකල්පයකින් බලන්න නවක මන්ත්‍රීවරයෙක් විදියට මම කැමතියි. මෙතන මේ මුදල් පිළිබඳ කාරණාවක් නෙමෙයි ඇත්තටම තියෙන්නෙ. මිලියන 50 ක් සමාවෙන්න මිලියන 5 ක් යනවයි කියන එක මුදලින් බැලුවාට මේ මුදල ගෙවන්නේ අවුරුද්දකටම. ඉතින් මේ මුදලින් අපි කරගන්න ඕනෙ කාර්යයත් යම්කිසි මැනීමකට ලක්කරන්න ඕනෙ. උදාහරණයක් විදියට ඒ පුද්ගලයා 1200 ක වැඩකරනවානම් අපි දැනගන්න ඕනෙ 1500 ක වැඩ ගන්න. මෙතන වැඩ පරීක්ෂක කෙනෙක් ගන්නවා 50000 ක් ගෙවලා. ඒ පුද්ගලයාගේ වගකීමත් මේ ආයතන පාලනය කරන නිලධාරියාගෙත් පරිපාලන නිලධාරියා විදියට ජනතාව නියෝජිතයෙක් විදියට පත්කරලා එවපු අපි දැනගන්න ඕනෙ පුද්ගලයින්ගේ කාර්යභාරයන් කරන්න. ඒ නිසා මුදල පිළිබඳ ගැටළුවක් නැහැ. මුදල පිළිබඳ ගැටළුවක් තියෙනවානම් අපි දැනගන්න ඕනෙ ඒක කාර්යක්ෂමව කරගන්න. ඒ වගේම සේවකයින් 184 ක් ඉන්නවා යම් කිසි ප්‍රමාණයක් කම්කරුවෝ විදියට වැඩ කරනවා. ඒ පුද්ගලයෝ යම්කිසි අකාර්යක්ෂම විදියට වැඩකරනවානම් ඒ වගකීම තියෙන්නෙ අපිට. මොකද අපි දැනගන්න ඕනෙ කාර්යක්ෂමව වැඩ කරගන්නෙ කොහොමද කියලා. මෙතන 12 ද 15 ද 10 6 ද කියන එක නෙමෙයි ප්‍රශ්නෙ. අපේ ජනතාවගේ තියෙන ගැටළු විසඳගන්න තමයි අපි ජනතා නියෝජිතයෝ විදියට මෙතනට පත්වෙලා ඇවිත් ඉන්නෙ. මුදල් එකතු කරන්නවත් යම්කිසි ප්‍රතිපාදන පාරවල් හදන්න විතරක් නෙමෙයි මෙවැනි ව්‍යාපෘති කරන්න ඕනෙ. දැනට ඉන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේක ලොකු ප්‍රශ්නයක් නොවෙන්න පුළුවන්. මොකද ඒගොල්ලො බලයට ඇවිල්ලා තියෙන්නෙ කාර් දෙනවා බ්‍රේස්ලට් දෙනවා කියලා. නමුත්

අපිට එහෙම ලොකු පටු ආකල්ප නෑ. අපිට තියෙන්නෙ ගම සංවර්ධනය කරලා අපේ ප්‍රතිපත්තියක් තියෙනවා අපේ දැක්මක් තියෙනවා අපේ මිනිස්සු පිළිබඳව අපි කතා කරනවා වගකීමක් ඇතුව කටයුතු කරනවානම් මේ පුංචි දේවල් වලින් අපිට සෑහීමකට පත්වෙන්න පුළුවන්. මේ පුංචි ප්‍රාදේශීය සභාවක් විදියට. ඒ නිසා මේ වගේ ලසු කරලා ජොෂ්ඨ මන්ත්‍රීවරු විදියට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විදියට මේ වගේ වැරදි පූර්වාදර්ශ ගෙනත් දෙන්න එපා නොමඟ යවන්න එපා යෝජනාවක් තියෙනවානම් ආණ්ඩු පක්ෂයෙන් හෝ වේවා විපක්ෂයෙන් හෝ වේවා හරි දෙයක් කරනවානම් ඒකට සහයෝගය දෙන එක තමයි ජොෂ්ඨත්වය කියන්නෙ ඒක තමයි නායකත්වය කියන්නෙ තමුන්ගේ බුද්ධිමත්භාවය කියන්නෙ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා හිටිනවා මේ හැමදේකම අපිට personal structure එකක් ඒ කියන්නෙ අපිට ඉන්න මිනිස්සු පිළිබඳව යම්කිසි අධ්‍යයනයක් මේ සභාව දැනුවත් කරලා එතකොට මෙතන අතිරික්තයක් තියෙනවානම් අපිට සාකච්ඡා කරන්න පුළුවන් එහෙම ඉන්නවා නම් මේ වැඩ ඒකකයට දාන්න පුළුවන්. අන්න ඒ වගේ යෝජනාවකට අපේ ප්‍රාදේශීය සභාව කරන ව්‍යාපෘති තියෙනවා ඒකට මේ වැඩ ඒකකය යොදවගන්න පුළුවන්. ඒ සෘජු ශ්‍රමික මුදල අපේ ප්‍රාදේශීය සභාවේ අරමුදලක් විදියට ඉතිරියක් විදියට ගන්න පුළුවන්. ඒ වගේ සුබවාදී විදියට මේ යෝජනාව දිහා බලනවානම් අපිට මේ වගේ ලොකු බිල්ලෙක් මවාගෙන කටයුතු කරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. සීතාවක බල ප්‍රදේශ්‍ය තුළ ප්‍රාදේශීය සභාවට අයිති පාරවල් තියෙනවා ඊට එකතුවෙන අතුරු මාර්ගවල් තියෙනවා. සමහර මිනිස්සු පටු කරලා තියෙනවා සමහර මිනිස්සු ඉඩම් ප්‍රමාණ දීලා තියෙනවා පාරවල් ලොකු කරන්න. මේවායින් වතුර ගලාගෙන ඇවිත් පාරදිගේ යනවා. ඊට විකල්පයක් විදියට මේ වැඩ ඒකකය යොදාගන්න පුළුවන්. නැත්නම් මේ පාරකට තාර දාලා නැහැ අවුරුදු 5, 6, 7කට සැරයක්. එතකොට මේ පාරවල් හදලා වැඩක් නැහැ. පාරවල් සම්පූර්ණයෙන් කැඩිලා තියෙනවා. අපිට ඒ අවශ්‍ය ජලනල උපාංග යොදවලා අපිට කරගන්න පුළුවන් ඒ අවශ්‍යතාවය ගැන සුබවාදීව ජොෂ්ඨ ඒ වගේම නවක මන්ත්‍රීවරු හැමදෙනාම බලන්න කියලා. මේ යෝජනාවට සහාය පලකරනවා. මේ යෝජනාව ක්‍රියාත්මක කළොත් හොඳයි කියලා නවක මන්ත්‍රීවරයෙක් විදියට යෝජනා කරනවා. බොහෝම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා</u>

ගරු සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි පළමුවෙන් කියන්නට ඕනෙ මතක් කරන්නට ඕනෙ මේ යෝජනාව සම්බන්ධව. හොඳ යෝජනාවක්. ගරු විපක්ෂය නියෝජනය කරන මංජුල මන්ත්‍රීතුමා කිව්වෙ මේ සඳහා යන වියදම අඩු කිරීම සඳහා යම්කිසි ක්‍රමවේදයක් එතුමා යෝජනා කළේ. එතුමා කිව්වෙ නෑ සේවකයෝ බඳවාගන්න එපා මේ ඉන්න කට්ටිය ඇති. වියදම අඩු කරගැනීම සම්බන්ධව එතුමා යෝජනාවක් කළේ. මේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ වැරදි මතයක් තියෙනවා විපක්ෂය කියන වචනය. ඒක බොහෝම වැරදියි ගරු සභාපතිතුමනි. මොකද මේ සභාවක් නියෝජනය කරනකොට සභාවට ආපු සියලු මන්ත්‍රීවරු හරි දේට හරි කියනවා වැරදි දේට වැරදියි කියනවා. අපිට කොන්දක් තියෙනවා. අපි පැහැදිලිව කියන්න ඕනෙ. ආණ්ඩු පක්ෂයද විපක්ෂයද හරි දේට හරි කියනවා. වැරදි දේට වැරදියි කියනවා. ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෙ මන්ත්‍රීවරුන්ට. මොකද ප්‍රාදේශීය සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් විදියට අපි සියලුදෙනාම මෙතෙන්ට එන්නෙ ජනතා නියෝජිතයෝ හැටියට. පක්ෂ ආරක්ෂා කරන්න නෙමෙයි. ඒක විශේෂයෙන් මතක් කරන්නට ඕනෙ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා ගෙනාපු යෝජනාව හොඳයි හැබැයි ඒකෙ සංශෝධන රාශියක් කළයුතුයි. මන්ද ඉන්න සේවකයෝ තමන්ගේ රාජකාරිය හරියට කරනවද කියන එක. පැහැදිලි කිරීමක් කරන්න ඕනෙ සමහර රාජ්‍ය ආයතන තියෙනවා කම්කරුවා සද්දයි ඉන්න වෙයාර්මන්ට් ට වඩා. ඒක තමයි සත්‍ය කතාව. සාමාන්‍යයෙන් පාසල් පද්ධතිය ගත්තම මේක අදාල නෑ උපකල්පනයක් පමණයි. සමහර පාසල්වල පියුන් ඉන්නවා ප්‍රින්සිපල්ට වඩා ඉහලින්. වැඩක් කෙරෙන්නෙ නෑ මොකද අර ප්‍රින්සිපල් බයයි පියුන්ට. එවැනි තත්වයක් තියෙන නිසා අපේ මංජුල මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කරන්නට ඇත්තෙ බොහෝ දුරට යම්කිසි කාලසීමාවක් අපි මේක කරලා බලමු කියලා. මං නැවතත් මතක් කරනවා විශේෂයෙන් ඔබතුමාගේ යෝජනාව හොඳයි. මොකද අපේ ගම් සුද්ධ කරන්න විශේෂයෙන්ම තුම්මෝදර, ඉලුක්ඕවිට ගත්තහම අද දේශිය සංචාරකයෝ විශාල වශයෙන් ඉන්න ප්‍රදේශයක්. අද වල්බිහිවෙලා තියෙනවා. අපිටත් උවමනාවක් තියෙනවා මේ ඉන්න කම්කරුවෝ එක්ක එකතු වෙලා වැඩක් කරන්න එතකොට අපිටත් ගරුත්වයක් තියෙනවා ප්‍රාදේශීය සභා

මන්ත්‍රීවරු විදියට. ඒ ශ්‍රමය කැපකරලා ඒ සියලුදෙනාත් එක්ක වැඩ කරන්න. පොඩ්ඩක් මේ සියලුම මන්ත්‍රීතුමන්ලා අවධානය යොමුකරන්න විපක්ෂය කියන වචනය භාවිතා කරනකොට ඒ කුමන ආකාරයටද කතාකරන්න ඕනෙ කියලා කල්පනා කරන්න. විශේෂයෙන්ම මතක තියාගන්න මෙතන තියෙන්නෙ ජාතික දේශපාලනයක් නෙමෙයි. ඔබ තමුන්නාන්සේලා එක ගමේ ජීවත්වෙන මිනිස්සු අපි. පක්ෂ භේදය වේදිකාවෙ තියෙන්න පුළුවන්. මං මේ සභාවට ආවට පස්සෙ හරිදේට හරියි කියමු වැරදි දේට වැරදියි කියමු. බොහොම ස්තූතියි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා**</u>

ගරු සභාපතිතුමනි, මම එවෙලේ ඉඳන්ම හොයනවා මේ ඇමුණුම. හොයාගන්න බෑ. ඔබතුමාගේ මේ යෝජනාවේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මෙම ව්‍යාපෘතිය යටතේ මාස 06 ක් ඇතුළත නඩත්තු වෙන මාර්ග පිළිබඳ දත්ත තොරතුරු ඇමුණුම 1 යටතේ දක්වා ඇත. හැබැයි මගේ සභා වාර්තාවේ මම බැලුවා බැලුවා මට මේක හොයාගන්න බැරි වුණා. අර කතා කරපු ගරු මන්ත්‍රීවරුන්ගේ මම දන්නෑ එහෙම තියෙනවද කියලා. මේ යෝජනාවට එකඟ වෙන්න ඉස්සෙල්ලා පළවෙනි කාරණය මෙතන අවසානයට තියෙන කාරණය නැහැ. ඒ නිසා ඒක ලොකු අඩුවක්. අර කිව්වා වගේ කොළේ වහලා ගැහුවා වගේ වැඩක් තියෙනවා එතන නම්. ඒක පිළිගන්න වෙනවා. ඒ නිසා මම කියන්නෙ මේ යෝජනාව බොහෝම හොඳයි. කාලෝචිතයි. අපේ පාරවල් ටික අපි හදන්න ඕනෙ. කිසිම ගැටළුවක් නෑ ඉතාමත් ශක්තිමත් වැඩ ඒකකයක් මේ ප්‍රාදේශීය සභාවේ හදනවා නම් අර අපේ ප්‍රසන්න මන්ත්‍රීතුමා කිව්වා වගේ මේකෙ සේවකයෝ 100 ක් හිටියත් ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඒක නෙමෙයි ගැටළුව තියෙන්නේ අපිට අපේ නගර සභාවේ කාටවත් කොන්ත්‍රාත් දෙන්නේනැහැ. කොන්ත්‍රාත් වලින් තොරව නගර සභාව ක්‍රියාත්මක වෙන්නේ සම්පූර්ණ වැඩ ඒකකයක් හැටියට ඒක සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා. ඒ හරහා නගර සභාවේ පාරවල්වල ගුණාත්මකභාවය වැඩිවෙනවා. පාරවල් හදන විදිය හොඳ වෙනවා. මගේ හිතවතා නන්ද කුමාර මහත්තයා කිව්වා සමහර පාරවල් දිග වෙනවලු කොට වෙනවලු ඔව් ඇත්ත කාලයක් තිබුණා. මං මේ සභාවේ ආරම්භක මන්ත්‍රීවරයෙක් හැටියට මම දන්නවා. අපේ සමහර කොන්ත්‍රාත්කරුවෝ හිටියා එතුමා දන්නවා. පළවෙනි කෝඩ් එක දාලා දෙවෙනි කෝඩ් එක දාන්නේ නෑ. සල්ලි ටික සභාවෙන් ගන්නවා. එහෙම යුගයක් මේ සභාවේ තිබුණා. හැබැයි පහුගිය කාලේ ඒක නිවැරදි වුණා කියන එකත් විශේෂයෙන් කියන්න ඕනෙ. එහෙම කාලයක් තිබුණා. ඒ හින්දා මේ වැඩ ඒකකයේ අපේ හිටපු චන්ද්‍රසිරි ගමගේ මැතිතුමා අපි විපක්ෂයේ ඉන්න කාලේ එතුමා ආරම්භ කළා මට මතකයි ඔබතුමා ආරම්භ කරලා හරි අමාරුයි ඒ කාලෙත් ඉන්න අයගෙන් වැඩ ගන්න. මට මතකයි එතුමා අපේ සභාවේ කෘෂ කැබ් එකේ මේ කණ්ඩායම ගෙනිහිල්ලා උදේට දාලා හවසට ගේනවා. මොකද නිතරම වැඩ නොකර ඉන්න තමයි බැලුවේ. එහෙම ගෙනිහිල්ලා කරන්න ඕනෙ වැඩ වෙන්කරලා දුන්නා. ඒත් හරි අමාරුයි. ඒ හින්දා වැඩ ඒකකය එතුමා ආරම්භ කරලා යම්තාක් දුරට ශක්තිමත්ව තිබ්බා. අපේ කාලෙත් ඒ වැඩ ඒකකය එහෙමම අපි ක්‍රියාත්මක කළා. අපිට පුළුවන් ශක්ති ප්‍රමාණය තුළ. මේ වගේ විශාල මුදල් සම්භාරයක් සභාවට තිබුණේ නෑ පිළිගන්න ඕනෙ. අපේ කාලේ මුදල් එන මාර්ග හරි අඩුයි. මොකද ආණ්ඩුව එක පැත්තක සභාව එක පැත්තක තියෙනකොට මේවාට එක එක යෝජනා දාලා මධ්‍යම රජයෙන් පළාත් සභාවෙන් වෙන වෙන ව්‍යාපෘති එවනවා මිසක් සභාවට දෙන්නෙ නැහැ. ඒ හින්දා එදා අපිට සිද්ධ වුණා. අපි ඇත්ත කතාකරන්න ඕනෙ පහුගිය ඡන්දෙ කාලෙ මට දිගට හරහට ගැහුවා අපේ ඡන්දෙ ඉල්ලන ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු. මේ රණවක තමයි වරිපනම් දැම්මේ කියලා. ඇත්ත මගේ කාලෙ තමයි මේක යෝජනා කළේ. මම බය නැතුව අදත් කියනවා. අපි ඒක යෝජනා කළේ මොකද මේ සභාවට ආදායමක් තියෙන්න ඕනෙ. එදා කොන්දපණ තියාගෙන යෝජනා කළා. රවීන්ද්‍ර ජයසිංහ මැතිතුමා ඒක ක්‍රියාත්මක කළා එතුමාගේ කාලෙදී. එහෙම නොවුනානම් අදටත් අපි ගම්වල තියෙන වීථි ලාම්පුව හදනවා. පාර සකස් කරනවා ඒ සල්ලි ටික අපිට එන්න විදියක් නැහැ. වරිපනම් කියන්නෙ පොඩි මුදලක් එන්නේ. එතකොට මේ සියල්ල අරගන්නවා අපි බදු ගහනකොට මේ පොඩි බදු ප්‍රමාණයක් අපේ අශෝක වැලිකල මන්ත්‍රීතුමාගේ ගෙදරට බදු ගැහුවෙත් අපි තමයි අපේ කාලේ. මොකද එතුමාටත් බදු තිබුණේනැහැ ඒ කාලේ. මගේ නිවසත් තියෙනවා ඊට එහා මොනා කරන්නද ඒකටත් බදු වදිනවා ඉතින්. ඒ හින්දා විශේෂයෙන්ම කියන්න ඕනෙ අපිට මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරද්දි අපි දන්නවා මේ යන මුදල් ප්‍රමාණය තමුන්නාන්සේ මේ ප්‍රිමික්ස් වැඩ ඒකකයේ මුදල් ටික තමයි මේකට යොදාගන්නේ. මිලියන 10 යි තියෙන්නෙ. මේ

මිලියන 10 න් ඉතිරි මාස 06ට මම හිතන්නෙ අපේ ලේකම්තුමා වැඩ බලන කාලේ මේ මුදල ඉවර වෙලාද දන්නෙත් නැහැ. පාරවල් හැදුවා එතුමා. ඉතින් මාස 06 කට 07කට විතර එතුමා කොහොමත් ලක්ෂ 30 ක් විතර මේ 12 දෙනා බඳවාගත්තත් පඩි ගෙවන්න යනවා. ඉතුරු මුදල් ටික තමයි පාරවල් හදන්න තියෙන්නේ. ඒ හින්දා තමයි මංජුල මන්ත්‍රීතුමා කිව්වේ අපි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන එක හොඳයි හැබැයි අපේ දැනට ඉන්න සේවකයෝ අරගෙන ඒ හරහා ව්‍යාපෘතිය ආරම්භ කරලා ඊට පස්සෙ පුළුවන් අපිට යන්න. අපි විරුද්ධ නැහැ මේකට 12 නෙමෙයි 100 ක් හරි අරගෙන මේ අපේ ප්‍රාදේශීය සභා සීමාව සංවර්ධනය කරනවාට විරුද්ධ නැහැ. හැබැයි දැන් මේ කරන්න යන්නෙ පහුගිය කාලේ අපේ පොඩි පොඩි ඡන්ද පොරොන්දු තියෙනවානේ චන්දන ලියනගේ මන්ත්‍රීතුමා මට කිව්වා එතුමාටත් තියෙනවලු පොරොන්දු රක්ෂා දෙන්න. ඉතින් දෙයියනේ මේවා දෙන්න එපැයි ඉතින්. ඒක හරි මේ රස්සා දෙන පොරොන්දුව ඇතුලේ මේ දේ කරනකොට මම හිතනවා ව්‍යාපෘතිය අසාර්ථක වෙන්න පුළුවන්. ඒ හින්දා තමුන්නාන්සේලා මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනකොට මං අර කිව්වා පාරවල් ලැයිස්තුව මේකෙ නැහැ. කරනවා කියන වැඩ ටික මේකෙ නැහැ. හංගලා ගැහුවා. කොහේහරි තියෙනවා ඒක. ඒක අපි දන්නවා ඊයෙ පෙරේදා මන්ත්‍රීවරු 11 දෙනෙක් එකතුවෙලා වෙනම සාකච්ඡාවක් කළා ඒගොල්ලන්ගේ පාරවල් ටික ඇති ඉස්සෙල්ලා. ඊට පස්සේ 23 දෙනාගේ ටික වෙනම ඇති. ඒ හින්දා එහෙම තමයි මේක යන්නෙ. ඒත් කිසි ප්‍රශ්නයක් නෑ අපේ සීමාවේ තියෙන පාරවල් තමයි ඔබතුමාලා හදන්නෙ. ඒකට ගැටළුවක් නැහැ. හැබැයි එක්කෙනෙක් දෙන්නෙක් කියනවා ඇහුනා ඡන්ද කාලේ යනකොට කිව්වලු බලන්නකො මේ පාරෙ යන්න බෑ. මෙච්චර කල් මෙහෙම වෙලා කොහොමද දෙයියනේ අපේ සභාවක් නෙමෙයි තිබ්බෙ දැන් අවුරුදු ගාණක් තිස්සේ. පහුගිය කාලෙ තිබුනෙ තමුන්නාන්සේලාගේ සභාව තිබුණේ. මේ මාර්ග හැදුවා හැබැයි අවුරුදු තුනෙන් ඒ පාරවල් කැඩුණා. මොකද හොරට දාපු කොන්ක්‍රීට් සහ තාර හින්දා තමයි පාර කැඩුණේ. ඒක නෑ කියන්න බෑ. ඒවා හරියට වැඩ ඒකකයක් හදලා සමහර අය දන්නෙ නැහැ. සමහර අයට මතක නැහැ ඒකයි වෙලා තියෙන්නේ. ඔය වැඩ ඒකකය නිර්මාණය කරලා. අපි කැමතියි සභාවට සල්ලි ඉතුරු වෙනවා සභාවේ වැඩ ශක්තිමත් වෙනවා. අපි වැඩ ඒකකය තුළ චන්ද්‍රසිරි මහත්තයා කිව්වා වගේ තාම තියෙනවා ඔබතුමාගේ කහහේන කඩුගොඩ පාලම. ලක්ෂ 21 ක ඇස්තමේන්තුවක් දුන්නා ඒ කාලෙ. අපි ඒ පාලමේ වැඩ ඉවර කළා ලක්ෂ 7 කින් එදා. ශක්තිමත් පාලමක් අදත් තියෙනවා. අපිට එහෙම කරන්න පුළුවන්කම තිබුණා. ඒකතමයි අපි කියන්නෙ මේකෙ හොඳ දේවල් තියෙනවා. අපි කියන්නෙ පහුගිය කාලේ ඔය කියන විදියට පාරවල් සම්පූර්ණ කළානම් ඔය කියන ප්‍රශ්නෙ එන්නෙ නෑ. අපි දන්නවා කොන්ක්‍රීට් දාපු පාරවල්වල අද කොන්ක්‍රීට් නෑ. මේ සියල්ල විශේෂයෙන්ම ඒ කාලේ සිද්ධවෙච්ච දේවල් ගැන තමුන්නාන්සේලා මට වඩා හොඳට දන්නවා. මේ වැඩ ඒකකය ක්‍රියාත්මක කිරීම බොහෝම හොඳයි. මේකට අවශ්‍ය කරන මුදල් මේ සල්ලි ටික අරගෙන මේ 12 දෙනෙක් බඳවාගන්න එක හොඳයි. 100 ක් බඳවා ගත්තත් කමක්නෑ. අපේ ප්‍රදේශයේ ඉන්න අයට රස්සාවල් හම්බවෙන්නේ. හැබැයි ඒ බඳවාගන්න සියලුදෙනා වැඩ ඒකකයේ වැඩ කරන්න ඕනේ. ප්‍රශ්නේ තියෙන්නෙ එතන. මෙතුමා කිව්වා වගේ මෙතුමාගේ පියාගේ කාලේ හිටපු අය අද නැහැයි කිව්වා. ඒ වෙනුවට ආපු අය ඉන්නෙ වෙන තැන්වල. ඒ වෙනුවට ආපු අය වෙනත් රැකියාවක නිරත වෙන්නේ. ඒක තමයි මේකෙ තියෙන ප්‍රශ්නෙ. වැඩක්ෂේත්‍ර කම්කරුවෝ කියලා මේකෙ 50 ක් දැනටමත් ඉන්නවා. සෞඛ්‍ය කම්කරුවෝ තව 35 දෙනෙක් ඉන්නවා. මේකෙ දැනට ඉන්න වැඩ ක්ෂේත්‍ර කම්කරුවෝ 50 දෙනා දැනට කරන කාර්යයන් මොනාද කියලා විශේෂයෙන් අධ්‍යයනයක් කරන්න වෙනවා. ඒ 50 දෙනාගෙන් 12 දෙනෙක් ගන්න පුළුවන්නම් හොඳයි ගරු සභාපතිතුමනි. මේ වැඩේ හොඳට පෙන්නන්න. පෙන්නලා ඔබතුමා 12 දෙනෙක් නෙමෙයි තව ඉස්සරහට යන්න. දැන් 12 ක් දාගන්න ගියාම මේ 23 ඔබතුමාත් එක්ක රණ්ඩු වෙයි. එක්කෙනෙක් නම් එපැයි කිව්වා මට ඇහුණා. 22 ක් ඉන්නවා. එතුමාට ප්‍රශ්නයක් නෑ ඒක හින්දා එතුමා එපා කිව්වා. ඒ කාර්යය ඒ විදියට කරන්න. නැතුව අපි මේ සංවර්ධනයට විරුද්ධ නෑ කවදාවත්. අපි හැමදාම පළාතේ සංවර්ධනය වෙනුවෙන් කතාකරපු කතා කරන අය. ඒ හින්දා ඔබ ව්‍යාපෘති ආරම්භ කරන්න. අර මන්ත්‍රීවරුන්ටත් පාරවල් ලැයිස්තුව දෙන්න දැනුයි ඒගොල්ලන්ටත් මතක් වුණේ පක්ෂව කතා කළාට දෙයියනේ එහෙම එකක් තිබුණේ නෑ නේද කියලා. තමුන්නාන්සේලා හොඳට බලන්න ඒ ඇමුණුම කොහේහරි කාගේහරි හැංගිලා තියෙනවානම් ඒක අරගන්න. මම මීට වැඩිය දීර්ඝව කතා කරන්න යන්නේනැහැ. දේශපාලන කතාවක් කරන්න යන්නෙත් නෑ. හොඳ වැඩක්. හොඳ වැඩේ හොඳට කරන්න. පහුගිය කාලේ වගේ මේ අරගන්න කණ්ඩායම තව කාර්යාලයටයි, කහහේන

කාර්යාලයටයි, පාදුක්කෙ කාර්යාලයටයි, කොස්ගමටයි මේ වගේ කාර්යාල වලට මේ ටික පුරවන්න එපා. ඒ නිසා අපි එදත් ඒ ගත්ත කට්ටියට විරුද්ධව කටයුතු කළේ නැහැ. ඒ අය ස්ථිර කරගන්න ඕනේ කිව්වම අපි ඒකට උදව් කළා. ඒ සියල්ලට අනුග්‍රහය දුන්නා. ඒ නිසා අපි එකක් දන්නවා අපේ ගමගේ චන්ද්‍රසිරි මැතිතුමාවත් අපිවත් මේ කාර්යාල වලට එහෙම සෙනඟ පිරෙව්වේනැහැ. අපි ඒ අවශ්‍ය කරන වැඩ වලට විතරයි යම්කිසි කෙනෙක් යෙදෙව්වනම් යෙදෙව්වේ. අර දුප්පත් අහිංසක මිනිස්සුන්ට කරන්න තියෙන රක්ෂාව අපි තව කෙනෙකුට දීලා දැන් ඒක කරගන්න බැරි වුණාම ව්‍යාපෘති වාර්තා හදනවා. පහුගිය කාලෙත් මං දන්නවා ඔබතුමා නැති කාලෙත් මේකට පිරෙව්වා. මහ ඇමතිතුමා හරි මේකට එවනවා. කොහෙන්හරි මේකට කට්ටිය එවනවා. අපේ ප්‍රසන්න මන්ත්‍රීතුමාත් ඔය කොහෙන්හරි අරන් එනවා. ඒක හින්දා ලොකු ප්‍රශ්නයක් නෑ. රැකියා දෙන්න ඕනෙ. ඒකට අපි විරුද්ධ නැහැ. හැබැයි පළාතේ සංවර්ධනයට මේ දුප්පත් මිනිස්සු ගෙවන බදු සල්ලි වලින් මේක දෙන්නෙ. ඒක හොඳට අවධානය යොමු කරගන්න. ඒ නිසා මේ බඳවාගන්න ඉන්න කණ්ඩායම දැන් ඉස්සෙල්ලා වගේ 50 දෙනාගෙන් කොඩි කණු ගහන්න එච්චරම ඕනෙ වෙන්නෙ නෑ. ආණ්ඩුව තියෙන කාලේ තමයි වැඩිය කොඩි කණු ගහන්න තිබුණේ. අවුරුදු එකහමාරේ ආණ්ඩුවක් නැති නිසා කොඩිකණු ගහන්න තමුන්නාන්සේලාට විශාල පිරිසකගේ අවශ්‍යතාවයක් හිටින්නේ නැහැ. ඒ හින්දා මේ ව්‍යාපෘතියට ඒ කණ්ඩායම දාලා ව්‍යාපෘතිය සාර්ථක කරගන්න කියලා ඉල්ලනවා. බොහොම ස්තුතියි.

**<u>ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, සහෝදර මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. මම හිතන්නේ සභාපතිතුමා ගෙනා මේ යෝජනාව ඉතාම කාලානුරූප යෝජනාවක්. යම්යම් ගැටළු තියෙන්න පුළුවන් සේවකයෝ බඳවා ගැනීමේදී. ඉන්න සේවකයන්ගෙන් වැඩ ගන්න. අපි දන්නවා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලේ පළාත් පාලන මැතිවරණය වෙනස් කරන්න ඕනේ කියලා දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගෙන් කමිටුවක් හදලා පළාත් පාලන මැතිවරණය කොට්ඨාස ක්‍රමයට පත් කරලා ඒක තවත් විකෘති කරලා කෙසේ හෝ රනිල් වික්‍රමසිංහ මැතිතුමත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමත් කොට්ඨාස මන්ත්‍රීවරයෙක් අද බිහිකරලා තියෙනවා. අපේ ආසනයේ කොට්ඨාශ 26 ක් තුළ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තියෙනවා. ඒ 26 මන්ත්‍රීවරුන් අද සභාවට පත්වෙලා තියෙන්නෙ යම්කිසි වැඩ කොටසක් කොට්ඨාසයට වගකිවයුතු මන්ත්‍රීවරයෙක් විදියට යම්කිසි වැඩ කොටසක් තමන්ගෙ ගමට කරන්න. ඒ ගමට වැඩ කොටසක් කරනවානම් අපි ඉස්සෙල්ලා මන්ත්‍රීවරු හිටියේ 22යි. විසිදෙදෙනාට මේකේ තිබුණ සම්පත් ප්‍රමාණය බෙදලා කොහොමහරි කළමනාකරණය කරලා දෙන්න හැකියාවක් ලැබුණා. නමුත් අද 43 දෙනෙකුට මේ සම්පත් ප්‍රමාණය දෙන්න වෙලා තියෙනවා. ඒ සම්පත් ටික දෙන්න නම් අපි දන්වා ඒ ප්‍රදේශයේ තියෙන පසුගිය වර 2 ½ ක කාලය මේ රටේ මිනිස්සුන්ට මේ ප්‍රදේශයේ මිනිස්සුන්ට කරන්න තිබුණ කාලය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් පසුගිය රජයත් ඒ මිනිස්සුන්ගේ අයිතිය ප්‍රජා සංවර්ධන කටයුතු අහකට දාලා තිබ්බා. එවැනි යුගයක විශාල සංවර්ධන කටයුත්තක් තියෙනවා කරන්න. පාරවල් මං මාවත්, කාණු පද්ධතිය සකසා ගන්න. ඒ කටයුතු කාර්යක්ෂමව කරගන්න සභාපතිතුමා මේ ගෙනාපු යෝජනාව හොඳයි. මොකද අපි මේක දීර්ඝ කාලයක් යන්න කලින් කරන්න බලාපොරොත්තු වෙනවා. දීර්ඝ කාලයක් නෙමෙයි මාස 06 කට හරි මේක කරලා බලලා මේක සාර්ථක නම් අපිට ඒක ඉදිරියට ගෙනියන්න පුළුවන්. අසාර්ථක නම් ඒකෙන් ඉවත්වෙන්න පුළුවන්. මේක ව්‍යාපෘතියක් හැටියට තමයි ප්‍රාදේශීය සභාව කරන්න බලාපොරොත්තු වෙන්නේ. මම හිතනවා ගරු සභාපතිතුමාගේ ඒ යෝජනාවට අපේ සියලුදෙනාගේ කැමැත්ත තියෙනවා. අපිට තියෙන්නෙ මේ ගන්න සේවකයන් ඒ අවශ්‍ය සුදුසුකම් වලට ගන්න. මොකද වැඩි අධ්‍යාපනයක් තියෙන අය නෙමෙයි මෙතෙන්ට ගන්න ඕනේ. වැඩක් කරන්න පුළුවන් මිනිස්සු. වැඩ කරන්න පුළුවන් ජවය ශක්තිය තියෙන මිනිස්සු අරගෙන ඒ ප්‍රදේශවල තියෙන කාණු පද්ධතිය මොකද අපි දන්නවා කෝටි ගාණක් වියදම් කරලා මං මාවත් හැදුවත් අද යන්න බැහැ. අපේ දිවිගල්ල මන්ත්‍රීතුමා කිව්වා ඇල මාර්ග බවට පත්වෙලා තියෙනවා කියලා. අපිත් බයිසිකල් වලින් යන මන්ත්‍රීවරු පයින් යන මන්ත්‍රීවරු හැටියට අපිත් දන්නවා පාරක යන්න තියෙන අපහසුතාවය. කාණු පද්ධතිය නැති හින්දා තමයි අද ඒ තත්වයට පත්වෙලා තියෙන්නෙ. ඒ වගේම මම සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා අපි මාර්ගයකට මුදලක් වෙන් කරනවා නම් ඒ මාර්ගයට මුදල් වෙන්කිරිමේදී කාණු පද්ධතිය පිළිසකර කරන්නත් එක්ක මුදලක් වෙන් කරන්න. කාණුව බැඳලා ඒ මාර්ගය හදනවා නම් ඒ මාර්ගයේ

පැවැත්ම වැඩිවෙලා තියෙනවා. ඒ නිසා මින් ඉදිරියට ඇස්තමේන්තු හදනකොට දෙපස කාණු පද්ධතියත් නවීකරණය කරන්න පුළුවන් මුදලක් දාලා ඒ ඇස්තමේන්තුව පිළියෙල කරන්න. එතකොට පාර හදනකොට දීර්ඝ කාලයක් පැවතෙනවා. අපි දන්නවා සභාවටත් විශාල මුදලක් වියදම් වෙනවා. කව්රු කව්රු කොහොම කිව්වත් මේ රජයන් වලින් කරලා තියෙන වියදම් ටික අපි දන්නවා එදා 22 ක් හිටපු මන්ත්‍රී මණ්ඩලය අද 43 දෙනෙක් වෙලා තියෙනවා. 640,000 ක වැටුප් ප්‍රමාණයක් ගෙවන්න තියෙනවා. අපි කෙසේවෙතත් කොට්ඨාසයට වගකියන මන්ත්‍රීවරු 26 දෙනෙක් මෙතන ඉන්නවා. ඒ 26 දෙනාට තමයි මෙතන වැඩි වගකීම තියෙන්නෙ. ඒ වැඩි වගකීම ඉටු කරන්න නම් මේ ව්‍යාපෘතිය 26 දෙනාම කොට්ඨාශ 26ට වගකියන මන්ත්‍රීවරු පත්කරලා තියෙනවා ඡන්දෙන් ඒ 26 තුළ ක්‍රියාත්මක කරන්න. මං හිතන්නේ පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව 26 දෙනාටම ඒ සේවය සැලසෙයි. මොකද අනිත් මන්ත්‍රීවරුන්ට මම දන්නවා වගකීමක් නෑ. මොකද ඔවුන්ගෙන් අහන්නෙ නෑනෙ. ඔවුන් එපා කියලනෙ මෙතෙන්ට එවලා තියෙන්නෙ. ඡන්දෙන් පත්වෙලා ඇවිත් තියෙන්නෙ අපි. අද අපෙන් තමයි අහන්නෙ මන්ත්‍රීතුමා මොකද කරන්නෙ පාර හදලාද ලයිට් එක දාලා ද. මොකද අනිත් අයට ගිහිල්ලා සීනි බෝලයක් පාස් කරලා ඉන්න පුළුවන්. ඔවුන්ගේ ආණ්ඩුව තිබ්බත් ඔවුන්ට මුදල් එයි. ඒ කෙසේවෙතත් 26 දෙනෙක් ඉන්නවා මහජනතාව පත්කරලා මේ සභාවට. ඒ 26 දෙනා තමන්ගේ මහජනතාවට වගකියන්න ඕනෙ වීථි ලාම්පුවේ සිට මාර්ගය හදන තැන සිට කනත්ත සුද්ධ කරන තැන සිට. ඒ වගේම මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා සුසාන භූමි ටික නම් එළිපෙහෙලි කිරීම ඉතාම හැකි ඉක්මණින් ආරම්භ කරන්න. මොකද අපි දන්නවා ඒක විධිමත් වැඩ පිළිවෙලක් යටතේ එක දවසක් සුද්ධ කළාම ඒක සම්පූර්ණයෙන්ම මේක නැවත වල් බිහිනොවෙන ආකාරයට නඩත්තු කිරීමේ වැඩ පිළිවෙලක් එක්කම සුසාන භූමි එළි කිරීම කරන්න ඕනෙ. අපි දන්නවා මේකට විශාල කම්කරුවෝ පිරිසක් අවශ්‍යයි. ඒ වගේම මං සභාපතිතුමාට යෝජනා කරනවා කුඩා බැකෝ යන්ත්‍රයක් හරි අරගෙන අපේ පළාත් සභාවෙන් ලැබෙන්න තියෙන මුද්දර ගාස්තු වලින් ගෙවන්න හරි කුඩා බැකෝ යන්ත්‍රයක් අරගෙන මේ කාණු සකසා ගැනීමට ඒ අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලදී ගන්න. මොකද සේවකයෝ 12 දෙනෙක්ගෙන් මේ තියෙන මාර්ග පද්ධතියේ අඩු පාඩු සම්පූර්ණ කරන්න බෑ. මාර්ග පද්ධතිය කිලෝ මීටර් දෙසිය ගාණ. ඒ හින්දා ඒ අවශ්‍ය කරන උපකරණත් ගන්න. මේ ව්‍යාපෘතිය වසරක් තුළ ක්‍රියාත්මක කරලා බලමු. මේක සාර්ථක ද අසාර්ථක ද කියලා එහෙම නැතිනම් ඒ ව්‍යාපෘතිය අපි සියලුදෙනාගේ එකගතාවයෙන් අහෝසි කරමු. අපි දන්නවා වසර එකහමාරක් යනකොට අපේ අළුත් ආණ්ඩුවක් බිහිවෙනවා අපේ. ඒ ආණ්ඩුවත් අපිට මුදල් ලබාදේවි. ඒ විශ්වාසය අපතුළ තියෙනවා. ජනතාවට මේ යන වැඩපිළිවෙල අනුව අවශ්‍ය උත්තරය ලබාදෙයි ජනතාව. සභාපතිතුමාගේ මේ යෝජනාවට අපේ සියලුදෙනාගේ එකඟතාවය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

<u>**ගරු සභාපතිතුමා**</u>

ගරු මන්ත්‍රීවරුනි, මං හිතන්නේ විශාල මන්ත්‍රීවරු ප්‍රමාණයක් අදහස් දැක්වුවා. මා ඉදිරිපත් කරන ලද යෝජනාවට පක්ෂව සහ විපක්ෂ අදහස් ඉදිරිපත් කළා. තමන්ගේ හෘද සාක්ෂිය තුළ. සියලුදෙනාටම ස්තූතියි. විශේෂයෙන් මේ ව්‍යාපෘතිය අපි අරගෙන එන්නේ පළමුව කියනවානම් දේශපාලන මුහුණුවරකින් හෝ රැකියා කීපයක් ලබාදීමේ අරමුණින් නොවන බව මා පළමුකොටත් වගකීමෙන් ප්‍රකාශ කරනවා. මම 2014 වර්ෂයේ ඩෙංගු ව්‍යාපෘතිය සඳහා සේවකයින් බඳවාගන්න වෙලාවෙත් ඔය විදියටම ඔය ප්‍රශ්නේම අපිට මතුවුණා. මුදල් කොහෙන්ද හොයන්නෙ කියලා ඇහුවා. ඒ නිසා මේක සාර්ථක ව්‍යාපෘතියක්ද කියලා ඇහුවා. මං හිතනවා අද කොළඹ දිස්ත්‍රික්කයේ අපේ ඩෙංගු අඩුම බල ප්‍රදේශය විදිහට සීතාවක ප්‍රදේශිය සභා බල ප්‍රදේශයේ සීතාවක සහ පාදුක්ක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල දෙක පත්වෙලා තියෙනවා. අපි එදා අපිට තොරතුරු ගන්න පුළුවන් කණ්ඩායමක් තමයි අපි එදා 6 දෙනෙක් පත්කරලා MOH කාර්යාල දෙක හරහා අපි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේ. අද එය කොතරම්ද කියනවා නම් පළාත් පාලන කොමසාරිස් කාර්යාලය හරහා තවත් 6 දෙනෙක් බඳවාගෙන අද ඒ ව්‍යාපෘතිය 12 දෙනෙක් දක්වා වර්ධනය වෙලා තියෙනවා. ඒක ආදායම් උත්පාදනය කරන ව්‍යාපෘතියක් නොවන බව අපි දන්නවා. හැබැයි ඒ සඳහා අනුමැතිය ලැබුණා වගේම එහි ප්‍රතිඵලත් අද අපි ලබාගෙන තියෙන බව ප්‍රකාශ කරන්නට ඕනෙ. ඒ නිසා අපි අසාර්ථක ව්‍යාපෘති ආරම්භ කරන්න බලාපොරොත්තු වෙන්නේනැහැ. අපි කියන්නෙ නෑ සීතාවක ප්‍රාදේශීය සභාව අසාර්ථක ව්‍යාපෘති

ආරම්භ කළා කියලා අහන්න. ඒ නිසා අපි බලන්නෙ අපේ ජනතාවට ඒ අවශ්‍ය කරන පහසුකම් ප්‍රමාණය සම්පූර්ණ කරලා දෙන්න කියන කාරණය ඔබ සියලුදෙනාටම මතක් කරන්නට ඕනෙ. ඒ වගේම මේ යෝජනාවට අන්තර්ගත විය යුතු බොහෝ කාරණා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා. ජේ.සී.බී. යන්ත්‍රයක අඩුපාඩු, යන්ත්‍ර සූත්‍රවල තිබෙන්නාවූ අඩුපාඩු, මේවා සඳහා අවධානය යොමු කරලා ඔබෙත් එකඟතාවය මත ඒ අවශ්‍ය කරන දේ අරගෙන මිනිස්සුන්ගෙන් මහපොළවේ වැඩටික කරන්න අපි සේවකයින් බඳවාගෙන කරන්න ඕනේ කියන කාරණය මම මතක් කරනවා. ඒ නිසා මංජුල වීරරත්න මන්ත්‍රීතුමා අපේ පළාතේ මාර්ග පද්ධතිය ගැන, අපේ චන්ද්‍රසිරි ගමගේ මැතිතුමා ඉන්න කාලේ හදපු වැඩ ඒකකය පිළිබඳව අපේ මන්ත්‍රීතුමන්ලා ගණනාවක් කථා කළා. ඒ නිසා එතුමන්ලාගේ කාලේට වඩා විශාල මාර්ග ප්‍රමාණයක් එතුමා ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා මේ සභාවේ හිටපු තුන්වෙනි සභාපතිවරයා. හැබැයි අද ඉන්නේ අටවෙනි සභාපතිවරයා. මේ කාලසීමාව ඇතුළේ මාර්ග කොච්චර ගැසට් වෙන්න ඇතිද කියලා. ඔබතුමාලාම පහුගිය සභාවාරවලදී කොච්චරක් මාර්ග ඇතුල් කරලා තියෙනවද අළුතෙන් සීතාවක ප්‍රාදේශීය සභාවට කියලා. ඒ නිසා ඒ වැඩ ගන්න සේවක සංඛ්‍යාව සපයන සේවාවන් එක්ක වැඩි වෙනවා. අපේ බල ප්‍රදේශයේ මාර්ග ප්‍රමාණය වැඩිවෙලා තියෙනවා. ඒ නිසා මේවාට සේවකයින් කාර්ය මණ්ඩලය අවශ්‍යයි. අපි මේ සේවකයින් හා කාර්ය මණ්ඩල ලබාදෙන්න කියලා ඉතා දීර්ඝ කාලයක ඉඳන් ඉල්ලීම් කරන්නේ. අද අපේ ස්ථිර සේවකයින් ඉන්න ඕනෙ 186 දෙනායි. ඉන්නෙ 160 යි. ඒ 186 න් 20 ක් අඩුවෙන් තමයි මේ සභාව ඉස්සරහට යන්නේ. අපි ඉල්ලපු මේ සේවක මණ්ඩලය අනුව තව 144 දෙනෙක් මේ සභාවෙ ඉන්න ඕනෙ. ඒ කියන්නේ 330 දෙනෙක් මේ සභාවේ මේ තත්වයන් අනුව අවශ්‍යතාවය අනුව ඉන්න ඕනෙ. අද තාමත් අපේ ඉන්නෙ 186 යි. 186 න් 160 යි. ඒ නිසා සේවකයින් ගැන කතා කරනවා නම් තව බොහෝ දේ කථා කරන්න පුළුවන්. ඒ නිසා මේ ඔක්කොම වෛද්‍යවරුන්ගේ ඉඳන් ආදේශක ඉන්නේ. ඒ සියලුදෙනාත් එක්ක අද ආදේශක ඉන්නේ 74 දෙනයි. මේ 74 දෙනා කොහෙද ඉන්නෙ කියලා කතා කරන්න ඕනෙ නම් අපි වෙනම කතා කරමු. ඒ ගැන කතා කරන්න පුළුවන්. මේ වැඩකටයුතු ටික කරගෙන යන්න මේ සේවකයින්ගේ අවශ්‍යතාවය අපිට තදින් දැනිලා තියෙනවා. ඒනිසා ඔබ කල්පනා කරන්න සෞඛ්‍ය අංශයේ ඉන්න සේවකයන් මාර්ග අංශයේ ඉන්න සේවකයන් සියලුදෙනා වැඩට එනවාද කියලා. ඔවුන් හැමදාම වැඩට එන්නේනැහැ. හැබැයි නිවාඩු අරගන්නෙත් කල් ඇතුව දැනුම් දෙන්නේ නෑ. එහෙම වෙලාවට මම සභාපතිවරයා වශයෙන් ඉන්න කාලෙ මම කොයිතරම් අපහසුතාවයට පත් වුණාද මේ සේවකයෝ වැඩට එන්නෙ නැතුව මේ ඉන්න හතර පස්දෙනාගෙන් නගරෙක වැඩ කරන්න. නැත්නම් පොරොන්දු වෙච්ච පාරක වැඩ කරන්න. එහෙම උනාම ආදේශකයන් බඳවාගන්න වෙනවා. අද බඳවාගෙන හෙට එළියට දාන්න බැහැ. හැබැයි යම් ප්‍රමාණයක් ඉන්න ඕනෙ නැත්නම් අර අඩුව සම්පූර්ණ කරන්න බැහැ. අදත් මෙතෙන්ට එන්න ඉස්සෙල්ලා ප්‍රශ්නයක් විසඳන්න වුණා. කන්ටේනර් එකක් පටවනවා ප්ලාස්ටික් හා පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය කරන්න හොල්සීම් එකට යවන්න. හැබැයි අද 3 දෙනායි කන්ටේනරයට පටවන්නේ. සේවකයෝ කලින් දන්වන්නේ නැතුව සේවයට වාර්තා කරලා නැහැ, සමහරු එක එක හේතු කියනවා. සමහර හේතු සාධාරණයි. නමුත් අපිට මේ දේවල් කරන්න මං කියන්නෙ ඉන්න සේවකයෝ කළමනාකරණය කරන්න ගියහම තියෙන අපහසුතාවය. එතකොට සේවකයින් බඳවාගන්න ඕනෙ. එහෙම නැතුව මේ වැඩේ අපිට කවදාවත් කරගන්න වෙන්නෙ නැහැ. ඒ නිසා මේ ඉන්න සේවකයෝ ඵලදායී තැනක යොදවලා ඉන්නවා. ඒ නිසා ඒ අය කරන වැඩ ප්‍රමාණය පිළිබඳව අපිටත් ප්‍රශ්න තියෙනවා. ඒක අපි පිළිගන්න ඕනෙ. එතන රැඳී ඉඳලා තමන්ගේ වැඩේ හරියට කරනවාද කියලා. ඒක හැමකෙනාගේම තියෙනවා කම්කරුවාගේ ඉඳන් ඉහළ දක්වාම හැමදෙනාගේම තියෙන්න පුළුවන්. පහුගිය කාලේ අපි බැලුවා ඒක මම ලේකම්තුමාටත් ප්‍රකාශ කළා අපේ බැහැරයාම් පොත. බැහැරවීම් පොත බලන කොට සඳහනක් නෑ කවුරුත් අත්සන් කරන කෙනෙක් නැහැ. අඩුපාඩු ප්‍රශ්න තියෙනවා ඒවත් අපි හදාගන්න ඕනෙ. එහෙම ප්‍රශ්න අපිට හැමකෙනා ගැනම තියෙනවා. ඒ නිසා අපි මේ හැමදෙයක් ගැනම බලලා මේ 12 දෙනා බඳවාගන්නේ මේ කාර්යය සඳහා පමණක් බව අපි සඳහන් කරන්නට ඕනෙ. ඒ නිසා වැඩ ඒකකය ආරම්භ කරලා එයින් 6 දෙනෙක් මේ සභාවේ සඳහන් කරලා තියෙන ආකාරයට ව්‍යාපෘති වාර්තාවේ ඒ මාර්ග සුද්ධ කරන්නත් ඉතිරි 6 දෙනා අනෙකුත් වැඩ සඳහාත් ඒ කියන්නෙ කොන්ත්‍රාත් මඟින් කෙරෙන වැඩ කොන්ක්‍රීට් දැමීම තාර දැමීම සහ අනෙකුත් ගොඩනැගිලිවල වැඩ කටයුතු කිරීම සඳහාත් යොදාගන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ පිළිබඳව තවදුරටත් අදහසක් අවශ්‍ය නම් ඊළඟ කාර්මික සේවා කමිටුවේ අපිට නැවතත් කතා කරන්න පුළුවන් මේ අඩුපාඩු

ගැන. ඉතින් කතා කරලා මෙම කටයුත්ත අපිට සම්පූර්ණ කරන්න පුළුවන්. ඒ නිසා මුදල් පිළිබඳව අභියෝග එදත් අපිට ආවා. අදත් තියෙනවා. ඒවා කොහොමත් ජයග්‍රහණය කරන්න ඕනෙ ඒ නිසා මම පෙර ප්‍රකාශ කළ විදියට අපි ඩෙංගු බලකාය බඳවාගන්න වෙලාවෙත් එහෙම ප්‍රශ්න ආවා. අපි ඒවා විසඳාගත්තා. පඩි ගෙව්වා. අදටත් ඒක ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ නිසා මෙම ව්‍යාපෘතිය සඳහාත් මම අයවැය ලේඛනය බලලා ගන්න ඕනෙ. අපි ලක්ෂ 405ක් පමණ මුදලක් මේ මාර්ග පිළිබඳ කටයුතු වලට මෙම අයවැයේ විවිධ කරුණු යටතේ සල්ලි වෙන්කරලා තියෙනවා. මංජුල මන්ත්‍රීතුමාට සහ අනිත් අයට බලන්න පුළුවන්. එයින් මං හිතන්නේ ලක්ෂ 100 ක් 150 ක් පමණ මං හිතන්නේ වියදම් වෙලා ඇති. තවත් ප්‍රමාණයක් තියෙනවා. අපිට ඒ මුදල යොදවලා කළමනාකරණය කරගෙන මේ කටයුත්ත ආරම්භ කරන්න පුළුවන් බව මම ප්‍රකාශ කරනවා. ඒ නිසා මේ ව්‍යාපෘතිය මාස 06 කට පස්සේ ආරම්භ කරලා නෙමෙයි දැන් ආරම්භ කරලා වසර අවසානයේ බලමු මේකෙ ප්‍රගතිය කොහොමද කියලා. ඒ වෙනුවෙන් සහයෝගය ලබාදෙන්න. මොකද අපේ කාලසීමාව තුළ අපි අසාර්ථක ව්‍යාපෘති කරලා නැති නිසා. අපි කරලා තියෙන ව්‍යාපෘති මත හා අපි කරගත්ත වැඩසටහන් නිසා තමයි සීතාවක ප්‍රාදේශීය සභාව පහුගිය වසර 4 පාලනය කරපු කාල සීමාව ඇතුළේ කොළඹ දිස්ත්‍රික්කයේ හොඳම ප්‍රාදේශීය සභාව බවට පත්වුනේ. ඒ නිසා ඔබට ඒ ටිකම ඇති මේ සභාව ගෙනල්ලා තියෙන ගෞරවනීය තත්වය අපි සහ පහුගිය සභාවල හිටපු මන්ත්‍රීතුමන්ලාත් එක්ක අපි ගත්ත තීරණ අපි පාලනය කරපු 2011, 2015 කාලසීමාව ඇතුලෙ ප්‍රාදේශීය සභාව කොහෙද තිබුණේ ඒ තැනට අපි උසස් කළේ මම එදත් කිව්වා ඒ තැනට අපි උසස් කළේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරලා. පහුගිය කාලේ අපේ සීතාවක ප්‍රාදේශීය සභාව පැත්තෙන් යම් දුරකට රැගෙන යන්න පවත්වාගෙන යන්න ලේකම්තුමා ඇතුළු අපේ නිලධාරීන්ට හැකියාව ලැබුණා. ඒ නිසා මාර්ග පද්ධතියේ යම් ප්‍රශ්න. වෙන්න ඇති. නමුත් කොම්පෝස්ට් ව්‍යාපෘතිය පැත්තෙන් අපි ඉස්සරහට ගිහිල්ලා තියෙනවා. අද එහි මං හිතන්නෙ මාසෙකට ටොන් විශාල ප්‍රමාණයක් අපි අපද්‍රව්‍ය කළමනාකරණය කරනවා. මෙහි සඳහන් විදියට අපි මාසෙකට ටොන් 23 ක් එක වර්ගයකින් අපි මෙහෙන් බැහැර කරනවා. ටොන් 295 ක් විතර මං හිතන්නෙ මාසෙකට මේ ප්‍රදේශයෙන් ඉවත් කරනවා, ප්‍රතිචක්‍රීකරණය කරනවා සහ අයින් කරනවා. ඒ නිසා හංවැල්ල සහ කොස්ගම කොම්පෝස්ට් සහ කුණු තෝරනමේ මධ්‍යස්ථාන දෙක හරහා. අපි ඒවාට සේවකයින් බඳවාගෙන තියෙනවා. එහි සේවකයන් විශාල ප්‍රමාණයක් සේවය කරනවා. මේ සියලු දෙයින් කරලා තියෙන්නෙ සභාවේ කටයුතු වඩා කාර්යක්ෂමව සහ ක්‍රමවත්ව කරගෙන යාමයි කියන කාරණය අපි මතක් කරනවා. ඒ නිසා අදහස් වලට අපි ගරු කරනවා. ඒ අදහස් අපි අළුතෙන් ලබාගත යුතු හොඳ අදහස් මන්ත්‍රීතුමන්ලාගෙන් අපි එකතු කරගෙන වඩා කාර්යක්ෂමව විශේෂයෙන් කොට්ඨාස මන්ත්‍රීවරුන්ට විශේෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෙ අපි ඉන්න කාලේ මේ වසම් 90 කටම අපි හිටියේ 22 යි. සමහර වෙලාවට මම අතුළු 22 දෙනාගෙන් සමහර ගම්මාන අත් හැරෙන්න ඇති. හැබැයි අද වෙනස් මන්ත්‍රීවරු 26 දෙනෙකුට 43 න් 26 දෙනෙකුට මං හිතනවා ඒකෙන් බැහැර වෙන්න බැහැ කියලා. ඒ නිසා ඒ අයට මේ හැම ගමකටම මේ මන්ත්‍රීවරු වගකියනවා. ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ හෝ වේවා. ඒ නිසා මේ අය වෙනුවෙන් අපි යමක් කරන්නට ඕනෙ. ඒ හා සමානව අනෙක් මන්ත්‍රීවරුන්ටත් ඡන්ද දායකයෝ ප්‍රමාණයක් ඉන්නවා. ඒ නිසා අපි මේ හැමෝගෙම ගෞරවය ආරක්ෂා කරන්න ඕනෙ. ඒ ගෞරවය ආරක්ෂා කිරීම වෙනුවෙන් තමයි මේ ව්‍යාපෘති යෝජනා අපි අරන් එන්නේ කියන කාරණය අපි මතක් කරනවා. ඒ නිසා මෙම ව්‍යාපෘතියට ඔබ සියලුදෙනාගේ සහයෝගය මා අපේක්ෂා කරනවා. මම විශ්වාස කරනවා ඒ සඳහා සියලුදෙනාගේ සහයෝගය ලැබෙයි කියලා. කොහොම නමුත් ඒ සඳහා අදහස් ඉදිරිපත් කරපු ඔබ හැමදෙනාටම අපේ ගෞරවයත් ස්තූතියත් ඔබ සියලුදෙනාට පුදකර සිටිනවා. අදහස් ප්‍රකාශ කිරීමේදී අපි දැක්කා අපිට අහුණා යම්කිසි විරෝධතාවයක් තිබුණා. බෙදීමක් පවතින නිසා ඒ සඳහා ඡන්දය විමසීමට අවශ්‍ය වෙනවා. ඇමුණුම සම්බන්ධයෙන් ඊළඟ කාර්මික සේවා කමිටුවේදී ලබාදෙන්න පුළුවන්. මේ මාර්ග අපි හැමෝගේම ප්‍රදේශයේ මාර්ග. පළාත් පාලන අමාත්‍යාංශයට ව්‍යාපෘති වාර්තා යවන්න ඇමුණුම් තියෙනවා. අපි හඳුනා ගත්ත විශාල මාර්ග තමයි මේ සඳහා ඇතුලත් කරලා තියෙන්නෙ. ඒවා වෙනස් කරගන්න පුළුවන් අපිට. ඒ සඳහාත් ඔබට අවස්ථාව පවතින බව ප්‍රකාශ කරමින් මෙම යෝජනාව සඳහා බෙදීමක් තියෙන නිසා ඒ සඳහා ඡන්දය ප්‍රකාශ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ඉහත යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් පැවති බැවින් ඡන්ද විමසීමක් සිදු කරන ලදී.</u>**

01. ගරු සභාපතිජී. ජයන්ත රෝහණ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
02. ගරු උප සභාපතිඑස්.ඩී.මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීකේ.ඒ.විමල් ප්‍රසන්න මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඑම්.ඒ.මේරි මාග්‍රට් මැතිතුමිය යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඑම්.ආර්. ගයාන් දුමින්ද මැතිතුමා යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැළකී සිටින ලදී.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීආර්.පී. යසරු රාජපක්ෂ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීජයන්ත රණවක මැතිතුමා යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැළකී සිටින ලදී.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඩබ්.ඒ. මංජුල වීරරත්න මැතිතුමා යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැළකී සිටින ලදී.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඔල්ගා අතුකෝරළ මැතිතුමිය යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැළකී සිටින ලදී.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඑස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීබී. සනී හෙක්ටර් පිරිස් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. කෝකිල සම්පත්වර්ණසිරි මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.නන්ද කුමාරසිංහ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීආර්.ඒ. උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ජිනේන්ද්‍රකුලතිලක මැතිතුමා යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැළකී සිටින ලදී.
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීසුසන්ත රූපසිංහ මැතිතුමා යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැළකී සිටින ලදී.
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඩබ්.ඒ.ඩී. ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුසන්ත මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්. වරුණදිලිප් කුමාර මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.උපුල් ප්‍රසන්න මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඩබ්.ඩී. චින්තක දේවින්ද සමරවීර මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.නිමල් යසසිරි කළුපහන මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඅයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අසෝක වැලිකල මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමල් නිශාන්ත සිල්වා මැතිතුමා යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැළකී සිටින ලදී.
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කුමුදිණි ජයවර්ධන මැතිතුමිය යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැළකී සිටින ලදී.
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂිණි හෙට්ටිආරච්චිමැතිතුමිය යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැළකී සිටින ලදී.
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ජී.ඩී.ඉන්ද්‍රානි පද්මසීලි මැතිතුමිය යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැළකී සිටින ලදී.
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැළකී සිටින ලදී.
37. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීආර්.ඒ.ඩි.සාගරිකා රූපසිංහ මැතිතුමිය යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
38. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
39. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්දන සූරියආරච්චි මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
40. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.සුනිල් රණසිංහ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
41. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
42. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ.ප්‍රදිප් කුමාර් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දුන් ගරු මන්ත්‍රීවරු 31

| | |
|---|---|
| යෝජනාවට විරුද්ධව ඡන්දය ලබා දුන් ගරු මන්ත්‍රීවරු | - |
| යෝජනාවට ඡන්දය ලබා දීමෙන් වැලකී සිටි ගරු මන්ත්‍රීවරු | 11 |
| එම අවස්ථාවේ සභා ගර්භයේ නොසිටි ගරු මන්ත්‍රීවරු | 01 |

**ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**

**ප.ව. 2.05 ට දිවා විවේකය සඳහා සභාවේ කටයුතු අත්හිටුවන ලදී.**

**ප.ව .2.45 ට නැවතත් මහා සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.**

**05 – (03) ගරු සභාපති ජී.ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

සීතාවක ප්‍රාදේශීය සභාවේ කොස්ගම උප කාර්යාලයේ වැඩ ක්ෂේත්‍ර කම්කරු 111 තනතුරේ සේවය කරන කේ.එම්. රසිකා සෙව්වන්දි මහත්මිය ලංකා බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාව මගින් ලබා ගැනීමට නියමිත දේපල ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූර්ණය කළ යුතු පොලි මුදල, මෙම සභාවට ප්‍රතිපූර්ණය කරන තෙක් එම පොලි මුදල සභා අරමුදල් මගින් ලංකා බැංකුව - තිඹිරිගස්යාය ශාඛාව වෙත ගෙවිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**

**05-(04) ගරු සභාපති ජී.ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

කොළඹ දිස්ත්‍රික්යේ නැගෙනහිර හේවාගම් කෝරලයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 440 නෙළුවත්තුඩුව ග්‍රාම නිළධාරී වසමේ නෙළුවත්තුඩුව - දිද්දෙනිය පාරේ වක්ඔය හරහා යොදා ඇති පාලම පසුවී මීටර් 200 ක් පමණ දුරක් ගිය විට වම් පසින් ආරම්භ වී බෝමළුව හරහා ගොස් බින්ඩාබන් වත්තේ අඩි 15 ක් පළල පාරට සම්බන්ධ වන අඩි 05 ක් පමණ පළල පාර, අඩි 15 ක් දක්වා පුළුල් කිරීම සඳහා අවශ්‍ය වන ඉඩමේ ප්‍රමාණය සභාවට පවරා ගත යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මම මෙම යෝජනාව මීළග මහා සභා වාරයට කල් තබන ලෙස ඉල්ලා සිටිනවා. මම එහෙම කියන්නේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ලේකම් සීතාවක ප්‍රාදේශීය සභාවට පිටපතක් සහිතව ඇමතු 2017.10.06 දින ලිපිය අනුව වෙන්න ඇති මෙය නව යෝජනාවක් විදිහට සභාවට ගෙන එනු ලබන්නේ. මට තේරෙන හැටියට හා මම දකින විදිහට මේ යෝජනාව 1994 වර්ෂයේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් ජයසිංහ මැතිතුමා විසින් මෙම සභාවට ගෙන එන ලැබු යෝජනාවක් හැටියට අපිට කරුණු අනාවරණය වුණා.

ඉන් පස්සේ එය සභා සම්මත කරලා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් යම් තක්සේරුවක් කරලා රු.19,500.00 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත බැදලා පුරා වසර 24 ක කාලයක ඉදන් මෙම මාර්ගය සභාවට අත්පත් කරගන්න කටයුතු කරලා තියෙනවා. ඒත් ඒ කාලය තුළදී ඇති වූ යම්යම් බලපෑම් මත මෙය මේ දක්වා කර ගත නොහැකි වූ බව තමයි අපිට ආරංචි වෙන්නේ. ඒ නිසා මම හිතනවා මේ යෝජනාවේ අඩුවක් තියෙනවා කියලා මට දැනෙන විදිහට අත්පත් කරගන්නේ කවුද ඉඩම් හිමියා සම්බන්ධව යෝජනාවේ නැහැ. එම මාර්ගයේ වම් පැත්තද දකුණු පැත්තද කියලාත් නිශ්චිතව සදහන් කරලා නැහැ. ඒවගේම අත්පත් කරගන්න ප්‍රමාණය කොයිතරම් දිගක්ද කියන එක සම්බන්ධවත් හරියටම මේ යෝජනාව තුළ ගැබ් වී නොමැති බැවින් මෙය සභාසම්මත කර ගැනීම තුළ තවත් ඉදිරියේදී ප්‍රශ්නයක් ඇති වෙයි කියන අවිශ්වාසය මට තියෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා මේ පිළිබදව නිසි අධ්‍යයනයක් කරලා මීළග සභා වාරයට මෙය ගෙන එන ලෙස මම යෝජනා කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු උප සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, මේ යෝජනාව උපුල් මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන විදිහට ඉතා දිර්ඝ කාලයක ඉදන් ඉල්ලුම් කරන අත්‍යාවශ්‍යයි කියලා විශ්වාස කරන ස්ථානයක්. ඒ සදහා එතුමා ප්‍රකාශ කල විදිහට යෝජනාවේ සදහන් මාර්ගයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා අනෙකුත් ආයතන හරහා පාර්ලිමේන්තුවේ පෙත්සම් කාරක සභාව මේ සියළු ස්ථාන වෙත ගිහිල්ලා එය ප්‍රමාදවීම් කිහිපයක් හේතු කොට ගෙන එය පහුගිය කාලයේ අත්පත් කර ගැනීම අත්හිටුවලා තිබුණා. නැවතත් ඒ ඉල්ලුම් කරන අය විසින් කරපු ඉල්ලීම් වලදී මෙය අත්හිටුවා තිබුණු නිසා නැවත වතාවක් සභාවට මේ ඉඩම අත්පත් කර ගැනීමේ යෝජනාවක් ප්‍රාදේශීය ලේකම් හා අදාල අංශ විසින් ඉදිරිපත් කරලා තියෙනවා. මේ මාර්ගය ප්‍රාදේශීය සභාව සතු පාරවල් දෙකක් යා වෙන්නේ. ඒ නිසයි මේ යෝජනාව ඉදිරිපත් කළේ. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයසතු ලිපි ගොනුවෙත් අපේ ලිපිගොනුවෙත් මෙය පවරා ගත යුතු ආකාරය පිළිබදව පෙර කටයුත්තේ වාර්තාවන් තියෙනවා. මේ පිළිබදව තව දුරටත් අධ්‍යයනය කළ යුතු නම් සභාවේ එකගතාවය ඇත්නම් අපිට පුළුවන් මේ සම්බන්ධයෙන් තීරණයක් අරගෙන ඊළග සභාවකට ඉදිරිපත් කරන්න. අපිට ඉල්ලීම ආවාහම අපේ තාක්ෂණ නිලධාරි මගින් වාර්තාවක් ලබා ගත්තා. ඒ වාර්තාව අනුව තමයි අපි මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. තවදුරටත් අවශ්‍ය නම් කමිටුවක මේ ගැන සාකච්ඡා කරලා සභාවට දාන්න සභාව එකග නම් අපිට ඒ සදහා ගමන් කරන්න පුළුවන්. මගේ විරුද්ධත්වයක් නැහැ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ස්ථිර කරන්නට හැදුවෙත්මම මේ ගැන දිර්ඝ කාලයක ඉදන් දන්නවා. අවුරුදු විසි ගණනක එහා පැත්ත මම දන්නවා. මේ දේශපාලන ප්‍රශ්නයක් නෙමෙයි. මේ නිසා පීඩා විදිනවා. මෙහි පෞද්ගලිකව ඔවුන්ට වාහනයක්වත් ගන්න බැහැ. ඉතා දිර්ඝ කාලයක ඉදන් පවතින ගැටලුවක්. මම තාක්ෂණය පැත්තෙන් දන්නේ නැහැ. සභාපතිතුමා එය පැහැදිලි කරනවා නම් හොදයි. මෙය අත්‍යාවශ්‍ය කළ යුතු කාරණයක්. මම සභාවට ඇවිත් ලේකම්තුමා ප්‍රමුඛ නිලධාරි මණ්ඩලය සමග කථා කළාම අපි ප්‍රාදේශීය සභාවේ පාරවල් පවරා දුන්නා ලිඛිතව අත්සන් කරලා ලේඛනයක් පුරවලා. දැන් අපි ලේකම්තුමාගෙන් ඇහුවාම කිව්වේ එහෙම කරන්න බැහැ. ඒ පවරන පාර ඔප්පුවකින් පවරලා දෙන්න ඕන කියලා. මෙවැනි පාරවල් පවරා ගන්න සිදු වෙනවා. මේ සමහර පාරවල් තියෙනවා ඉඩම් හිමියන් අවු.25 ක්30ක්,40 ක් 50 ක් ගිහින්තියෙනවා පාරවල් හදාගෙන. පවරලා දෙන්න ගිහාම ඔවුන් ළග ඔප්පුවක් නැහැ. ඔවුන් කැමතියි දෙන්න ලිඛිතව. මට ලේකම්තුමා දැනුම් දුන්නේ එය ප්‍රමාණවත් නැහැ කියලා. ඔප්පුවකින් පවර ගන්න ඕන මේ කොටස කියලා. මෙවැනි යෝජනා ඉදිරියටත් එන්න පුළුවන්. මේ තාක්ෂණ සහායත් අරගෙන ඒ එක්කම මම ඉල්ල සිටිනවා ඉඩම් පවරා ගැනීමේ කාර්යය සම්බන්ධව පැහැදිලි කිරීමක් කරනවා නම් හොදයි කියලා.

<u>ගරු සභාපතිතුමා</u>

මේ යෝජනාව අපි ඉදිරිපත් කරන්නේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ලේකම් වෙනුවට අත්සන් කරලා අපිට එවූ ලිපිය අනුව තමයි අපි මේ යෝජනාව සකස් කරන්නේ. අවශ්‍ය නම් ඒ ලිපිය පිළිබඳව සභාව දැනුවත් කරන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ඒ අනුව කාරක සභාවේදි සාකච්ඡා කර ගත් ආකාරයට නැවත අත්පත් යෝජනාවක් සඳහා තමයි සභාව විදිහට එකග වෙන්න ඕන. ඒ සදහා සභාවේ එකගතාවය පවතිනවා නම් අපි මේ යෝජනාව පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයටත්, බස්නාහිර පළාත් සභාවටත් යොමු කරලා ඒ අයට අවශ්‍ය වන සහයෝගය අපි ලබා දෙමු කියන කාරණය තමයි මතක් කරන්නේ. ඒ සදහා සභාවේ විරුද්ධත්වයක් නැත්නම් අදහස් ප්‍රකාශ කරන්නේ නැත්නම් යෝජනාව සභා සම්මත කර ගන්න පොදු එකගතාවය ලබා දෙන්න.

**<u>ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

## <u>05-(05) ගරු සභාපති ජී.ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කළ යුතු පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ව්‍යාපෘති ඊට අනුරූපව ඇති සමිති මගින් හෝ කොන්ත්‍රාත් ආයතනය සමග ගිවිස ගනිමින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ.අ | ව්‍යාපෘතිය | මුල්‍ය සම්පාදනය | කොන්ත්‍රාත් සමිතිය | මුදල රු. |
|---|---|---|---|---|
| 01 | හංවැල්ල වෙළඳ සංකීර්ණයේ | සභා අරමුදල් | හංවැල්ල නගරය ග්‍රාම | 553,518.00 |

| | | | | |
|---|---|---|---|---|
| | ( බස් නැවතුම්පල පැත්ත) කාණුව කොන්ක්‍රිට් කර ආවරණ යෙදීම. | | සංවර්ධන සමිතිය. | |
| 02 | නැණසල ගොඩනැගිල්ලේ බිම් මහලේ විදුලි පද්ධතිය සකස් කිරිම. | සභා අරමුදල් | සෘජු ශ්‍රමික | 181,850.00 |
| 03 | පෙර පාසල් කාර්යසාධන තරගාවලියේ ප්‍රථම ස්ථානය ලබා ගත් දෙහිවල මහා නගර සභා පෙර පාසල නිරීක්ෂණ චාරිකාව සඳහා | සභා අරමුදල් | සෘජු | 26000.00 |
| 04 | ආහාර පරිහරණ ආයතන හිමියන් දැනුවත් කිරිමේ වැඩසටහන් සඳහා සංග්‍රහ වියදම් | සභා අරමුදල් | සෘජු | 17000.00 |
| 05 | කහහේන උප කාර්යාලයේ වහලය අළුත්වැඩියා කිරිම. | සභා අරමුදල් | කහහේන සමගි ගොවි සංවිධානය. | 129,247.63 |
| 06 | සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් දඹෝර පුස්තකාලයේ වැසිකිලි පද්ධතියක් ද සමග ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරිම. (N 88183131004) | පළාත් සංවර්ධන ප්‍රදාන | සභාපති, ග්‍රාම සංවර්ධන සමිතිය, දඹෝර. | 1,264,752.89 |
| 07 | සීතාවක ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය සඳහා අභ්‍යන්තර දුරකථන පද්ධතියක් සැකසීම. | සභා අරමුදල් | ශ්‍රී ලංකා ටෙලිකොම් | 250,191.01 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වන්දන මුදුන්කොටුව මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව පිළිබඳව මට පුංචි අදහසක් තියෙනවා. මෙහි පළමු ව්‍යාපෘතිය විදිහට තියෙනවා හංවැල්ල වෙළඳ සංකීර්ණයේ (බස් නැවතුම්පල පැත්ත) කාණුව කොන්ක්‍රිට් කර ආවරණ යෙදීම. - සභා අරමුදල් - කොන්ත්‍රාත් සමිතිය හංවැල්ල නගර ග්‍රාම සංවර්ධන සමිතිය කියලා තියෙනවා. මෙහි ව්‍යාපෘති 07 ක් තියෙනවා. එයින් අවස්ථාවන් තුනක්තියෙනවා. එකක් තියෙනවා කහහේන උප කාර්යාලයේ වහලය අළුත්වැඩියා කිරිම - කහහේන සමගි ගොවි සංවිධානය. ඊළගට සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් දඹෝර පුස්තකාලයේ වැසිකිලි පද්ධතියද සමග ගොඩනැගිල්ල ඉතිරි වැඩ නිම කිරිම. මෙය පළාත් සංවර්ධන ප්‍රධාන අරමුදල් යටතේ ආපු එකක්. රු.1,264,752.89 ක්. මම කියන්නේ මේ ව්‍යාපෘති අපි කලින් 05 - (02) යෝජනාව අනුව අපි කිව්වානේ වැඩ ඒකකයක් පිහිටුවනවා කියලා. වැඩඅධිකාරි මගින් සභා කර්මාන්ත ඒ හරහා කරන්න අවශ්‍යයයි කියලා. මේ කියන ව්‍යාපෘති තුනත් කොන්ත්‍රාත් සමිති වලින් ඉවත් කරලා අපි වැඩ අධිකාරි ඒ ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක කරමු කියන යෝජනාව මම මේ සභාවට ගෙන එනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා, තව මාසයක් විතර යයි අපි කථා ගත් ඒකකය ස්ථාපිත කරන්න. ඒ සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ අනුමැතියත් ආවාට පස්සේ තමයි ක්‍රියාත්මක කරන්න තියෙන්නේ. හංවැල්ලබස් නැවතුම්පලේකාණු පද්ධතිය අපි ඉතාමත් ඉක්මනින් හදලා අවසන් කරනන් ඕන. අනෙක් යෝජනාත් එහෙමයි. තව කල් යනවා ඒකයි. අත්‍යවශ්‍ය කාරණා ගණනාවක් මෙහි තියෙනවා. මාසයක් දෙකක් ඇතුළත සම්පූර්ණ කරගන්න අවශ්‍ය ඒවා. සීතාවක ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර දුරකථන පද්ධතිය ක්‍රියාත්මක නැහැ. මේ දේවල් නිසා අපහසුතාවයට පත් වෙනවා. අපි

තව මාසයකින් අනුමැතිය හම්බ වුණාට පස්සේ අපිට එහෙම ක්‍රියාත්මක කරන්න පුළුවන්. එතෙක් මේ විදහට කරගෙන යන්න අවශ්‍ය වෙනවා. ඔබතුමාලාගේ අදහස් ඉදිරිපත් කරන්න. එහි වරදක් නැහැ.

**ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මේ නගරබද කාණු පද්ධති වගේ දේවල් අළුත්වැඩියා කිරීම සභාවේ සේවකයෝ දාලා අපිට කරගන්න හැකියාව තියෙනවා කියලා මම දන්නවා. මොකද පසුගිය දිනවල මම දැක්කා පාදුක්ක නගරයේ වට රවුම් පාරේ කාණු පද්ධතිය සභාවේ සේවකයෝ එය නිසියාකාරව කරලා තිබුණා. ඉතින් ඒ තුළින් විශාල මුදලක් සභාවට ඉතිරි වුණා. මෙහි දොලොස් ලක්ෂ ගාණේ ව්‍යාපෘතිය කෙසේ වෙතත් මේ නගර වල කාණු පද්ධති අළුත්වැඩියා කිරීම සභාවේ සේවකයෝ දාලා සෘජු ශ්‍රමික යටතේ කලා නම් හොදයි කියලා මම හිතනවා. ප්‍රදේශයේ මිනිස්සුත් කැමතියි සභාවෙන් යමක් කරනවා. සභාවේ සේවකයෝ යමක් කරනවා කියලා. එවගේම පාදුක්ක මාකට් එකට ඇතුල් වෙන තැන රථ ගාලක් හැදුවා. එකේ යකඩ පයිප්පයක් කැඩිලා තියෙනවා දැන් මාස හය හතක විතර ඉදන්. මමත් බයිසිකලේ දාන්න ගිහින් වැටුණා. හරිම අනතුරුදායකයි. ත්‍රිවිල් එකක රෝදේ වැටුණොත් ඉස්සරහ පොඩි වෙනවා. මම මතක් කළා කෙරිලා නැහැ. මේ වගේ දේවල් හොයලා බලලා නගරබද තියෙන කාණු පද්ධති සභාවේ සේවකයෝ දාලා කරමු කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා. කොන්ත්‍රාත් දෙන්න යන්න එපා මේවගේ දේවල්. අනෙක් ඒවා කොන්ත්‍රාත් දෙමු. සභාවේ ආසන්නම ස්ථානයක අළුත්වැඩියාව තියෙන්නේ. ඒ යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා.**

ඒ සදහා මම එකගයි. දැනට තියෙන තත්වය අනුව මේ කටයුත්ත කරන්න පුළුවන්ද කියන කාරණය අපේ තාක්ෂණ නිලධාරින්ගෙන් අහන්න ඕන. ඒ අයට පුළුවන් නම් කරන්න කිසි ගැටලුවක් නැහැ. ඒ සදහා අවශ්‍ය සහයෝගය ලබලා දෙන්න පුළුවන්. මේ කටයුත්ත කඩිනමින් කරන්න පුළුවන්ද කියන කාරණය තමයි තියෙන්නේ. එලෙස කරන්න පුළුවන්ද කියලා කාරක සභාවක් බවට පත් කරලා අපේ නිලධාරින්ගෙන් අහන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ යෝජනාව ගේනවාත් එක්කම විවිධ යෝජනා ඉදිරිපත් වුණා. මෙවැනි යෝජනාවක් සභා සම්මත වුණොත් එහි ඉදිකිරීම් කළායින් පසුව ගෙවීම් කටයුතු කරන්න පුළුවන්ද මුදල් කමිටුවට යන්නේ නැතිව. මොකද්ද ඒ ක්‍රමවේදය කියලා දැනගන්න කැමතියි. අපි කලින් ඉන්න කොට මුදල් ගෙවීම කරන්න මුදල් කමිටුවට එන්න ඕන. දැන් මුදල් කමිටුවට නොගිහින් සභා සම්මුතියටම මුදල් ගෙවන්න පුළුවන්ද කියලා පැහැදිලි කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා.**

ගරු මන්ත්‍රීතුමා, ගිය සභා වාරයේ නිත්‍යානුකූල ක්‍රමය අනුව බලය පැවරුවා ඒත් අපේ පාලිත මහත්තයා ප්‍රකාශ කළ විදිහට තමයි අපි ඒකත් කළේ. මංජුල වීරරත්න මන්ත්‍රීතුමා මේ ගැන හොදට දන්නවා. මෙය සභාවේ සම්මත වුණාට පස්සේ අපි යවන්නේ සියළුදෙනාගේ වාර්තා එක්ක. ඒ වාර්තා අනුව අපිට මුදල් ගෙවීම් කටයුතු කරන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.**

ගරු සභාපතිතුමනි,මෙය සෘජු ශ්‍රමයෙන් කරන එකට මමත් එකගයි. ඒ සංශෝධනයට යටත්ව මොකද දැන් වැඩ ඒකකයක් අනුමත කර ගත්තා. ඒ නිසා ඒ ආකාරයට කරන්න කියලා ඉල්ලා සිටිනවා. යෝජනා කළේ ව්‍යාපෘති තුනම. අපි දැන් සමහර දේවල් දන්නවා කියලා කිව්වාම සමහර අයට මේක දරාගෙන එන්න බැහැ. සමහර අය කියන්නේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු කියන ඒවා අහන්න ඕන නැහැ කියලා. ඒ නිසා අළුත් අය කියන විදිහටම මේක කරගෙන යන්න

කියලා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන ලියනගේ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු සභාපතිතුමා.</u>**

කාරක සභාවේදී සාකච්ඡා කළ පරිදි මෙම යෝජනාව සම්බන්ධව ඒ අනුව කටයුතු කරනවා. මන්ත්‍රීතුමාලාගේ විරුද්ධත්වයක් තියෙනවාද. නැත්නම් සභා සම්මත කර ගනිමු. වෙනත් මන්ත්‍රීවරු අදහස් ඉදිරිපත් කරනවාද.

**<u>ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

## <u>05 – (06) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

සීතාවක ප්‍රාදේශීය සභාව විසින් අනිවාර්යයෙන් මාසිකව ගෙවිය යුතු මාසික වැටුප්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සෑම මසකම දින 15 කට වරක් ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, මුද්දර හා උපයන විට ගෙවීම් සඳහා වන බද්ද වැනි අත්‍යවශ්‍ය ගෙවීම් සඳහා රු. 7,500,000.00 (ලක්ෂ හැත්තෑ පහක) උපරිමයක් දක්වා මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සීතාවක ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවීම් කිරීමේ බලය සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මහතාට බලය පැවරිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මෙය සමහර අයට ලොකු ගැටලුවක් වෙන්න පුළුවන් ඇයි සභාපතිතුමා වෙනුවෙන් මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ කියලා. සමහර විට වන්දි භට්ටයෝ මේ සභාවේ ඉන්නවා කියලා. මම කියන්න ඕන කියපු කෙනා මට සැකයක් තියෙනවා වන්දි භට්ටයෙක්ද නැත්නම් එයා සීතාවක ඉඳන් ආවාද එහෙම නැත්නම් කොහේඉඳලා ආවාද කියලාමට සැකයක් තියෙනවා. මේ යෝජනාව මම විශේෂයෙන් ඉදිරිපත් කළේ පහුගිය සංශෝධන යෝජනාව ඉදිරිපත් කළේ මම. මේ වන්දි භට්ටකම් කරන්න අපි මේවා ඉදිරිපත් කරනවා නෙමෙයි. ගරු සභාපතිතුමාත් ලේකම්තුමාත් කථා කරලා කිව්වා මංජුල මන්ත්‍රීතුමා ඔබතුමා සංශෝධන යෝජනාව ගෙනාපු නිසා ඔබතුමාමමේ කටයුත්තකරන්න අපිට පොඩි ප්‍රශ්නයක්ඇති වෙලා තියෙනවා කියලා. මේ ගැන අපි අදහස් ලබා ගත්තාම මීට ඉස්සර මෙහෙම යෝජනා තිබුණේ නැහැ සභාවේ. වැටුප් ගෙවන්න මේ බදු ගෙවන්න කිසි ගැටලුවක් තිබුණේ නැහැ. මේවා ගෙවන්න යෝජනා සම්මත කළේ නැහැ. නමුත් අළුතින් පැමිණිලා තියෙන උපදෙස් අනුව මේ යෝජනා දාන්න ඕන. මුදල් ගෙවන්න යම් යම් සීමා පනවා ගෙන තියෙන නිසාසියළුමුදල් ගෙවීම් සඳහා සභාවේ බලයක් අවශ්‍ය වන නිසා මෙවැනි යෝජනාත් සභාවට ඕනා කියන විශ්වාසය ලේකම්තුමා ඇතුළු මේ කාර්ය මණ්ඩලයේ කිව්ව නිසා මම මේ යෝජනාව ඉදිරිපත් කළා. මම සභාව ගැන හිතනවා. මේ යෝජනාව සභාපතිතුමා වෙනුවෙන් මම යෝජනා කළා කියලා මම ප්‍රකාශ කරනවා. එහෙම අපි සභාව අමාරුවේ දාන්න එහෙම කටයුතු කරන්නේ නැහැ. සමහර අය මේවා තේරුම් ගන්නේ දේශපාලන කෝණ වලින්. සමහර අය ඒවා විග්‍රහ කරන්නේ තමන්ට දැන් දැනෙන දේවල් වලින්. දැන් සභාවේ දැනෙන දේවල් නෙමෙයි දැනෙන්න ඕන. තව අවුරුදු 04 ක් ඉස්සරහට දැනෙන දේවලුත් මේ සභා යෝජනා වලින් දැනෙන්න ඕන. තියෙන ඒවාත් මේ සභා යෝජනා වලින් දැනෙන්න ඕන කියන එක සියළුදෙනා අවධාරණය කරගන්න ඕන. ඒ වෙලාවට පක්ෂ සතුටු කරන්න සභාපතිවරු සතුටු කරන්න සභාවේ ඉන්න සමහර අයව සතුටු කරන්න පක්ෂ වල නායකයෝ සතුටු කරන්න සමහර වෙලාවට යෝජනා සම්මත කරන්න හා කියලා අත ඔසවලා දෙන්න පුළුවන්. අද උදේ 10.00 ගෙනාපු එකට සවස 2.00 ට ප්‍රතිවිපාක විඳිනවා.ඒවගේ සමහර යෝජනා වලට අත ඉස්සුවාම අවුරුදු හතර පුරාවටම විඳින්න වෙනවා කියන එකතු මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, යෝජනාව පිළිබඳව මට තව පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වෙනවා. යෝජනාවේ අපි ඉතා පැහැදිලිව දන්නා කාරණා කිහිපයක් තියෙනවා. දින 15කට වරක් ගෙවිය යුතු එකතු කළ යුතු අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, මුද්දර හා උපයන විට ගෙවීම් බද්ද ඒ ආදී ගෙවීම් රජයට ගෙවන්න ඕනෙ එක ගැන කිසිම ගැටළුවක් ඇතිවෙන්නේ නැහැ. ඒ පිළිබඳව ඔබතුමාට අපේ එකඟතාවය දෙන්න පුළුවන්. නමුත් මට මෙතන පැහැදිලි කරගන්න ඕනෙ කාරණය බද්ද ගෙවීම වැනි අත්‍යාවශ්‍ය කාරණා මෙතෙන්දි අපිට ගැටළුවක් මතුවෙනවා ''වැනි අත්‍යවශ්‍ය ගෙවීම්" කිව්වම මොනවගේ දේවල් ද මෙතනින් ආවරණය වෙන්නෙ කියලා. ඒ නිසා තමුන්නාන්සේට හිතන්න පුළුවන් නැතිනම් කටයුතු කරන්න පුළුවන් සියලුම ගෙවීම් කියන්නේ සියල්ලම අත්‍යාවශ්‍යම තමයි. මේකෙන් අසීමිත බලයක් තමුන්නාන්සේට ලැබෙනවා අද සභාව මේක මේ විදියට අනුමත කළොත්. මගේ අදහස නම් එවැනි එකක් නෙමෙයි. සීමාසහිතව තමුන්නාන්සේට රජයට ගෙවිය යුතු සියලුම මුදල් ගෙවීමට කිසිම බාධාවක් නෑ අපි බැඳී සිටිනවා. ඒක ගෙවන්න අපිට ඔබතුමාට අනුමැතියක් දෙන්න පුළුවන් නමුත් වැනි අත්‍යවශ්‍ය කියන කාරණාව පිළිබඳව අපිට යම්කිසි පැහැදිලි කරගැනීමක් අවශ්‍යයි කියලා මම විශ්වාස කරනවා.

<u>ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා.</u>

ගරු මන්ත්‍රීතුමා වැනි කියන්නෙ මේ ටික විතරයි. ලොකු මුදලක් ගෙවන්න නැහැ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මුදල නෙමෙයි. වැනි අත්‍යවශ්‍ය කාරණා කියන එක. මුදල නෙමෙයි ප්‍රශ්නේ. අතවශ්‍ය කරුණු කියන එක පිළිබඳවයි අපිට ගැටළුව තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මටත් මේකෙ තියෙනවා පැහැදිලි කරගැනීමක් කරගන්න නවක මන්ත්‍රීවරයෙක් හැටියට. සීතාවක ප්‍රාදේශීය සභාව විසින් අනිවාර්යයෙන් මාසිකව ගෙවිය යුතු මාසික වැටුප් අපේ මංජුල වීරරත්න ජොෂ්ඨ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අපි දැන් මේක පරාද කරනවා. අපි පරද කිරීමත් එක්ක මේ වැටුප් ගෙවන්න බැරිද? ඒවා අත්හිටවෙනවාද?. මොකද මේවා සාමාන්‍යයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අනුව සහ මුදල් රෙගුලාසි යටතේ මම දන්නෙ නැති නිසා අහන්නේ. මේවා Auto matically කෙරෙන දේවල් නේද? ඒකෙ part එකනේ. ඇයි දැන් මේකට සභාපතිතුමාට විශේෂ බලයක් ලබාදෙන්න ඕනෙ. ඒ පිළිබඳවත් ඔබතුමා අදහස් දක්වනවානම් හොඳයි.

<u>ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා.</u>

සභාවක කරන සියලු ගෙවීම් කරනවානම් ඒක සභාවේ ඔබතුමන්ලාගේ සහ මහ සභාවේ අනුමැතියක් ලබාගෙන එයට යටත්ව ඕනෙ අපි සියලු දේ කරන්න. ඒකයි ඔබතුමන්ලාගෙන් බලය ඉල්ලන්නේ මේ සඳහා බලය ලබාගැනීමට. මට එහෙම කරන්න පුළුවන් බලතල ප්‍රමාණයක් නැහැ. ඔබතුමාලගෙන් ලක්ෂ 5 ඉල්ලුවෙත් ඒ නිසයි. අපිට එහෙම මුදල් ගෙවීම් කරන්න බැහැ මහ සභාවේ අපිට පවරපු බලයක් නැතුව. ඒකට අපි ඔබෙන් අවසරයක් ගන්න ඕනෙ. ඔබට මීට වඩා විස්තර දැනගන්න අවශ්‍යනම් කාරක සභාවක් බවට පත් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන ලියනගේමැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් යසසිරි කළුපහනමැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන ලියනගේ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා.</u>

යෝජනාව පිළිබඳව මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ප්‍රකාශ කරනවානම් අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දෙනවා. එසේ නැතිනම් මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් ලෙස සලකනවා.

**<u>ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

## <u>06. කාරක සභා වාර්තා .</u>

06 – (01 ) 2018.04.23 වන දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ වාර්තාව සලකා බැලීම.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාවේ ''සීතාවක ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් ව්‍යාපෘති පදනම මත පෙර පාසල් ගුරුවරුන් බඳවා ගැනීමට අදාල නිවේදනය කාරක සභාවට ඉදිරිපත් කරන ලදි" කියලා. අපිටත් නිවේදනයක් තියෙනවානම් කරගන්න පුළුවන් කවුරුහරි ඉන්නවා නම් ඉදිරිපත් වෙන්න කියන්න. අවශ්‍ය සාධක මේ කමිටුවට අදාල නිවේදන මෙතන ඉදිරිපත් කරලා නැහැ සභාපතිතුමා. ලියුමක් දුන්නානම් අපිට ඉදිරිපත් කරන්න තිබුනා.

<u>ගරු සභාපතිතුමා</u>

ඒක ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම් ඒ නිවේදනය. ඔබතුමා සුදුසුකම් ප්‍රමාණය නේද අවශ්‍ය කරන්නේ. ඒකෙ වයස අවුරුදු 30ට අඩු වෙන්නට ඕනෙ. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය වැඩ හයයි හතරක් සමත් වෙන්නට ඕනෙ. සිංහල සහ ගණිතයට සම්මාන සාමාර්ථ සහිතව. අ.පො.ස. උසස් පෙළ එක විෂයක් සමත් වෙන්නට ඕනෙ. ඒ වගේම පෙර පාසල් කටයුතු පිළිබඳව ඩිප්ලෝමාවක් කරලා තියෙන්න ඕනෙ. අපි ලිපියක් දෙන්න ලෑස්ති කරන්නම්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, පෙර පාසල් සම්බන්ධව කතා කරන නිසා අහන්නෙ එතන සමහර ගුරුවරියන් ඉන්නවා ස්ථිර නොකර සෑහෙන කාලයක් ඒ ගැන ඔබතුමා බලන්න.

<u>ගරු සභාපතිතුමා</u>

ඔව් ඒ ගැන අනුමත වෙලා ආවට පස්සෙ අපිට ඒ ගැන බලනවා. අනුමැතිය ඉල්ලලා තියෙනවා.

<u>**2018.04.23** වන දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදි.</u>

06 – (02 ) 2018.04.24 වන දින පවත්වන ලද කාර්මික සේවා කාරක සභාවේ නිර්දේශ වාර්තාව සලකා බැලීම.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, කාර්මික සේවා කමිටුව යටතේ යමක් සඳහන් කරන්නට ඕනෙ. විදුලිය සම්බන්ධ කාරණයේදී අපි දැක්කා සමහර තැන්වලදී වීථි ලාම්පු දිරලා තියෙනවා. දිරලා ගිහිල්ලා අණ්ඩ නැතුව හදන්න බැරි තැන් තියෙනවා. සමහර වෙලාවට කතා කළාම අපිට කියන්නෙ අණ්ඩක් නම් දෙන්නෙ නැහැ. අණ්ඩ අතින් අරන් දෙන්න වෙනවයි කියලා. මෙකට මං හිතන්නෙ ඔබතුමා විශේෂයෙන්ම බලන්න වෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා අපි මේ ගැන ඊළඟ කමිටුවේදී කථා කරමු.

<u>**2018.04.24** වන දින පවත්වන ලද කාර්මික සේවා කාරක සභාවේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා</u>

<u>බලන ලදි.</u>

<u>ගරු සභාපතිතුමා</u>

06 – (03 ) 2018.04.26 වන දින පවත්වන ලද පරිසර හා පහසුකම් කාරක සභාවේ නිර්දේශ වාර්තාව සලකා බැලීම.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඔල්ගා අතුකෝරළ මැතිතුමිය.</u>

ප්‍රශ්නයක් තියෙනවා ගරු සභාපතිතුමා. පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාවේ අංක 14. ගරු සභාපතිතුමනි, ලේකම්තුමනි. එදා පරිසර කමිටුවේ සභාපතිතුමා විසින් මෙම ඉදිකිරීම් සැලැස්ම අනුමත සැලැස්මට පටහැනි බවත් ඒ සම්බන්ධයෙන් සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කරන්න කියලා දැනුවත් කළා. අපේ චන්දන මුදුන්කොටුව සභාපතිතුමා. ඒක මෙයට ඇතුළත් වෙලා නැහැ මෙම කොටසට. ඒකෙ ඉදිකිරීම් අත්හිටුවන ලෙස දන්වා එවීම සුදුසුයි කියන කොටස විතරයි ඇතුලත් වෙලා තියෙන්නෙ. මේකට සංශෝධන සැලැස්මක් ඉදිරිපත් කරනවා. ඊට අදාල මූලික කටයුතු දැන් කරගෙන තියෙන්නේ. ඒ කමිටුවේ සභාපතිතුමා විසින් දෙන ලද උපදෙසක් මේ කමිටු වාර්තාවට ඇතුළත් වෙලා නෑ. ඒක ඇතුළත් කරන්න කියන අදහස මම මේ සභාවට ඉදිරිපත් කරනවා. එතුමා විසින් ඒ අදහස මට ඉදිරිපත් කළා සංශෝධන සැලසුමක් ඉදිරිපත් කරන්න කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එදා අපි ඒ දාපු ලිපියේ සඳහන් කළා ඒ සැලැස්ම නීත්‍යානුකූල නොවනආකාරයට ඉදිකිරීම් කටයුතු සිදුකරගෙන යනවා කියලා එවෙලේ සඳහන් වුණා. මා විසින් කිව්වා ඒක නීත්‍යානුකූල ආකාරයට නැවත සකස් කරලා වැඩ ආරම්භ කරන හැටියටඒ ප්ලෑන් එකේ වෙනසක් ඇතිව. ගොඩනැගිලි සැලැස්ම වෙනස් හැටියට ලේකම්තුමා ප්‍රකාශ කළා.

<u>ගරු සභාපතිතුමා</u>

ඒකේ වැඩ ආරම්භ කරන්න නෙමෙයි ගරු මන්ත්‍රීතුමා ආපහු කමිටුවට සැලැස්මක් දාලා අනුමත කරගන්න. අනුමත කර ගැනීම සඳහා සැලැස්මක් දාන්න පුළුවන්. අනුමත කරගන්න කියලා කියන්න පුළුවන්. වැඩ ආරම්භ කරන්න කියලා කියන්න බැහැ. ඒක අනුමත කරන එක සැලසුම් කමිටුවේ වැඩක්. කමිටුවට ඉදිරිපත් කරන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා.</u>

ගරු සභාපතිතුමා, පරිසර කාරක සභා වාර්තාවේ අංක 21 ඒකෙ කැළිකසල එකතු කිරීමේ වැඩපිළිවෙලක් පටන්ගන්න එකඟ වෙලා තියෙනවා සෙනසුරාදා දිනයන්වල. කවදා ඉඳන් ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලා දැනගන්න කැමතියි ජනතාව දැනුවත් කිරීම සඳහා.

<u>ගරු සභාපතිතුමා</u>

පුළුවන් ගරු මන්ත්‍රීතුමා. අපි මේක හෙට සෙනසුරාදා. හෙට බැරි වුණොත් අපි ලබන සතියේ සෙනසුරාදා ඉඳන් දාමු.

<u>**2018.04.26** වන දින පවත්වන ලද පරිසර හා පහසුකම් කාරක සභාවේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදි.</u>

06 - (04) 2018.04.27 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවේ නිර්දේශ වාර්තාව සලකා බැලීම.

**2018.04.27 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදි.**

06– (05) 2018.04.27වන දින පවත්වන ලද ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශ වාර්තාව සලකා බැලීම.

**2018.04.27 වන දින පවත්වන ලද ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදි.**

## 07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ.

07 – (01) 2018 පෙබරවාරි මාසය ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, ගිය සභාවේදි කිව්වා මාර්තු 20ට මේ ශේෂය දෙන්න කියලා. මට ඒක දැන් දෙනවද?

**ගරු සභාපතිතුමා**

විසි පන් ලක්ෂ අසූ දෙදහස් දහතුනයි ශත අසූ නවයයි. ගරු මන්ත්‍රීතුමා.

**2018 පෙබරවාරි මාසය ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය මහා සභාව විසින් සලකා බලන ලදි.**

## 08. වෙනත් කරුණු.

**ගරු සභාපතිතුමා**

මීලඟට වෙනත් කරුණු යටතේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙකු ඉදිරිපත් කල යෝජනා අපි න්‍යාය පත්‍රයට ඇතුල් කරන්න බැරි වුණා ඒ සම්බන්ධයෙන් මම කියලා තියෙනවා සභාවේ අපි අවස්ථාවක් ලබා දෙනවා ඉතාමත්ම කෙටියෙන් විනාඩි තුන හතරකින් එතුමන්ලාගේ අදාල කාරණය පිළිබඳව මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයක් කරන්න කියලා හැබැයි මේ ප්‍රකාශය පිළිබඳව කිසිම විවාදයකට යන්න බැහැ මන්ත්‍රීතුමාට තමාගේ කාරණය පිළිබඳ අදහස මේ සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ අනුව අපේ අයෝම මන්ත්‍රීතුමාට පළමු අවස්ථාව ලබා දෙනවා ඉතාම කෙටියෙන් එතුමාගේ ප්‍රකාශය කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මතක් කරන්න ඕනේ පාදුක්ක සහ පහල පාදුක්ක කියන වසම් දෙකේ පහල පාදුක්ක වසමේ අපිට මේ වන විට ප්‍රාදේශීය සභාව සතු හෝ වෙන රජයේ ලබා ගත හැකි තැනක් නොමැති වෙලා තියෙනවා සේවා පියසක් ඉදි කිරිම සඳහා ඒ සඳහා අපිට තියෙන එකම ස්ථානය වෙලා තියෙන්නේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති පාදුක්ක ඩී.ඩී. නිමල්සිරි මාවත අසල තියෙන ඉඩම් කොටස. මම හිතන්නේ එතන විශාල ඉඩම් ප්‍රමාණයක් දුම්රිය දෙපාර්තමේන්තුව සතුව තියෙනවා. මම ඔබතුමගෙන් ඉල්ලීමක් කරනවා එම ප්‍රමාණයෙන්

පර්චස් 05 ක ප්‍රමාණයක්වත් ප්‍රාදේශීය සභාවට පවරා ගන්න දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරලා ඒ ස්ථානයේ සේවා පියසක් ඉදි කරලා සියලු රාජ්‍ය නිලධාරීන්ට අවශ්‍ය ස්ථානයක් නිර්මාණය කරන්න අවශ්‍ය පසුබිම සලසා දෙන්න කියලා මේ සභාව තුලින්. බොහොම ස්තුතියි.

<u>**ගරු සභාපතිතුමා.**</u>

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. මීළඟට සුසන්ත රූපසිංහ මන්ත්‍රීතුමා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි මට මේ යෝජනාව සදහා අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන්. මම මේ කථා කරන යෝජනාව මේ අවස්ථාවේ මම හිතන්නේ ෆේස්බුක්වලින් පවා ප්‍රසිද්ධ යෝජනාවක් හැමෝටම පොදු යෝජනාවක් මොකද මේ මාර්ගය මම කථා කරන මාර්ගය වැලිකන්න ලහිරුගම මාර්ගය. මේක අයත් වෙන්නේ පළාත් සභාවට අවුරුදු 04 ක් පළාත් සභාව බුදියන් ඉන්න වෙලාවකදී අද පාර කඩලා ගිහිල්ලා සම්පූර්ණයෙන්ම ලොකු අනතුරක් වෙන්න පුළුවන් අවස්ථාව ඇවිල්ලා තියෙනවා. මේ අනතුරට ඉස්සෙල්ලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා මේ 14 වෙනිදා තියෙනවා මම හිතන්නේ සම්බන්ධීකරණ කමිටුව තමුන්නාන්සේ සභාපතිවරයා වශයෙන් මේ යෝජනාව අපි අරන් ගිහිල්ලා මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නම්. මේක කමිටුවට ඉදිරිපත් කරන්න. ඇත්ත වශයෙන්ම මේක විශාල අනතුරක් වෙන්න තියෙන් අවස්ථාව ඉතාම වැඩියි. ගරු සභාපතිතුමා වැලිකන්න ඡන්ද කොට්ඨාශයට අයත් වැලිකන්න ළහිරුගම ප්‍රධාන මාර්ගයේ හීන් ඇලට මායිම්ව ඇති කොටස හීන් ඇලේ ජල පහර නිසා කැඩී ගොස් ඇත. මෙය දැනට වසර 04 පමණ කාලයක සිට සිදුවෙමින් පවතී. තවද ඉහත මාර්ගය සම්පූර්ණයෙන්ම සෝදා පාලුවට ලක් වී ඇති අතර වාහන දෙකක් මාරුවීමටවත් නොහැකි ලෙස අබලන්වී ඇත. හීන් ඇලට කැඩී ගොස් ඇති ස්ථානය මාර්ග අනතුරක් සිදුවීමට බෙහෝ ඉඩ සැලසී ඇත. එම මාර්ගය අයිති වන්නේ බස්නාහිර පළාත් සභාවට බැවින් බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ඉංජිනේරු මහතාගෙන් ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලා සිටින ලෙසද මෙම ස්ථානය කඩිනමින් ප්‍රතිසංස්කරණය කර දීම සදහා මැදිහත් වන ලෙස සීතාවක ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් සීතාවක සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිවරුන් වන පළාත් සභා මන්ත්‍රීවරු සුමිත් සොයිසා, ලෙනාඩ් කරුණාරත්න මන්ත්‍රීතුමන්ලාගෙන් සහ පළාත් සභා මන්ත්‍රී මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිය යුතුයැයි මම යෝජනා කරමි.

<u>**ගරු සභාපතිතුමා**</u>

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා, මීලඟට චින්තක දේවින්ද මන්ත්‍රීතුමා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශයේ වේරගල මාහිංගල මීරියගල්ල කියන ගම් තුනටම මෙච්චර කාලයක් වෙනකම් ක්‍රීඩා පිටියක් නැහැ. ඒ හින්දා ළමයි තැනින් තැන තමයි පොඩි පොඩි ක්‍රීඩා කටයුතු කරගෙන යන්නේ. මීට කාලෙකට ඉස්සෙල්ලා මම යෝජනාවක් ගෙනාවා පාදුක්ක සංවර්ධන කමිටුවට පාදුක්ක රජයේ රෝහල ඉස්සර තිබුණ ඉඩම තියෙනවා පාදුක්ක වත්ත මේ ගම් තුන මැද්දේ. අක්කර දෙකහමාරක තුනක පමණ කැලේ වැදිච්ච ඉඩමක්. අපි ඒ වෙලාවේ සංවර්ධන කමිටුවට යෝජනා කලා මේක හුවමාරු කරන්න ඒ වවලා තියෙන වත්තත් එක්ක. නමුත් ප්‍රාදේශීය ලේකම්තුමා එවකට විරුද්ධ වෙච්ච නිසා ඒ යෝජනාව එතනදී නැවතුනා. ඉතින් දැන් මට වගකීමක් තියෙනවා සහ ඒ ප්‍රදේශයේ තරුණ තරුණියෝ ඉල්ලනවා ක්‍රීඩා පිටියක් එතන ඒ ඉඩම අපි හදුනාගෙන තියෙන නිසා

ඒ ඉඩම රජයේ ඉඩමක්. මම මේකේ අයිතිය හොයලා බැලුවා සෞඛ්‍ය අමාත්‍යාංශයෙත් නැහැ ලියවිල්ලක්. ඊට පස්සේ මම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට ගියා. එහිදී ඒකෙත් මොනවත් රෙකෝඩ් වෙලා තිබුණේ නැති නිසා පාදුක්ක ප්‍රාදේශීය ලේකම්තුමාට මේ රජයේ ඉඩම අයිතියි කියලා මම විශ්වාස කරනවා. ඉතිං මේ ගරු සභාවේදි සභාවෙත් මැදිහත් වීම මම බලාපොරොත්තු වෙනවා මට මේක යෝජනාවක් විදියට කරන්න තිබුණනම් වටිනවා. නමුත් මම ප්‍රකාශයක් විදියට අද මේක කරන්නේ මට ප්‍රාදේශීය ලේකම්තුමාට මේ පිළිබඳව දැනුවත් කරලා මේකේ අයිතිය අපි කාටවත් අවශ්‍ය නැහැ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුවම මේ ඉඩමේ අයිතිය තියාගෙන අපිට සංවර්ධනය කර ගන්න ක්‍රිඩා පිටියක් විදියට අවසර ලබා දෙන්න කියන එක මම ඉල්ලීමක් විදියට මන්ත්‍රීවරයෙක් හැරියට ප්‍රකාශයක් විදියට කරනවා. ස්තුතියි.

__ගරු සභාපතිතුමා__

බොහොම ස්තුතියි. ගරු නිමල් යසසිරි කළුපහන මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් යසසිරි කළුපහන මැතිතුමා.__

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ යෝජනාව ගමේ තියෙන ජනතාවගේ ප්‍රධානම පීඩාව වෙනවා පාදුක්ක අරුක්වත්ත බෝපේ පාදුක්ක අංගම්පිටිය ගත්තත් මම මේක මහ සභාවට තමයි යෝජනා කළේ. නමුත් මට මේක දැන් යෝජනාවක් විදියට තමයි ලබා දෙන්න පුළුවන් වෙන්නේ. මේකේ කිසිම දේශපාලන අරමුණක් නැහැ. අපි සියලු දෙනාගේම ජනතාව පීඩාවට පත් වන කරුණක් තමයි කාරණා දෙකක් තියෙනවා මම එකක් විස්තර කරන්නම්. අරුක්වත්ත දකුණ ගනේගොඩ අරුක්වත්ත උතුර ග්‍රාම නිලධාරි වසම්වල පදිංචි ඉංගිරිය පාර පාදුක්ක ප්‍රධාන මාර්ගයට ආසන්න පුස්වැලි ඔය දෙපස පදිංචි පවුල් 150කට අධික ජනතාවට වසරකට දෙවරක් පමණ පුස්වැලිඔය පිටාර ගැලීම නිසා නිවාස දේපල ජලයෙන් යටවීම නිසා මහත් පීඩාවකට හා දේපල හානියකට මූල්‍යමය පසු බෑමකට ලක් වෙනවා. තවද මෙම අංක 23 අරුක්වත්ත බල ප්‍රදේශයට අයත් මෙම කොටසට අමතරව වේරගල, බෝපේ, අංගම්පිටිය, පාදුක්ක, ගලගෙදර යන ප්‍රදේශ මේ ව්‍යසනය නිසා පීඩාවට පත්වෙනවා දීර්ඝ කාලයක සිට සිදුවන මෙම අපදාව වලක්වා ගැනීම සඳහා කිසිදු ස්ථිර පියවරක් ගෙන නොමැත. මෙම තත්වය වලක්වා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් අප ප්‍රාදේශීය සභාවේ මැදිහත් වීම මත පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, ආපදා කළමනාකරණ ආයතනය, වාරි මාර්ග දෙපාර්තමේන්තුව ආදී රාජ්‍ය ආයතන මැදිහත් කරගෙන ගංවතුර පාලන වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැගීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මම සභාවට යෝජනා කරනවා. ඒ වගේම මතක් කරන්න ඕනේ 460 ග්‍රාම සේවා වසමේ පවුල් 95 ක් අවතැන් වෙනවා. ව්‍යාපාර 60 ක් විනාශ වෙනවා. රජයෙන් ගිය සැරේ ලක්ෂ 40 ක් මේකට ලබා දුන්නා. ඒ වගේම පවුල් 1500 ක් පමණ ජනතාවක් මේකෙන් පීඩාවට පත් වෙනවා. එමනිසා සභාවේ අපිට මේ සම්බන්ධව ගරු සභාවේ සහයෝගය අපිට ලබා ගන්න ඕනේ. ඒ වගේම තමයි ගලගෙදර වාඩිය ඒ කියන්නේ එතන තියෙනවා ඇල නිමාවට පත්වෙන කොටසක් තියෙනවා ගලගෙදර පාලම ළඟ එතන තමන්ගේ ඉඩම සකස් කර ගන්න තමන්ගේ ඉඩම සේදා පාලුවට ලක්වෙන කියලා ගල් දමා අවහිර කරලා තියෙන තැන් තියෙනවා. මම හිතනවා ප්‍රාදේශීය සභාවෙන් හොයලා බලලා සුදුසුනම් ලබා දෙන්න. නැත්තම් එයට නඩු දාලා හරි නාගරික සංවර්ධන අධිකාරියේ නීති අංශයට පැමිණිල්ලක් දාලා හරි ඒක නවත්වලා දෙන්න කියලා. අපි තමුන්නාන්සේගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මගේ දෙවෙනි යෝජනාව අරුක්වත්ත උතුර වත්ත කොටස අරලිය මාවත ග්‍රීන් ටෙරස් උදා ගම්මාන කොටස් ආදී පවුල් 300 පමණ පදිංචි ජනතාව සෑම වසරකම කිහිප අවස්ථාවකම ඇති ඉඩෝර කාල සීමාවන් වලදී උග්‍ර පානීය ජල ගැටළුවකට මුහුණ දෙන අතර දැනට ප්‍රජා ජල ව්‍යාපෘතියක් හා තවත් ඉඩම් වෙන්දේසි කොටසක් පානය කරන ජල ව්‍යාපෘතියක් පවතින අතර ඒවාද නිසි ක්‍රමවේදයකට අනුව සිදු නොවන අතර ජලය බෙදා හැරීමේ ගැටළුව, ජල පොම්පාගාරවල තියෙන යාන්ත්‍රික දෝෂ, සමිතිවල තියෙන පරිපාලන ගැටළු, ජල ලිංවල ගැටළුකාරී තත්වයන් පිළිබඳව සොයා බලා අදාල ආයතන මගින් හෝ ප්‍රාදේශීය සභාව මගින් මෙම ජල ගැටළුවට දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන තෙක් හෝ කඩිනම් විසඳුම් ලබා දීම ජනතාවගේ ජල ගැටළුවට පිළියමක් යොදන ලෙස මම ගරු

සභාවට යෝජනා කරනවා. ඒ වගේම පවුල් 300 ක් පමණ පීඩා විඳිනවා සතියකට දෙවරයි වතුර දෙන්නේ. එමනිසා මුලින්ම ඉඩම් අනුමත කිරීමේදී ලැබුණු දෝෂ තමයි අපිට මේ ලැබිලා තියෙන්නේ. එම නිසා මේ ගැන හොයලා බලලා අවශ්‍ය කටයුතු කරන්න කියලා මම මෙම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ඔබතුමා ඉදිරිපත් කරලා තියෙන මෙම යෝජනා දෙක අනුව ගරු මන්ත්‍රීතුමන්ලා 04 දෙනෙක් ප්‍රකාශ ඉදිරිපත් කළා. එම ප්‍රකාශයන් සම්බන්ධව ඉදිරිපත් වූ කාරණා අපි අදාල ආයතනවලට යොමු කරනවා ඒ සඳහා යම් සහනයක් ඔබතුමාලා බලාපොරොත්තු වන පිළිතුරක් ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒ අදාල තැනට යොමුකරනවා කියලා අපි මේ අවස්ථාවේ සඳහන් කරනවා ඒ වගේම ලබන 14 වෙනිදාට තිබෙන්නාවූ වැඩමුළුවට සියළුම දෙනා මම නැවතත් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා සියළුම දෙනා සහභාගී වන ලෙස ඒ සඳහා ප්‍රවාහන පහසුකම් සභාවෙන් සලසා දිලා තියෙනවා. එයටත් සහභාගී වෙලා මේ තියෙන්නාවූ ගැටළුකාරී තත්වයන් පිළිබඳව ඒ අදාල අයගෙන් කරුණු විමසා දැනගෙන සභාවේ කටයුතු වඩා හොඳින් කරගෙන යන්න හොඳ දැනුමක් ලබාගන්න පුළුවන්. හවස 4.00ට අපි සභාව ළඟ බස්රථය සූදානම් කරලා තියන්නම්. ඒ සඳහා සහභාගී වෙන්න කියන කාරණය මතක් කරනවා. එතකොට අපිට මේ සභාවේ තියෙන ගැටළු සහ දෝෂ සහගත තත්වයන් බොහෝදුරට සමනය කරගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. මේ සඳහා අදාල විෂය සම්බන්ධව දන්න උදවියගේ අදහස් ඔවුන් සමඟ කතා කරලා ඒවා විසඳාගන්න පුළුවන් වෙයි කියලත් අපි විශ්වාස කරනවා. ඒ අනුව අද දවසේ සභාවේ න්‍යාය පත්‍රයට අදාල කටයුතු අවසන් වෙනවා. ටෙන්ඩර් මණ්ඩලය රැස්වීම සඳහා ඒ අදාල මන්ත්‍රීවරුන් මදක් රැඳී සිටින්න.

**ඒ අනුව අද දින සභාවට සහභාගී වුණු ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාටත් ස්තූතියත් ගෞරවයත් මේ අවස්ථාවේ පුද කරනවා. ඒ වගේම ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයටත් අපේ ගෞරවයත් ස්තූතියත් පුදකරමින් අද දින සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. බොහොම ස්තූතියි.**

**සභාවේ වැඩ කටයුතු ප.ව. 4.00 ට නිමාවට පත්විය.**

කේ.ඒ. චන්දන පද්මසිරි,
ලේකම්,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

2018.05.11 වන දින
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.